වාර්ෂික වාර්තාව

2022



කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය

අංක 117, සුභද්‍රාරාම පාර, ගංගොඩවිල,
නුගේගොඩ

පටුන

ගරු සභාපතිතුමාගේ පණිවිඩය 3

ආයතනයේ දැක්ෂනය හා මෙහෙවර ප්‍රකාශය 5

අධ්‍යක්ෂ මණ්ඩලය 6

ආයතනික ව්‍යුහය 7

පෙරවදන 8

මෙහෙයුම් අංශය 11

රක්ෂණ අංශය 14

අභ්‍යන්තර විගණන අංශය 27

පරිපාලන හා මානව සම්පත් අංශය 30

සැලසුම් අංශය 37

මුදල් අංශය 43

පෙර වසර පහක මූල්‍ය තොරතුරු 45

2022 සමස්ථ යෝජනා ක්‍රම සඳහා ඒකාබද්ධ ගිණුම් ප්‍රකාශන සහ කෘෂි රක්ෂණ යෝජනා ක්‍රමය ...49

2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන ගොවි විශ්‍රාම වැවුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය 74

2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන ධීවර විශ්‍රාම වැවුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය 93

විගණකාධිපති වාර්තා 112

විගණකාධිපති වාර්තා සඳහා පිළිතුරු 143

ගරු සභාපතිතුමාගේ පණිවිඩය

2022 වර්ෂයේදී කෘෂිකර්ම හා ගොවිජන රක්ෂණ මණ්ඩලය විසින් 1999 අංක 20 දරණ කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ පනත මඟින් පවරා ඇති බලතල අනුව දේශීය කෘෂිකාර්මිකයාගේ අවදානම් කළමණාකරනය කරගැනීම වෙනුවෙන් හා 1987 අංක 12 දරන ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ පනත සහ 1990 අංක 23 දරන ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ පනත මඟින් ලබාදී ඇති ප්‍රතිපාදන අනුව ගොවි හා ධීවර ප්‍රජාවගේ ජීවිතයේ සැදෑ සමයේදී සමාජ ආරක්ෂණ පහසුකම් සැලසීමේ කටයුතු වෙනුවෙන් මණ්ඩලයේ දැක්ම, මෙහෙවර හා අරමුණු වලට අනුව වඩාත් ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම පිළිබඳව අවධානය යොමු කරන ලදී.

ඒ අනුව මණ්ඩලය විසින් ක්‍රියාත්මක කෘෂි රක්ෂණ, පශු රක්ෂණ, හදිසි අනතුරු හා තෙවන පාර්ශව රක්ෂණ යෝජනා ක්‍රම ජනගත කිරීමේ අවශ්‍යතාවයන් පිළිබඳව හඳුනාගෙන විවිධ ජංගම වැඩසටහන් පැවැත්වීමට කටයුතු කරමින් ගොවීන් වෙත වඩාත් සමීප හා ඵලදායී සේවයක් සපයන ආයතනයක් බවට පත්කිරීමට අවශ්‍ය කටයුතු සිදුකිරීම 2022 වර්ෂයේදී වැඩිදුරටත් ඵලදායී කරන ලදී.

කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ දැක්ම, මෙහෙවර හා පරමාර්ථ කරා ගමන් කිරීම මෙහෙයවීම ප්‍රධාන කාර්යාලයේ සියලු අංශ වල වගකීම වන අතර එම අරමුණු ඉටු කර ගැනීමට දිස්ත්‍රික්ක 25ක් පුරා පැතිරී පවතින දිස්ත්‍රික් කාර්යාල 30 හරහා සක්‍රීයව මෙහෙයුම් කටයුතු සිදු කරනු ලබයි.

කෘෂිකර්මාන්තයේ නියැලෙන ජනතාවගේ සැදෑ සමය ආර්ථික අපහසුතාවන්ගෙන් තොරව ගතකිරීම සඳහා වර්තමාන ආර්ථික තත්ත්වයන්ට ගැලපෙන ලෙස ගොවි මහතුන්ගේ ක්‍රය ශක්තිය අනුව දායක විය හැකි නව ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය හඳුන්වාදීමේ සාමාරම්භක උත්සවය කෘෂිකර්ම අමාත්‍ය ගරු මහින්ද අමරවීර මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් හෙක්ටර් කොඩ්බෑකඩුව ගොවි කටයුතු පුහුණු මධ්‍යස්ථානයේදී 2022.10.31 දින ආරම්භ කරන ලදී. 2022.12.31 දින වන මෙම යෝජනා ක්‍රමය යටතේ ගොවීන් 494 ක් දායක වී ඇති අතර ඔවුන් වාරික වශයෙන් ගෙවා ඇති මුදල රු. 6,741,309.56/- කි.

කෘෂිකාර්මික රක්ෂණ යෝජනා ක්‍රම ප්‍රවර්ධනය කිරීමේ ප්‍රමුඛතාවය පිළිබඳව සැලකිල්ලට ගෙන පවතින වගා රක්ෂණ යෝජනා ක්‍රම වර්තමාන වෙළඳපලට ගැලපෙන ලෙස යාවත්කාලීන කිරීම සඳහා අවශ්‍ය පියවර ගෙන ඇත.

1987 දී ක්‍රියාත්මක කරන ලද ගොවි විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය යටතේ 2022 වර්ෂය අවසාන වන විට විශ්‍රාම ලාභීන් 169,741 ක් වෙනුවෙන් රු.4,053,350,019/- ක මුදලක් විශ්‍රාම වැටුප් වශයෙන් ගෙවන ලදී. තවද, මණ්ඩලය විසින් 1996 අප්‍රේල් මස සිට ආරම්භ කරන ලද ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය යටතේ ධීවරයින් 5556 ක් සඳහා

රු.80,034,415/- ක් 2022 දෙසැම්බර් 31 දිනය වන විට ගෙවා ඔවුන්ට සුවපත් විශ්‍රාම දිවියක් ගත කිරීම සඳහා දායක වී ඇති බව දනවන්නේ සතුටිනි.

මීට අමතරව මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරන තෙවන පාර්ශවීය රක්ෂණ යෝජනා ක්‍රමය ඇතුළු අනෙකුත් රක්ෂණ යෝජනා ක්‍රමයන්ගෙන් පෙර වර්ෂයට සාපේක්ෂව 10% ක වර්ධනයක් පෙන්නුම් කරන ලදී. ඒ අනුව මණ්ඩලය වැටුප් හා දීමනා, පරිපාලන වියදම් ආදී කටයුතු සිදුකරමින් ස්වයං මූල්‍ය පදනමක් යටතේ පවත්වාගෙන යාමට කටයුතු කර ඇත.

කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය විසින් 2022 වර්ෂයේදී කෘෂි රක්ෂණ යෝජනා ක්‍රම මඟින් රු.මි. 2,319 ක ශුද්ධ ලාභයක් උපයාගෙන ඇති අතර, මෙම වර්ෂයේ උපයාගෙන ඇති මෙහෙයුම් ලාභය රු.මි. 2,663.1 කි. විපතට පත් ගොවිජනතාව වෙනුවෙන් කඩිනමින් වන්දි මුදල් ගෙවීම මණ්ඩලයේ ප්‍රමුඛතම කාර්යභාරය වන අතර, 2022 වර්ෂයේදී ද දිවයිනේ කෘෂිකාර්මික දිස්ත්‍රික්ක ගණනාවක අධික වර්ෂාව, ගංවතුර හේතුවෙන් විපතට පත් ගොවිජනතාව වෙනුවෙන් මණ්ඩලයේ අනිවාර්යය වගා රක්ෂණ වන්දි වගකීම රු.මි. 698.6/- ක් පමණ වී ඇත. 2022 වර්ෂය තුල අනිවාර්යය වගා රක්ෂණ ක්‍රමය තුලින් රු.මි. 56.1/-ආදායමක් තෙවන පාර්ශවීය රක්ෂණ යෝජනා ක්‍රම තුලින් රු.මි 311/- ක ආදායමක් ද අනෙකුත් රක්ෂණ ක්‍රම තුළින් රු.මි. 23.2 ක ආදායමක්ද උපයා ගැනීමට මණ්ඩලයට හැකිවිය.

පවතින අඩුපාඩු හඳුනාගෙන ඒවා නිවැරදි කරගනිමින් කෘෂිකාර්මිකයින්ගේ සහ ධීවර ප්‍රජාවගේ ජීවන මට්ටම ඉහල දැමීම වෙනුවෙන් වර්තමාන ආර්ථික උද්දමනයට ගැලපෙන ලෙස ඔවුන්ගේ අවශ්‍යතාවයන් පිළිබඳව වැඩිදුරටත් සැළකිලිමත්වීම තුලින් මණ්ඩලීය අරමුණු කරා විවිධ දුෂ්කරතාවයන් මධ්‍යයේ ලභාවූ වසරක් ලෙස 2022 වසර හැඳින්විය හැකිය.

සභාපති,
කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය

කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය

ආයතනයේ දැර්ශනය හා මෙහෙවර ප්‍රකාශය

➢ දැක්ම ..

දේශීය කෘෂිකර්මාන්තයේ අග්‍රගන්‍ය රැකවලා වීම තුළින් දකුණු ආසියාවේ පරමාදර්ශී කෘෂි රක්ෂණ ආයතනය වීම.

➢ මෙහෙවර ..

කෘෂිකාර්මික රක්ෂණය සහ ආරක්ෂණය සැලසීම සඳහා සාමූහික ප්‍රයත්නයන් හා අදාල ආයතන සම්බන්ධීකරණය තුළින් ජාත්‍යන්තරව පිළිගත හැකි විශිෂ්ඨ සේවාවක් සැපයීම.

අධ්‍යක්ෂ මණ්ඩලය - 2022

	නම	තනතුර
01	නීතිඥ ප්‍රේමවන්ද ඇපා මහතා හෂාන් දිසානායක මහතා ආචාර්ය ඩබ්ලිව්.එම්.එම්.බී.වීරසේකර මහතා සභාපති කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය	සභාපති
02	ආචාර්ය අජන්ත ද සිල්වා මහතා අධ්‍යක්ෂ ජනරාල් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව	සාමාජික
03	ආර්.එම්.ඩී.කේ.ජී.එන්.ඩී.රණතුංග මයා අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (වැ.බ) භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව	සාමාජික
04	වෛද්‍ය සී.එන්.එස්.ගමගේ මයා අධ්‍යක්ෂ (පශු සම්පත් සැලසුම්) පශු සම්පත් ගොවිපල ප්‍රවර්ධන සහ කිරි හා බිත්තර ආශ්‍රිත කර්මාන්ත රාජ්‍ය අමාත්‍යාංශය.	සාමාජික
05	ඒ.එච්.එම්.එල්. අබේරත්න මහතා කොමසාරිස් ජනරාල් ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව	සාමාජික
06	ආර්.ඒ.ඩී.එස්. රණතුංග මහතා අධ්‍යක්ෂ ජනරාල් (තාක්ෂණික) ධීවර අමාත්‍යාංශය නව ලේකම් කාර්යාලය මාලිගාවත්ත, කොළඹ 10	සාමාජික
07	ජී.ජී. ධනංජය නන්දසිරි මහතා සහකාර උප සභාපති / ශාඛා කළමණාකරු DFCC බැංකුව මාතර	සාමාජික
08	නිලක්ෂි එන්. ගුණසේකර මිය අතිරේක ලේකම් (පාලන සහ මානව සම්පත්) කෘෂිකර්ම අමාත්‍යාංශය	සාමාජික
09	එස්.එම්.ජී.සමරකෝන් මහතා 120, හුරුල්මීගහපිටිය, මීගොඩවැව, අනුරාධපුර	සාමාජික

ආයතනික ව්‍යුහය

කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය



පෙරවදන

කෘෂිකර්මාන්තයේ තිරසර සංවර්ධනය උදෙසා ක්‍රියාත්මක වන්නාවූ ජාතික වැඩපිළිවෙලේදී කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය දැවැන්ත කාර්යභාරයක් ඉටු කරනු ලබයි. කෘෂිකර්ම අමාත්‍යාංශයට අයත් පාලිත ආයතනයක් වශයෙන් හිමි මූල්‍ය ස්ථාවරත්වයෙන් හා අවදානම් කළමනාකරණයට සෘජුවම සම්බන්ධවන කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ රක්ෂණ සේවා සැපයීම වෙනුවෙන්ම වූ දිවයිනේ එකම රාජ්‍ය ආයතනය වශයෙන්, හදිසි ආපදා තත්ත්වයන් හමුවේ කෘෂිකර්මාන්තය හා කෘෂිකාර්මිකයා සුරක්ෂිත කිරීමෙහිලා රජය වෙත පැවරී ඇති වගකීම ඉටුකරලීම මෙම මණ්ඩලයේ ප්‍රමුඛතම කාර්යය භාරයවී ඇත.

ඒ අනුව, දේශීය කෘෂිකර්මාන්තය නංවාලීමේ හා කෘෂිකාර්මිකයාගේ ආර්ථිකය ස්ථායී කිරීමෙහිලා කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය වෙත පැවරී ඇති වගකීම උපරිම ආකාරයෙන් ඉටුකරලීම අරමුණුකර ගනිමින් පහත සඳහන් ප්‍රධාන අංශ යටතේ රක්ෂණ හා සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රම රාශියක් මෙම මණ්ඩලය විසින් දීප ව්‍යාප්තව ක්‍රියාත්මක කරනු ලබයි.

- සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රම
- වගා රක්ෂණ යෝජනා ක්‍රම
- පශු සම්පත් රක්ෂණ යෝජනා ක්‍රම
- සාමාන්‍ය රක්ෂණ යෝජනා ක්‍රම
- රථවාහන, උපකරණ හා ගබඩා රක්ෂණ යෝජනා ක්‍රම

ඉහත අංශ යටතේ ක්‍රියාත්මක වන යෝජනා ක්‍රම වලට අමතරව ශ්‍රී ලාංකික ගොවි ජනතාවගේ අවශ්‍යතා වෙනුවෙන් කෙරෙන ඉල්ලීම් අනුව කෘෂිකර්ම ක්ෂේත්‍රයට සම්බන්ධ කෘෂිකාර්මික කටයුතු ආවරණය වන පරිදි රක්ෂණ යෝජනා ක්‍රම සැළසුම්කර ක්‍රියාත්මක කිරීමට කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය විසින් කටයුතු කරනු ලැබේ.

වාර්ෂික වාරික ආදායම 2018 සිට 2022 දක්වා

රක්ෂණ ක්‍රමය	**2018 (රු.මිලි.)**	**2019 (රු.මිලි.)**	**2020 (රු.මිලි.)**	**2021 (රු.මිලි.)**	**2022 (රු.මිලි.)**
වගා රක්ෂණ යෝජනා ක්‍රම	128.01	61.11	45.89	74.24	**55.69**
පශු සම්පත් රක්ෂණ යෝජනා ක්‍රමය	10.59	7.87	5.78	11.07	**5.25**
ගබඩා/ කෘෂි උපකරණ හා තෙවන පාර්ශවීය රක්ෂණ යෝජනා ක්‍රම	137.85	220.15	278.94	296.50	**311.04**
සුවසෙත හා හදිසි අනතුරු රක්ෂණ යෝජනා ක්‍රම	6.34	9.42	13.78	9.04	**18.6**
එකතුව	282.79	298.55	344.39	390.85	**390.5**

වාර්ෂික ශුද්ධ ලාභය 2018 සිට 2022 දක්වා

(කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය - සමූහය)

	2018 (රු.මිලි.)	**2019 (රු.මිලි.)**	**2020 (රු.මිලි.)**	**2021 (රු.මිලි.)**	**2022 (රු.මිලි.)**
මුළු ආදායම	4,614.3	3,603.9	3,724.6	3,655.2	3,719.8
මෙහෙයුම් වියදම	(6.434.5)	(5,825.4)	(6,800.2)	(5,550.4)	(4,819.2)
මෙහෙයුම් අතිරික්තය	(1,820.1)	(2,221.4)	(3,075.6)	(1,895.2)	(1099.3)
රාජ්‍ය ප්‍රදාන හා අනෙකුත් අදායම්	2,238	2,842.5	4,661	4,011.1	4,167.8
මුළු වියදම් (වෙන් කිරීම්ද ඇතුළුව)	(353.13)	(367.03)	(352.70)	(336.19)	**(417.63)**
වාර්ෂික ශුද්ධ ලාභය/ අලාභය	(2,969)	(3,505.3)	(3,083.7)	(2,700.8)	(2,119.4)

වාර්ෂික ශුද්ධ ලාභය 2018 සිට 2022 දක්වා (කෘෂිරක්ෂණ යෝජනා ක්‍රමය)

	2018 (රු.මිලි.)	**2019 (රු.මිලි.)**	**2020 (රු.මිලි.)**	**2021 (රු.මිලි.)**	**2022 (රු.මිලි.)**
මුළු ආදායම	4,398.5	3,365.1	3,530.40	3,456.90	**3,432.32**
මෙහෙයුම් වියදම	(3,253.8)	(2,487.0)	(2,129.10)	(1,704.90)	**(769.18)**
මෙහෙයුම් අතිරික්තය	1,144.7	878.1	1,401.30	1,752.00	**2,663.13**
රාජ්‍ය ප්‍රදාන හා අනෙකුත් අදායම්	4.0	9.1	8.30	8.16	**6.74**
මුළු වියදම් (වෙන් කිරීම්ද ඇතුළුව)	(169.73)	(185.01)	(179.76)	(184.28)	**(229.20)**
වාර්ෂික ශුද්ධ ලාභය/ අලාභය	921.0	652.3	1,153.70	1,494.36	**2,319.01**

කෘෂිකාර්මිකයාගේ මෙන්ම කෘෂිකර්මාන්තයේ තිරසර ප්‍රවර්ධනය උදෙසා රටේ ආහාර නිෂ්පාදන ක්‍රියාවලිය වඩාත් ස්ථාවර සහ වේගවත් කිරීමේ අරමුණින් කෘෂිකර්ම අමාත්‍යාංශය මූලික කරගනිමින් රජය විසින් කෘෂිකාර්මිකයින් උදෙසා ක්‍රියාත්මක කරන ලද පොහොර සහනාධාරය වැනි ගොවීන් සඳහා දිරි දීමනා සහ පහසුකම් ලබා දීමේ වැඩසටහන් යටතේ රට පුරා බහුලව වගා කරන ප්‍රධාන භෝග වර්ග 06 ක් සඳහා 2018 යල කන්නයේදී ආරම්භ කරන ලද නොමිලයේ ලබාදුන් අනිවාර්ය රක්ෂණ යෝජනා ක්‍රමය 2022 වසරද ප්‍රායෝගිකව ක්‍රියාකාරීත්වයට ලක්වූ වසරක් ලෙස සැලකිය හැකිවේ

2022 වර්ෂය තුළදී මණ්ඩලයේ ආදායමේ කැපී පෙනෙන ප්‍රගතියක් අත්පත් කර ගැනීමට තෙවන පාර්ශවීය රථවාහන රක්ෂණ ක්‍රමය සමත්විය. 2021 වර්ෂයේ රුපියල් මිලියන 296.50 වූ ආදායම 2022 වර්ෂය අවසානයේදී රුපියල් මිලියන 311.04 දක්වා වර්ධනය කර ගැනීම මෙම වර්ෂයේ විශේෂ විය. තෙවන පාර්ශවීය රථවාහන රක්ෂණ ක්‍රමයේ නීතිමය බාධාවන් නිරාකරණය කර ගැනීම සහ දිස්ත්‍රික්

මට්ටමින් පුළුල් අලෙවි සහ ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම තුළ අදාල යෝජනා ක්‍රමය සම්බන්ධ විශ්වාසය කෘෂිකාර්මිකයින් තුළ ඇති කිරීමේ ප්‍රතිඵලයක් ලෙස මෙම ප්‍රගතිය අත්පත් කරගත හැකිවිය. මේ මඟින් උපයාගත් ආදායම මණ්ඩලයේ මූල්‍ය ස්ථාවරත්වය වර්ධනය කර ගැනීම සඳහා බෙහෙවින් ඉවහල් විය. තවද, තෙවන පාර්ශව රථ වාහන රක්ෂණ යෝජනා ක්‍රමය නවීකරණය කර ජීවිත රක්ෂණ යෝජනා ක්‍රමයක් එයට එකතු කිරීම තුලින් ලබාදෙන ආවරණ මට්ටම් වැඩි කිරීම සඳහා අවශ්‍ය මූලික පියවර ගැනීමට මෙම වසරේ හැකිවිය.

2022 වර්ෂය තුලදී රක්ෂණ අංශය මඟින් 2020/2021 මහ කන්නය 2021 යල කන්නය, 2021/2022 මහ කන්නය සඳහා වගා හානි ලෙස නිර්දේශිත ඉදිරිපත් කර තිබූ ලේඛන සඳහා වන්දි මුදල් රු. මිලියන 1,578 ගොවීන් 67,559 දෙනෙකු වෙත නිදහස් කිරීමට කටයුතු කරන ලදී.

කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය මඟින් ක්‍රියාත්මක කරන ප්‍රධානතම සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය වන ගොවි විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය යටතේ 2022 වර්ෂය අවසානයේ විශ්‍රාමිකයින් 169,300 දෙනෙකු සඳහා ප්‍රතිලාභ සපයන ලදි. එසේම 2022 වර්ෂය තුලදී නව ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය ආරම්භ කිරීම මඟින් ගොවි ජනතාවට විශාල සහනයන් ලබා දීමට අවකාශ සලසන ලදී.

මෙයට අමතරව ධීවර ප්‍රජාවගේ යහපත උදෙසා ක්‍රියාත්මක වන ධීවර විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රමය යටතේ 2022 වර්ෂය අවසානයේදී ධීවරයින් 5,354 දෙනෙකු සඳහා මාසිකව විශ්‍රාම වැටුප් ගෙවීම සිදුකර තිබුණි.

ජාතික කෘෂිකාර්මික, පශු සම්පත් නිෂ්පාදන ක්‍රියාවලියේදී පුළුල් දායකත්වයක් ලබා දෙමින් අවදානම් අවම කිරීම සඳහා වන ශක්තිය කෘෂිකාර්මියා ප්‍රමුඛ ජාතික කෘෂිකාර්මික නිෂ්පාදන ක්‍රියාවලියට ලබා දෙමින්, රටේ සමස්ත ආර්ථික නිෂ්පාදන ක්‍රියාවලියේ ප්‍රමුඛ කාර්යය කොටසක් ඉටුකරනු ලබන ආයතනයක් ලෙස කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය සිය වගකීම 2022 වර්ෂය තුළදී ද ඉටුකරන ලදී.

මෙහෙයුම් අංශය

මෙහෙයුම් අංශය - 2022

අවදානම් කළමනාකරණ ක්‍රමවේදයක් වශයෙන් දේශීය කෘෂිකාර්මික ක්ෂේත්‍රයට කෘෂිකාර්මික රක්ෂණය හඳුන්වාදී දේශීය කෘෂි නිෂ්පාදනය ඉහළ නැංවීම හා කෘෂිකාර්මිකයා සුරක්ෂිත කිරීම මුඛ්‍ය කර්තව්‍යය කරගනිමින් කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය ක්‍රියාත්මක වේ. නියඟය, ගංවතුර, වන අලි හානි ඇතුළු ස්වභාවික ආපදා තත්ත්වයන් තුළදී ගොවීන් මුහුණ දෙන ආර්ථික ගැටළුවලට මනා විසඳුමක් ලෙස කෘෂි රක්ෂණ ක්‍රමවේදය වැදගත් වේ. එමෙන්ම, කෘෂි ආර්ථික රටාවක් තුළින් දේශීය ආර්ථිකය ශක්තිමත් කිරීමේදී කෘෂිකාර්මික අවදානම් කළමනාකරණය වඩාත් ප්‍රායෝගික අයුරින් යොදා ගැනීම දේශීය කෘෂි ආර්ථික හා ජීවන රටාව ස්ථායී මට්ටමක පවත්වාගෙන යාමට මහඟු පිටිවහලක් වී ඇත. විශේෂයෙන් ගොවීන්ට වඩාත් සමීප වගා රක්ෂණ යෝජනා ක්‍රමය, පශු රක්ෂණ යෝජනා ක්‍රමය, සුවසෙත හා හදිසි අනතුරු රක්ෂණය, කෘෂි උපකරණ රක්ෂණය, ගබඩා රක්ෂණය හා තෙවන පාර්ශවීය රථවාහන රක්ෂණය වැනි වැඩි ප්‍රතිලාභ සහිත රක්ෂණ යෝජනා ක්‍රම රාශියක් ගොවි ජනතාව වෙනුවෙන් මණ්ඩලය යටතේ ක්‍රියාත්මක වේ.

කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ සේවාවන් ගොවි ජනතාව අතර ව්‍යාප්ත කිරීමේදී වඩාත් වැදගත් කාර්ය භාරයක් ඉටු කිරීමට මෙහෙයුම් අංශයට පැවරී ඇත. මණ්ඩලය මඟින් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරනු ලබන ඉදිරි වැඩපිළිවෙල ඇතුළත් සංයුක්ත සැලැස්මට අනුකූලව සියළුම ආයතනික සැලසුම් සකස් කිරීම, එම සැලසුම් ක්‍රියාත්මක කරවීම සඳහා දීප ව්‍යාප්තව පැතිරී ඇති දිස්ත්‍රික් කාර්යාල මෙහෙයවීම, ඒ සඳහා වූ මානව හා භෞතික අවශ්‍යතා පූරණය කිරීම ඇතුළු සුවිශේෂී වූ කාර්ය භාරයක් මෙහෙයුම් අංශය මඟින් ඉටු කරනු ලබයි.

- කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ රක්ෂණ සේවා සපයන ප්‍රධාන රාජ්‍ය ආයතනය වශයෙන් දේශීය කෘෂිකර්මාන්තය නංවාලීමේ හා කෘෂිකාර්මිකයාගේ ආර්ථිකය ස්ථායී කිරීමෙහිලා කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය වෙත පැවරී ඇති වගකීම උපරිම ආකාරයෙන් ඉටුකිරීම අරමුණු කරගනිමින්, 2022 වර්ෂයේදීද රක්ෂණ යෝජනා ක්‍රම රාශියක් දීප ව්‍යාප්තව ක්‍රියාත්මක කිරීමට මෙහෙයුම් අංශය කටයුතු කර ඇත.

    1. වගා රක්ෂණ යෝජනා ක්‍රමය
        - වී වගා රක්ෂණ යෝජනා ක්‍රමය
        - බඩ ඉරිඟු වගා රක්ෂණ යෝජනා ක්‍රමය
        - ලොකු එෑණු වගා රක්ෂණ යෝජනා ක්‍රමය
        - අර්තාපල් වගා රක්ෂණ යෝජනා ක්‍රමය
        - මිරිස් වගා රක්ෂණ යෝජනා ක්‍රමය
        - සෝයා වගා රක්ෂණ යෝජනා ක්‍රමය
        - අතිරේක බෝග වගා රක්ෂණ යෝජනා ක්‍රමය (තල, කුරක්කන්, කොල්ලු, මුංඇට, කව්පි, උඳු)
        - උක් වගා රක්ෂණ යෝජනා ක්‍රමය
        - අපනයන බෝග වගා රක්ෂණ යෝජනා ක්‍රමය (ගම්මිරිස්, කුරුඳු)
        - වැවිලි බෝග වගා රක්ෂණ යෝජනා ක්‍රමය (තේ වගාව)
        - පොල් වගා රක්ෂණ යෝජනා ක්‍රමය
        - මල් වගා රක්ෂණ යෝජනා ක්‍රමය
        - ඉහුරු වගා රක්ෂණ යෝජනා ක්‍රමය
        - එළවළු වගා රක්ෂණ යෝජනා ක්‍රමය
        - කෙසෙල් වගා රක්ෂණ යෝජනා ක්‍රමය
        - පළතුරු වගා රක්ෂණ යෝජනා ක්‍රමය
    2. ගබඩා රක්ෂණ යෝජනා ක්‍රමය
    3. කෘෂි උපකරණ රක්ෂණ යෝජනා ක්‍රමය
    4. පශු රක්ෂණ යෝජනා ක්‍රමය
        - ගව
        - එළු
    5. හදිසි අනතුරු රක්ෂණ යෝජනා ක්‍රමය
    6. සුවසෙත සෞඛ්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය
    7. තෙවන පාර්ශවීය රථවාහන රක්ෂණ යෝජනා ක්‍රමය

8. සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රම
    - ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය
    - ධීවර විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය

නියඟය, ගංවතුර හා වන අලින්ගෙන් සිදුවන ආපදාවලින් වගා කටයුතුවලට ඇති වියහැකි හානි නිසා ගොවි ප්‍රජාවට මුහුණ දීමට සිදුවන දුෂ්කරතාවලට පිළියමක් වශයෙන් වී, බඩ ඉරිඟු, අර්තාපල්, ලොකුළූණු, සෝයා හා මිරිස් වගාවන් සඳහා ගොවීන්ගේ සහ රජයේ දායකත්වය සහිත අනිවාර්ය රක්ෂණ යෝජනා ක්‍රමයකට ගොවීන් දායක කරගැනීම සිදුවූ අතර, 2018යල කන්නයේ සිට ගොවීන්ගෙන් වාරික මුදල් අය කිරීමෙන් තොරව රජයේ ප්‍රතිපත්තිමය තීරණ මත අක්කරයක් සඳහා උපරිමය රු.40,000/-ට යටත්ව රක්ෂණ ආවරණයක් ලබා දීමට රජය විසින් කටයුතු කරන ලදී. කෘෂිකර්ම අමාත්‍යාංශය, ගොවිජන සේවා දෙපාර්තමේන්තුව, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, මහවැලි සංවර්ධන අධිකාරිය, රාජ්‍ය හා රාජ්‍ය නොවන බැංකු ඇතුළු අදාල සියළු ආයතන සම්බන්ධීකරණයෙන් මෙම රක්ෂණ යෝජනා ක්‍රමය 2018 යල කන්නයේ සිට මණ්ඩලය විසින් දීප ව්‍යාප්තව ක්‍රියාත්මක කරනු ලැබේ.

මෙහෙයුම් අංශය මඟින් ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් :

- කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ සියළුම කාර්යාල එකම ආකෘතියක් යටතට ගැනීමේ මූලික අරමුණ ඇතිව ගම්පහ සහ කෑගල්ල දිස්ත්‍රික් සහකාර අධ්‍යක්ෂවරුන් දැනුවත් කිරීම සහ ක්ෂේත්‍ර අධීක්ෂණය.
- ගම්පහ දිස්ත්‍රික් ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව සමඟ පවත්වන ලද දේශීය කෘෂිකර්මාන්තය නඟා සිටුවීම සඳහා ගොවි ජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන 2022.04.10 සහ 11 දෙදින පවත්වන ලද ප්‍රදර්ශනය සඳහා මණ්ඩලයේ සියළු රක්ෂණ යෝජනා ක්‍රම ඇතුළත් කොට ප්‍රදර්ශන කුටියක් සංවිධානය කිරීම හා ඒ සඳහා අනුග්‍රහය දැක්වීම හා නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් ගොවිජනතාව දැනුවත් කිරීම.
- 2022 වර්ෂයේ අලුත් සහල් මංගල්‍යය අතිගරු ජනාධිපතිතුමන්ගේ ප්‍රධානත්වයෙන් 2022.04.02 සහ 03 දිනයන්හි අනුරාධපුර ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේ අභියස පවත්වන ලද මහෝත්සවය සඳහා අනුග්‍රාහකත්වය දැක්වීම හා ක්‍රියාකාරකම් සිදු කිරීම.
- මහව, කෑගල්ල, රත්නපුර, පොළොන්නරුව, ගාල්ල, බදුල්ල, නුවරඑළිය, මුලතිව්, මොණරාගල යන දිස්ත්‍රික්කයන්හි අලෙවි ප්‍රවර්ධන කටයුතු යාවත්කාලීන කිරීම සඳහා බැනර් හා අත් පත්‍රිකා දිස්ත්‍රික් අවශ්‍යතාවයන් අනුව මුද්‍රණය කර ගැනීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන හා මුද්‍රණ ආකෘතීන් සපයාදීම හා උපදෙස් ලබා දීම.
- ආයතනයේ පවතින රක්ෂණ යෝජනා ක්‍රම පිළිබඳ දැනුවත් කිරීම සඳහා ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව මඟින් ප්‍රචාරණ කටයුතු සිදු කිරීම.
- කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය සඳහා ආයතනයේ අභිමානය විදහා දැක්වීම සඳහා තේමා ගීතයක් නිර්මාණය කිරීම-2022.10.18 දින සිදු කරන ලදී.
- ගොවි ජනතාව වෙතට නව ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයක් අනුමතව තිබුණ බැවින්, එම යෝජනා ක්‍රමයට අදාලව 2022.10.30 දින සමාරම්භක උලෙළක් පැවැත්වීම හා ගොවි මහතුන් එම යෝජනා ක්‍රමය සඳහා දායක කර ගැනීම හා ඔවුන්ට සහතික පත්‍ර ලබා දීම.
- ගම්පහ දිස්ත්‍රික්කයේ ගොවි නියෝජිතයින්, රාජ්‍ය නිලධාරීන් හා කෘෂිකාර්මික නිෂ්පාදන පර්යේෂණ සහකාර නිලධාරීන් දැනුවත් කිරීම සඳහා 2022.11.23 හා 2022.12.16 යන දිනයන්හි ප්‍රාදේශීය ලේකම් කාර්යාල සමඟ සම්බන්ධ වී වැඩසටහනක් පැවැත්වීම.

රක්ෂණ අංශය

කෘෂිකාර්මික රක්ෂණ යෝජනා ක්‍රමය

හා

පශු සම්පත් රක්ෂණ යෝජනා ක්‍රමය

<u>රක්ෂණ අංශය</u>

කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ රක්ෂණ අංශය මඟින් සිදු කෙරෙන ප්‍රධාන කාර්යය වනුයේ රක්ෂණ යෝජනා ක්‍රම සකස් කිරීම, ඒවා පිලිබඳව දැනුවත් කිරීම මෙන්ම ක්‍රියාත්මක රක්ෂණ යෝජනා ක්‍රම යටතේ පැන නගින හිමිකම් සඳහා වන්දි මුදල් නිදහස් කිරීමට අදාළ රාජකාරි සිදු කිරීම වේ. ඒ අනුව අංශයේ රාජකාරීන් පහත සඳහන් අයුරින් සිදු කරන ලදී. එනම්, පෙර වර්ෂ වලදී මෙන්ම වගා හානි සඳහා වන්දි මුදල් නිදහස් කිරීමේ කාර්යයට මුල් තැන දී රාජකාරි කිරීමට කටයුතු කරන ලදී.

එසේම 2022 වර්ෂය තුලදී අනිවාර්ය භෝග වගා 06 සඳහා පැවති රක්ෂණ යෝජනා ක්‍රමය යාවත්කාලීන කරන ලදී. තවද රටකජු වගාව, තුඹ කරවිල වගාව, බීජ බෝංචි වගාව, කහ වගාව ආදි රක්ෂණ යෝජනා ක්‍රම යාවත්කාලීන කිරීමට කටයුතු කරන ලදී. වගා ණය යටතේ උක් වගාව සඳහා රක්ෂණ යෝජනා ක්‍රමය සකස් කරන ලදී.

එයට අමතරව අංශ සමඟ සම්බන්ධ වී වැඩසටහන් ක්‍රියාත්මක කිරීමත් විගණන කටයුතු සඳහා අදාල පිළිතුරු සපයමින් ලැබෙන උපදෙස් පරිදි ක්‍රමවේදයන් සකස් කර ගැනීමට කටයුතු කිරීමත් මූලිකවම සිදු කරන ලදී.

එසේම ආයතනයේ පවතින සෙසු අංශ සමඟ ඒකාබද්ධව කටයුතු කිරීමත් දිස්ත්‍රික් කාර්යාල සඳහා අවශ්‍ය උපදෙස් ලබාදෙමින් රක්ෂණ කටයුතු මෙහෙයවීමත් රක්ෂණ අංශය මඟින් සිදු කරන ලදී.

2022 වර්ෂය තුලදී රක්ෂණ අංශය මඟින් 2018/19 මහ කන්නය, 2019 යල කන්නය, 2019/20 මහ කන්නය, 2020 යල කන්නය මෙන්ම 2021 මහ කන්නයේ වගා හානි ලෙස දිස්ත්‍රික්ක මගින් නිර්දේශිතව ඉදිරිපත් කර තිබූ ලේඛන සඳහා වන්දි මුදල් නිදහස් කිරීමට කටයුතු කරන ලදී. ඒ අනුව පහත සඳහන් කන්නයන් සඳහා වැඩි අවදානයක් සහිතව වන්දි ප්‍රමාණයක් නිදහස් කිරීමට කටයුතු කරන ලදී.

2022 වර්ෂය තුළ 2018/19 මහ කන්නය සඳහා ගෙවා ඇති වන්දි මුදල

දිස්ත්‍රික්කය	ගොවීන් ගණන	අක්කර ගණන	වන්දි මුදල (රු.)
මඩකළපුව	12	48.75	504,000.00
මොණරාගල	141	441.47	7,132,492.00
	1	1.25	25,000.00
එකතුව	**154**	**491.47**	**7,661,492.00**

2022 වර්ෂය තුළ 2019 යල කන්නය සඳහා ගෙවා ඇති වන්දි මුදල

දිස්ත්‍රික්කය	ගොවීන් ගණන	අක්කර ගණන	වන්දි මුදල (රු.)
බදුල්ල	2	2.00	35,700.00
එකතුව	**2**	**2.00**	**35,700.00**

2022 වර්ෂය තුළ 2019/20 මහ කන්නය සඳහා ගෙවා ඇති වන්දි මුදල

දිස්ත්‍රික්කය	ගොවීන් ගණන	අක්කර ගණන	වන්දි මුදල (රු.)
අනුරාධපුරය	11	16.75	318,400.00
බදුල්ල	5	6.50	145,800.00
මොණරාගල	34	53.63	960,850.00
එකතුව	**50**	**77**	**1,425,050.00**

2022 වර්ෂය තුළ 2020 යල කන්නය සඳහා ගෙවා ඇති වන්දි මුදල			
දිස්ත්‍රික්කය	**ගොවීන් ගණන**	**අක්කර ගණන**	**වන්දි මුදල (රු.)**
ගම්පහ	256	221.56	5,432,818.00
කළුතර	3	1.38	14,625.00
මහනුවර	3	0.80	17,100.00
මාතලේ	5	3.25	66,600.00
මාතර	31	26.72	876,141.00
ත්‍රිකුණාමලය	20	41.00	436,500.00
කුරුණෑගල	17	12.75	429,300.00
මහව	8	8.00	216,000.00
පුත්තලම	16	28.18	824,625.00
මනම්පිටිය	1	1.50	13,500.00
බදුල්ල	3	2.69	64,175.00
මොණරාගල	11	15.25	357,100.00
රත්නපුර	2	1.50	32,400.00
කෑගල්ල	21	10.79	181,623.00
එකතුව	**397**	**375.37**	**8,962,507.00**

2022 වර්ෂය තුළ 2020/21 මහ කන්නය සඳහා ගෙවා ඇති වන්දි මුදල			
දිස්ත්‍රික්කය	**ගොවීන් ගණන**	**අක්කර ගණන**	**වන්දි මුදල (රු.)**
ගම්පහ	9	17.52	245,724.00
කළුතර	20	18.75	214,200.00
මාතලේ	1	0.25	2,700.00
මාතර	4	2.00	27,360.00
හම්බන්තොට	6	9.25	200,700.00
යාපනය	235	294.20	3,317,469.00
මන්නාරම	5	16.00	230,400.00
වවුනියාව	3	8.00	201,600.00
අම්පාර	3,380	5,672.46	101,572,398.00
ත්‍රිකුණාමලය	6,432	10,018.88	171,961,185.00
කිලිනොච්චිය	27	92.50	1,379,700.00
කුරුණෑගල	2	5.50	36,000.00
මහව	6	8.75	147,200.00
පුත්තලම	1	1.50	54,000.00
අනුරාධපුරය	299	675.92	7,482,621.00
පොළොන්නරුව	14	27.00	464,400.00
මනම්පිටිය	1	1.00	36,000.00
බදුල්ල	1,646	2,339.27	30,326,091.00
මොණරාගල	156	443.00	5,594,925.00
කෑගල්ල	2	1.25	31,500.00
එකතුව	**12,249**	**19,653.00**	**323,526,173.00**

2022 වර්ෂය තුළ 2021 යල කන්නය සඳහා ගෙවා ඇති වන්දි මුදල			
දිස්ත්‍රික්කය	**ගොවීන් ගණන**	**අක්කර ගණන**	**වන්දි මුදල (රු.)**
කොළඹ	145	153.06	2,256,862.00
ගම්පහ	4,078	3,909.39	61,635,605.00
කළුතර	908	809.43	10,155,462.00
මහනුවර	290	158.00	3,512,130.00
මාතලේ	106	85.61	1,359,998.00
නුවරඑළිය	1,165	676.95	5,877,191.00
ගාල්ල	388	314.89	4,195,720.00
මාතර	514	376.96	5,987,689.00
හම්බන්තොට	71	57.50	999,450.00
මන්නාරම	7	7.75	88,200.00
වවුනියාව	6	5.25	119,700.00
මුලතිවු	18	16.00	325,800.00
මඩකළපුව	8	22.00	792,000.00
අම්පාර	229	323.75	7,031,250.00
ත්‍රිකුණාමලය	37	55.50	819,900.00
කිලිනොච්චිය	4	4.50	54,000.00
කුරුණෑගල	1,524	1,587.36	30,519,074.00
මහව	558	415.16	6,793,650.00
පුත්තලම	1,695	2,982.24	56,103,005.00
අනුරාධපුරය	498	524.57	12,806,375.00
තඹුත්තේගම	156	109.51	2,432,350.00
පොළොන්නරුව	232	436.75	7,377,050.00
මනම්පිටිය	146	130.27	2,595,150.00
දෙහිඅත්තකණ්ඩිය	43	47.75	940,500.00
බදුල්ල	539	544.09	12,964,576.00
මොණරාගල	214	291.75	5,150,850.00
රත්නපුර	213	142.15	3,623,218.00
ඇඹිලිපිටිය	52	75.50	1,038,660.00
කෑගල්ල	97	39.74	749,617.00
එකතුව	**13,941**	**14,303.38**	**248,305,032.00**

2022 වර්ෂය තුළ 2021/22 මහ කන්නය සඳහා ගෙවා ඇති වන්දි මුදල			
දිස්ත්‍රික්කය	**ගොවීන් ගණන**	**අක්කර ගණන**	**වන්දි මුදල (රු.)**
ගම්පහ	531	454.66	6,180,377.00
කළුතර	229	203.99	2,550,526.00
මහනුවර	281	154.88	2,328,827.00
මාතලේ	398	290.17	4,268,210.00
නුවරඑළිය	269	140.59	1,750,601.00
ගාල්ල	142	95.98	1,114,965.00
මාතර	170	114.02	2,006,035.00
හම්බන්තොට	251	266.35	4,042,350.00
යාපනය	5,816	6,587.35	78,484,311.00
මන්නාරම	2,578	5,555.75	77,284,750.00
වවුනියාව	345	613.31	9,808,914.00
මුලතිවු	945	1,193.00	16,992,500.00
මඩකළපුව	112	284.25	4,709,700.00
අම්පාර	1,025	1,621.39	27,606,901.00
ත්‍රිකුණාමලය	508	781.00	14,065,376.00
කිලිනොච්චිය	630	725.15	7,666,155.00
කුරුණෑගල	2,535	2,159.05	33,389,112.00
මහව	1,236	1,126.96	20,220,082.00
පුත්තලම	2,018	3,443.96	53,387,972.00
අනුරාධපුරය	2,941	3,634.47	69,863,492.00
තඹුත්තේගම	589	543.44	13,501,200.00
පොළොන්නරුව	1,123	2,521.45	43,061,350.00
මනම්පිටිය	1,350	1,656.27	32,599,537.00
දෙහිඅත්තකණ්ඩිය	278	330.50	5,713,300.00
බදුල්ල	1,796	2,262.94	49,434,627.00
මොණරාගල	2,367	5,602.08	68,978,439.00
රත්නපුර	363	202.76	2,881,210.00
ඇඹිලිපිටිය	71	62.38	929,361.00
කෑගල්ල	718	307.36	3,134,227.00
එකතුව	**31,615**	**42,935**	**657,954,407.00**

ඒ අනුව 2022 වර්ෂය තුලදී රක්ෂණ අංශයේ ප්‍රධාන කාර්යක් ලෙස රක්ෂණ යෝජනා ක්‍රම යටතේ වන්දි ගෙවීම්හි සමස්ථ සාරාංශය පහත පරිදි වේ.

	ගොවීන් සංඛ්‍යාව	අක්කර ගණන	වන්දි මුදල (රු මිලියන)
2022 වර්ෂයේ එකතුව	58408	77835	1,257

එසේම මේ වන විට 21යල 2021 /22 මහ කන්නයන්ට අදාලව අභියාචනා සලකා බැලීම සිදු කිරීම ආරම්භ කර ඇත. එසේම 2022 යල කන්නයේ වගා හානි වන්දි ගෙවීම් වලට අදාලව මූලික රාජකාරී කටයුතු ආරම්භ කර ඇත.

තවද වගා හානි වන්දි මුදල් හිමි ගොවීන් සඳහා ලබා දීමට නියමිත වූ හදිසි අනතුරු රක්ෂණ ඔප්පුව සකස් කර අවසන් කරන ලදී. එසේම එහි මුද්‍රණ කටයුතු කිරීම සඳහා යොමු කර ඇත.

තවද 2023 වර්ෂයේ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කෙරෙන රක්ෂණ යෝජනා ක්‍රම සකස් කිරීමට අවශ්‍ය මූලික කටයුතු සිදු කෙරෙමින් පවතී.

එසේම පශු රක්ෂණය හදිසි අනතුරු රක්ෂණය සුවසෙත රක්ෂණය ආදී සාමාන්‍ය රක්ෂණය යටතේ රු.මිලියන 13 පමණ වන්දි මුදලක් නිදහස් කිරීමට 2022 වර්ෂය තුලදී කටයුතු කර ඇත.

ගොවි විශ්‍රාම වැටුප් ආඥාය

ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය

සහ

ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය

ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය

ගොවි විශ්‍රාම වැටුප් අංශය - 2022

කෘෂි ආර්ථිකය තුල ගොවියාගේ කාර්යභාරය හඳුනාගනිමින් එම ක්‍රියාවලිය තුල ඔහුට රැකවරණය සැළසීමේ අරමුණින් 1987 දී ක්‍රියාත්මක කරන ලද ගොවි විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමයේ මූලික පරමාර්ථය මුදුන් පමුණුවාලමින් 2022 වර්ෂ අවසාන වන විට විශ්‍රාමිකයින් 169,741ක් වෙනුවෙන් රු. 4,053,350,019 ක මුදලක් ඔවුන්ගේ ජීවිත සුරක්ෂිතතාවය වෙනුවෙන් විශ්‍රාම වැටුප් වශයෙන් ගෙවන ලදී.

ගොවි විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රම පනත මඟින් සලසා තිබූ ප්‍රතිපාදන වලට අනුකූලව ගෙවීමට සැළසුම් කර තිබූ විශ්‍රාම වැටුප් මුදලට වඩා වැඩි කල විශ්‍රාම වැටුපක් ගෙවීමට ගන්නා ලද තීරණය මත 2010 ජූලි මාසයේ අග භාගය වන විට ගොවි විශ්‍රාම වැටුප් අරමුදල ශූන්‍ය බවට පත් වුනු අතර, එම මූල්‍ය අර්බුදයට ස්ථිරසාර විසඳුමක් ලබා දී යෝජනා ක්‍රමය අකර්මණ්‍ය නොවී පවත්වා ගෙන යාම සඳහා මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ උපදෙස් මත මෙම යෝජනා ක්‍රමය ප්‍රති සංවිධානය කොට නව විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයක් වශයෙන් 2014 වර්ෂයේදී විශ්‍රාම වැටුප් ගෙවීම් ආරම්භ කරන ලදී.

නව ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ බඳවා ගැනීම් ආරම්භ කිරීම 2022 වර්ෂයේ ඔක්තෝම්බර් මස ගරු අමාත්‍ය මහින්ද අමරවීර මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් නැවත ආරම්භ කරන ලදී.

මරණ

ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට දායක වී විශ්‍රාම වැටුප් හිමිකම් ලැබීමට පෙර මියගිය දායකයින්ගේ උරුමකරුවන් වෙත මරණ පාරිතෝෂික හිමිකම් වශයෙන් 2022 වර්ෂයේ ගෙවූ ප්‍රතිලාභ ප්‍රමාණය රු. 5,087,273 කි.

බෙලහීන

යෝජනා ක්‍රමයට දායක වී බෙලහීන වූ දායකයින් 114ක් සඳහා රු. 1,196,204ක මුදලක් බෙලහීන දීමනා වශයෙන් 2022 වර්ෂය අවසන් වන විට ගෙවන ලදී.

<u>ගොවි විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය</u>

<u>ගොවි විශ්‍රාම වැටුප් ගෙවීම</u>

2022 ජනවාරි - දෙසැම්බර්

අනු අංකය	දිස්ත්‍රික් කාර්යාලය	විශ්‍රාම වැටුප් ලබන දායකයින් සංඛ්‍යාව	ගෙවූ මුදල (රු.)
1	අම්පාර	4,280	98,040,217
2	අනුරාධපුරය	8,585	183,131,435
3	බදුල්ල	7,439	172,335,259
4	මඩකලපුව	1,265	28,290,781
5	කොළඹ	5,598	146,166,870
6	ගාල්ල	14,578	386,071,979
7	ගම්පහ	11,783	290,925,074
8	හම්බන්තොට	9,601	214,232,915
9	යාපනය	2,666	62,459,908
10	කලුතර	9,399	247,927,860
11	මහනුවර	17,074	418,755,318
12	කෑගල්ල	10,526	247,783,928
13	කුරුණෑගල	20,614	472,811,857
14	මන්නාරම	107	2,008,810
15	මාතලේ	5,339	119,118,209
16	මාතර	10,462	260,396,827
17	මොණරාගල	5,886	132,125,754
18	මුලතිව්	138	3,641,464
19	නුවරඑළිය	3,329	78,121,455
20	පොලොන්නරුව	5,614	128,647,479
21	පුත්තලම	5,770	133,275,571
22	රත්නපුරය	8,091	191,427,071
23	ත්‍රිකුණාමලය	970	22,406,020
24	වව්නියාව	627	13,247,958
	එකතුව	**169,741**	**4,053,350,019**

> කිලිනොච්චි දිස්ත්‍රික්කයට අදාළ විශ්‍රාම වැටුප් ගෙවීම් වවුනියා දිස්ත්‍රික්කය හරහා කරනු ලබයි.

ගොවි විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය

මරණ පාරිතෝෂික ආරක්ෂණ ප්‍රතිලාභ ගෙවීම

2022 ජනවාරි - දෙසැම්බර්

අනු අංකය	දිස්ත්‍රික් කාර්යාලය	මරණ පාරිතෝෂික ගෙවූ දායකයින් සංඛ්‍යාව	ගෙවූ මුදල (රු.)
1.	බදුල්ල	21	438,565.00
2.	මොණරාගල	7	182,863.00
3.	කෑගල්ල	14	288,300.00
4.	මහනුවර	15	359,895.00
5.	කලුතර	11	228,291.00
6.	හම්බන්තොට	15	340,548.00
7.	ගම්පහ	11	208,358.00
8.	ගාල්ල	14	320,681.00
9.	කොළඹ	3	63,883.00
10.	මඩකලපුව	-	-
11.	තඹුත්තේගම	4	104,025.00
12.	අනුරාධපුරය	11	251,594.00
13.	අම්පාර	6	133,230.00
14.	කුරුණෑගල	10	187,206.00
15.	මනම්පිටිය	6	139,106.00
16.	පුත්තලම	9	188,540.00
17.	දෙහිඅත්තකණ්ඩිය(මහවැලි - සී)	3	69,959.00
18.	මන්නාරම	-	-
19.	මුලතිව්	-	-
20.	කල්මුනේ	-	-
21.	මහවැලි - ජී	-	-
22.	ත්‍රිකුණාමලය	-	-
23.	වවුනියාව	-	-
24.	යාපනය	5	92,878.00
25.	උඩවලව	1	17,500.00
26.	පොලොන්නරුව	3	76,117.00
27.	මාතලේ	18	401,427.00
28.	මාතර	10	207,080.00
29.	නුවර එළිය	10	286,766.00
30.	රත්නපුර	7	171,961.00
31.	මහව	14	328,500.00
එකතුව		**228**	**5,087,273.00**

ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය

ධීවර විශ්‍රාම වැටුප් අංශය - 2022

1991 අප්‍රේල් මස සිට ක්‍රියාත්මක කරනු ලබන ධීවර විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය ධීවර සහ ජලජ සම්පත් සංවර්ධන දෙපාර්තමේන්තුව හා කෘෂි කාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය ඒකාබද්ධව ක්‍රියාත්මක කරනු ලබයි.

යෝජනා ක්‍රමයේ පරමාර්ථ

- තම මහලු වයසේදී හෝ අබලතාවයකදී ධීවරයන්ට සමාජ ආරක්ෂණය සැලසීම.
- ධීවරයකු මියගිය විට එම ධීවරයාගේ යැපෙන්නන්ට සහන සැලසීම.
- තම ජීවනෝපායහි දිගටම නියැලීම සඳහා ධීවරයන් උනන්දු කරලීම.
- තරුණ ප්‍රජාව ධීවර කර්මාන්තය වෙත යොමු කරවීම සහ
- ධීවරයන් අතර ඉතිරි කිරීමේ පුරුද්ද ඇති කිරීම සහ සකසුරුවම්කම වැඩිදියුණු කිරීම වන්නේය.

1996 අප්‍රේල් මස සිට ධීවර විශ්‍රාම වැටුප් ගෙවීම ආරම්භ කල අතර, 2022 වසර අවසානය වන විට ධීවරයින් 5,556ක් මාසිකව විශ්‍රාම වැටුප් ලබයි. 2022 වර්ෂය තුළ දී විශ්‍රාම වැටුප් වශයෙන් ගෙවන ලද මුළු මුදල රු. 80,034,415.00 කි. 2022 දෙසැම්බර් 31 වන දිනට දායකයින් 69,049ක් යෝජනා ක්‍රමයට දායක වී ඇත.

මරණ පාරිතෝෂික හා බෙලහීන ප්‍රතිලාභ

ධීවර විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක වී, මියගිය දායකයින් 23ගේ උරුමකරුවන් වෙත මරණ පාරිතෝෂික හිමිකම් ප්‍රතිලාභ වශයෙන් 22 වර්ෂයේ ගෙවූ ප්‍රතිලාභ ප්‍රමාණය රු. 231,000.00 කි.

ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය

විශ්‍රාම වැටුප් ගෙවීම - **2022** වර්ෂය

දිස්ත්‍රික් ධීවර ව්‍යාප්ති කොට්ඨාශය	විශ්‍රාම වැටුප් ගෙවීම	
	දායක සංඛ්‍යාව	(ජන-දෙසැ) මුදල (රු)
කළුතර	125	1,795,947.00
ගාල්ල	145	2,161,719.00
මහවැව	453	6,554,779.00
මාතර	347	4,985,779.00
කොළඹ	67	996,095.00
තංගල්ල	294	4,282,064.00
පුත්තලම	69	1,004,833.00
මීගමුව	693	10,011,540.00
මඩකලපුව	539	8,355,391.00
ත්‍රිකුණාමලය	131	1,990,414.00
මන්නාරම	536	7,932,374.00
කල්මුනේ	391	5,668,433.00
මුලතිව්	81	1,206,687.00
කිලිනොච්චි	428	6,040,402.00
යාපනය	1,185	16,070,630.00
මිරිදිය ධීවර ජලාශ		
නුවරඑළිය	8	107,004.00
පොළොන්නරුව	2	28,800.00
රත්නපුර	5	58,843.00
මොණරාගල	1	15,804.00
කුරුණෑගල	3	41,400.00
අනුරාධපුර	4	56,515.00
මාතලේ	5	67,776.00
නුවර	9	124,392.00
කෑගල්ල	-	-
බදුල්ල	7	98,604.00
වව්නියා	2	29,208.00
මඩකලපුව මිරිදිය	26	348,982.00
එකතුව	5,556	80,034,415.00

ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය

2022.12.31 දිනට බඳවා ගැනීම්

දිස්ත්‍රික් ධීවර ව්‍යාප්ති කොට්ඨාශය	වයස අනුව දායක සංඛ්‍යාව						2022 මුළු දායක සංඛ්‍යාව
	18-29	30-35	36-45	46-50	51-54	55-59	
කළුතර	1,213	721	772	197	105	59	3,067
ගාල්ල	1,082	676	840	221	118	95	3,032
මහවැව	3,253	1,702	2,036	613	256	240	8,100
මාතර	17,50	980	1,232	346	201	164	4,673
කොළඹ	576	360	478	140	63	38	1,655
තංගල්ල	2,514	1,389	1,629	412	201	169	6,314
පුත්තලම	2,167	1,156	1,222	255	107	61	4,968
මීගමුව	2,538	1,599	2,167	735	419	378	7,836
මඩකලපුව	2,248	1,390	1,630	555	272	266	6,361
ත්‍රිකුණාමලය	654	516	550	129	81	78	2,008
මන්නාරම	2,066	1,227	1,343	429	222	257	5,544
කල්මුනේ	1,565	1,109	1,515	479	244	207	5,119
මුලතිව්	88	79	141	50	27	44	429
කිලිනොච්චි	519	340	540	250	185	183	2,017
යාපනය	2,185	1,117	1,444	668	402	617	6,433
මිරිදිය ධීවර ජලාශ							
නුවරඑළිය	29	28	47	7	1	3	115
පොළොන්නරුව	45	35	27	11	2	1	121
රත්නපුර	27	15	9	1	3	-	55
මොණරාගල	17	14	10	1	-	-	42
කුරුණෑගල	45	24	24	1	-	2	96
අනුරාධපුර	169	81	84	17	7	5	363
මාතලේ	31	14	23	5	2	3	78
නුවර	13	12	25	5	3	3	61
කෑගල්ල	1	1	2	-	-	-	4
බදුල්ල	59	33	33	3	-	3	131
වව්නියා	59	33	41	15	4	-	152
මඩකලපුව මිරිදිය	84	52	67	27	20	25	275
මුළු එකතුව	**24,997**	**14,703**	**17,931**	**5,572**	**2,945**	**2,901**	**69,049**

අභ්‍යන්තර විගණන අංශය

අභ්‍යන්තර විගණන අංශය -2022

2022 වර්ෂය සඳහා කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ ක්‍රියාත්මක රක්ෂණ සහ සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රම සඳහා එක් එක් අංශ හා දිස්ත්‍රික් කාර්යාල අනුව පිළියෙල කරන ලද වාර්ෂික අභ්‍යන්තර විගණන වැඩ සටහනට අනුකූලව අභ්‍යන්තර විගණන කටයුතු ක්‍රියාත්මක කරන ලදී.

ඒ අනුව අභ්‍යන්තර විගණන අංශයේ මානව සම්පතෙහි සහකාර අධ්‍යක්ෂ අභ්‍යන්තර විගණන, සංවර්ධන නිලධාරී, කළමනාකරණ සහකාර නිළධාරිනියගේ හා කාර්යාල කාර්ය සහයක නිලධාරියාගේ විගණන දායකත්වය සහිතව 2022 වර්ෂය සඳහා අභ්‍යන්තර විගණන පරීක්ෂණ 22 ක් ප්‍රධාන කාර්යාලයේ එක් එක් අංශ සහ භූගෝලීය මට්ටමින් ව්‍යාප්ත වී ඇති දිස්ත්‍රික් කාර්යාල 30 පදනම් කොටගෙන සිදු කරන ලදී.

කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය සඳහා පවතින කෘෂිකාර්මික අවදානම් කළමනාකරණය කිරීමේ අරමුණ මූලික කොටගෙන එක් එක් අංශ හා දිස්ත්‍රික් කාර්යාලවල කටයුතු කාර්යක්ෂමව හා සඵලදායීව ඉටු කිරීම සඳහා ක්‍රියාත්මක කර ඇති අභ්‍යන්තර පාලන ක්‍රම වල ප්‍රමාණාත්මකභාවය, නිරවද්‍යතාවය හා ඒවායේ ක්‍රියාකාරීත්වය ඇගයීම සඳහා පහත එක් එක් අංශ යටතේ අභ්‍යන්තර විගණන පරීක්ෂණ සැලසුම් කොට ක්‍රියාත්මක කරන ලදී.

පාලන අංශය ආවරණය වන පරිදි යතුරු පැදි ණය ලබා දීම පරීක්ෂාව 2020/2021, මණ්ඩලිය මෝටර් රථ නඩත්තුව, ධාවනය, භාවිතය හා ඉන්ධන භාවිතය පිළිබඳ පරීක්ෂා කිරීම, නිවාඩු වාර්තා පරීක්ෂාව- (කුරුණෑගල, ගාල්ල, මහනුවර, ගම්පහ, මොණරාගල), පාලන අංශයේ නිළධාරීන්ගේ නිවාඩු වාර්තා පරීක්ෂා කිරීම, 2022/12/31 දිනට භෞතික තොග පරීක්ෂාව යන ක්ෂේත්‍ර යටතේ විගණන පරීක්ෂණ සිදු කර ඇත. මණ්ඩලිය නිති අංශයේ කටයුතු ආවරණය වන පරිදි තෙවන පාර්ශවිය නඩු කටයුතු පිළිබඳ පරීක්ෂාව 2021/2022 සිදු කර ඇත.

මුදල් අංශය ආවරණය වන පරිදි ගිණුම් අංක 001622 පශු රක්ෂණ ගිණුම - මුදල් පොත හා බැංකු සැසඳුම් පිළියෙල කිරීම පිළිබඳ පරීක්ෂාව, ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ පසු වාරික මුදල් ප්‍රධාන කාර්යාලය වෙත ප්‍රේෂණය කිරීමේ ක්‍රියාවලියේ ලේඛණ පිලියෙල කිරීම හා ප්‍රධාන කාර්යාලය වෙත යොමු කිරීමේ ක්‍රියාවලිය සමාලෝචනය කිරීම, 2021.12.31 දිනට කෘෂි රක්ෂණ යෝජනා ක්‍රමයේ ආයෝජන වටිනාකම පරීක්ෂා කිරීම, සුළු මුදල් ශේෂය පරීක්ෂාව - 2022/12/31 යන ක්ෂේත්‍ර යටතේ විගණන පරීක්ෂණ සිදු කර ඇත.

රක්ෂණ අංශයේ කටයුතු වලට අදාලව පශු රක්ෂණ වාරික ආදායම හා වන්දි ගෙවීම පිළිබඳ පරීක්ෂාව 2021, පුත්තලම දිස්ත්‍රික්කයේ 2021 යල කන්නයට අදාලව වන්දි ගණනය කිරීමේ පදනම පිළිබඳව පරීක්ෂාව, පශු රක්ෂණ යෝජනා ක්‍රමයේ වාරික ආදායම හා වන්දි ගෙවීම් පිළිබඳ පරීක්ෂාව (2019/2020/2021) - බොරලන්ද රජයේ සත්ත්ව ගොවිපොල - බදුල්ල යන ක්ෂේත්‍ර යටතේ විගණන පරීක්ෂණ සිදු කර ඇත. සංවර්ධන අංශයේ කටයුතු වලට අදාලව ඉදිරි වැඩසටහන්, දෙසති වාර්තා පිළියෙල කිරීම හා ප්‍රධාන කාර්යාලයට ඉදිරිපත් කිරීම හා කාර්යය සාධනය පරීක්ෂාව (තඹුත්තේගම) යන ක්ෂේත්‍ර යටතේ විගණන පරීක්ෂණ සිදු කර ඇත.

ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රමය යටතේ ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය - මරණ පාරිතෝෂික ගෙවීම පරීක්ෂාව 2021 , ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රමයේ තැපැල් කාර්යාල මගින් ගොවි විශ්‍රාම වැටුප් ගෙවීම යන ක්ෂේත්‍ර යටතේ විගණන පරීක්ෂණ සිදු කර ඇත.

රට තුල පැවති අර්බුදකාරී තත්ත්වය හමුවේ දිස්ත්‍රික් කාර්යාල 30 අතරින් ඇඹිලිපිටිය දිස්ත්‍රික් කාර්යාල පරීක්ෂාව පමණක් සිදු කරන ලදි.

සභාපතිතුමා විසින් හා අධ්‍යක්ෂ ජනරාල්තුමා විසින් නියෝග කරන ලද විශේෂ පරීක්ෂණ යටතේ ක්ෂේත්‍ර නිළධාරී රුහුණගේ විපුල මහතා සේවයට වාර්තා නොකිරීම හා වාර මුදල් බැංකු ගත නොකිරීම පිළිබඳ විශේෂ පරීක්ෂණය, සහකාර අධ්‍යක්ෂ ධනුක රංගන මහතාගේ පත්වීම සම්බන්ධයෙන් සිදුකරන ලද විශේෂ පරීක්ෂණය, අභ්‍යාසලාභී පුහුණු නිළධාරීන් ක්ෂේත්‍ර රාජකාරී සඳහා අනුයුක්ත කිරීම - පොලොන්නරුව දිස්ත්‍රික් කාර්යාලය, අධ්‍යක්ෂ ජනරාල්ගේ නිවාඩු වාර්තා පිළිබඳ පරීක්ෂාව, මණ්ඩලයේ ප්‍රධාන කාර්යාල විධායක නිළධාරීන්ගේ 2022 ජනවාරි මස සිට ජුලි මාසය දක්වා රාජකාරියට පැමිණීම, පිටවීම හා නිවාඩු ලබා ගැනීම සහ අනුමැතිය ලබා ගැනීම පිළිබඳ පරීක්ෂාව, නිටපු සභාපති හෂාන් දිසානායක මහතා විසින් ඔහුගේ රාජකාරී කාලය තුල මණ්ඩලීය වාහන අවභාවිතා කර තිබේද යන්න පිළිබඳ පරීක්ෂාව, 2022/11/26 වන දින ප්‍රධාන කාර්යාලීය පවිත්‍රතා කටයුතු සිදු කිරීමේදී වායු සමීකරණ යන්ත්‍රවලට අදාලව තඹ බට කිහිපයක් ආයතන පරිශ්‍රයෙන් පිටතට ගෙනයාමට උත්සාහ කිරීම සම්බන්ධ පරීක්ෂණය - කාර්යාල කාර්ය සහයක ඉන්දික වීරසිංහ මහතා, යන ක්ෂේත්‍ර යටතේ පරීක්ෂාවන් සිදුකර ඇත.

විගණකාධිපති දෙපාර්තමේන්තුව, කෘෂිකර්ම අමාත්‍යාංශය හා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධීකරණ කටයුතු සිදු කරගෙන යාම අභ්‍යන්තර විගණන අංශය විසින් සිදු කොට ඇත.

<u>විගණන කළමණාකරන කමිටු රැස්වීම් පැවැත්වීම</u>

2022 වර්ෂයේදී රට තුල පැවති තත්ත්වයන් හේතුකොට ගෙන 2022 වර්ෂයට අදාළව විගණන කළමනාකරණ කමිටු රැස්වීම් 3ක් (2022/02/26 ,2022/09/30, 2022/12/22) පවත්වා ඇති අතර එහිදී වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්මට අනුව අභ්‍යන්තර විගණන අංශය විසින් සිදු කර ඇති විගණන පරීක්ෂණ වාර්තා ඇගයීම, රජයේ විගණන විමසුම් සමාලෝචනය කිරීම, වාර්ෂික මූල්‍ය ප්‍රකාශන වලට අදාල විගණකාධිපති වාර්තා සමාලෝචනය කිරීම සිදු කර ඇත. විගණන කළමණාකරන කමිටු සමාජිකයින් පහත පරිදි වේ.

2022/02/26 දිනැති විගණන කළමණාකරන කමිටුවේ සාමාජිකයින්,

ඩබ්.ඒච්.ඒ.විමලජීව මහත්මිය	කමිටු සභාපති- අධ්‍යක්ෂිකා - රාජ්‍ය මුල්‍ය දෙපාර්තමේන්තුව
ඒ.එම්.එල්.අබේරත්න මහතා	කමිටු සාමාජික - කොමසාරිස් ජනරාල් ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව
එන්. නිලක්ෂි ගුණසේකර මහත්මිය	කමිටු සාමාජික - අතිරේක ලේකම් - කෘෂිකර්ම අමාත්‍යාංශය

2022/09/30 හා 2022/12/22 දිනැති විගණන කළමණාකරන කමිටුවේ සාමාජිකයින්,

ආර්.එම්. ඩී.කේ.ජී.එන්.ඩී.රණතුංග මහතා	කමිටු සභාපති- අධ්‍යක්ෂ - රාජ්‍ය මුල්‍ය දෙපාර්තමේන්තුව
ඒ.ඒම්.එල්.අබේරත්න මහතා	කමිටු සාමාජික - කොමසාරිස් ජනරාල් ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව
එන්. නිලක්ෂි ගුණසේකර මහත්මිය	කමිටු සාමාජික - අතිරේක ලේකම් - කෘෂිකර්ම අමාත්‍යාංශය

පරීපාලන හා මානව සම්පත් අංශය

පරිපාලන හා මානව සම්පත් අංශය

කාර්ය මණ්ඩලය

2022.12.31 දිනට කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ කාර්ය මණ්ඩලය පහත සඳහන් පරිදි විය.

කාර්ය මණ්ඩල සංයුතිය

සේවාගණය	තනතුරු නාමය	අනුමත සේවක සංඛ්‍යාව	සිටින සංඛ්‍යාව	පුරප්පාඩු
ජ්‍යෙෂ්ඨ කළමනාකරණ				
HM	අධ්‍යක්ෂ ජනරාල්	1	1	-
HM	අධ්‍යක්ෂ	5	1	4
කළමනාකරණ				
MM	නියෝජ්‍ය අධ්‍යක්ෂ/ සහකාර අධ්‍යක්ෂ	45	32	13
කනිෂ්ඨ කළමනාකරණ				
JM	පරිපාලන නිලධාරි	2	-	2
	පද්ධති පරිපාලක	1	-	1
	මූල්‍ය නිලධාරි	1	-	1
	සැලසුම් නිලධාරි	1	-	1
ආශ්‍රිත නිලධාරි				
ASS.O	සංවර්ධන නිලධාරි	55	28	27
	සැපයුම් නිලධාරි	1	-	1
	අභ්‍යන්තර විගණන නිලධාරි	1	-	1
කළමනාකරණ සහකාර (තාක්ෂණික)				
MA - Tech	ප්‍රවාහන සහකාර	1	1	-
	ලේකම්	1	1	-
	පොත් තබන්නා	4	1	3
	දෘඩාංග හා ජාලකරණ ශිල්පී	1	1	-
	කාර්මික ශිල්පී (ශ්‍රව්‍ය/දෘශ්‍ය)	1	-	1
කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන)				
MA – Non Tech	කළමනාකරණ සහකාර	220	145	75
ප්‍රාථමික (ශිල්පීය)				
PL - Skilled	රියදුරු	38	24	14
ප්‍රාථමික (ශිල්පීය නොවන)				
PL - Non Skilled	කාර්යාල සහායක	42	38	4
		421	**273**	**148**

මණ්ඩලයේ කාර්යභාර්ය අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා නිලධාරීන් බඳවා ගන්නා තෙක් පවතින පුරප්පාඩු වලින් අත්‍යාවශ්‍යම තනතුරු කිහිපයක් සඳහා ප්‍රධාන කාර්යාලය හා දිස්ත්‍රික් කාර්යාල සඳහා පහත සඳහන් තනතුරු වෙනුවෙන් කොන්ත්‍රාත් පදනමින් හා අනියම් පදනමින් නිලධාරීන් යොදවාගෙන ඇත.

කොන්ත්‍රාත් පදනම

MA - NonTech	කළමනාකරණ සහකාර/ක්ෂේත්‍ර	1
PL - Skilled	රියදුරු	1
PL - Non Skilled	කාර්යාල සහායක (සනීපාරක්ෂක කම්කරු)	1
	එකතුව	**3**

අනියම් පදනම

ASS.O	සංවර්ධන නිලධාරි	02
MA - NonTech	කළමනාකරණ සහකාර	13
	එකතුව	**15**

2022.12.31 දිනට කාර්ය මණ්ඩල විශ්ලේෂණය

කාර්ය මණ්ඩලයේ ස්ත්‍රී /පුරුෂ විශ්ලේෂණය

පුරුෂ -148

ස්ත්‍රී - 125

එකතුව - 273

සේවා කාලය අනුව විශ්ලේෂණය

අවුරුදු	සේවක සංඛ්‍යාව	ප්‍රතිශතය
30 ට වැඩි	19	7%
26 - 30	14	5%
21 - 25	7	3%
16 - 20	42	15%
15 ට අඩු	191	70%
එකතුව	273	100%

වයස් විශ්ලේෂණය

වයස් කාණ්ඩය	සේවක සංඛ්‍යාව	ප්‍රතිශතය
56 - 60	29	11%
51 - 55	30	11%
46 - 50	46	17%
41 - 45	59	22%
36 - 40	41	15%
31 - 35	27	10%
30 ට අඩු	41	15%
එකතුව	273	100%

2022 වර්ෂය තුළ විශ්‍රාම යාම්, මිය යාම් හා සේවයෙන් ඉවත්වීම්

2022 වර්ෂය තුළදී මණ්ඩලයේ සේවයේ නියතු නිලධාරීන්ගෙන් පහත සඳහන් හේතූන් මත නිලධාරීන් 17 දෙනෙකු සේවයෙන් ඉවත්ව ගොස් ඇත.

	තනතුරු නාමය	සංඛ්‍යාව	සේවය අවසන් කිරීමට හේතුව
1	නියෝජ්‍ය/සහකාර අධ්‍යක්ෂ	03 03	විශ්‍රාම යාම සේවයෙන් ඉල්ලා අස්වීම
2	සංවර්ධන නිලධාරි	03 02	විශ්‍රාම යාම සේවයෙන් ඉල්ලා අස්වීම
3	කළමනාකරණ සහකාර	02 01	විශ්‍රාම යාම සේවයෙන් ඉල්ලා අස්වීම
4	කාර්යාල සහයක	01	විශ්‍රාම යාම
5	රියදුරු	02	විශ්‍රාම යාම

2022 වර්ෂය තුළ බඳවා ගැනීම් හා උසස් කිරීම්

මෙම වර්ෂයේදී කළමනාකරණ සහකාර තනතුරු පුරප්පාඩු සඳහා නිලධාරීන් 16 දෙනෙකුද, කාර්යාල සහායක තනතුරු පුරප්පාඩු සඳහා නිලධාරීන් 09 දෙනෙකු ද බඳවා ගැනීමට කටයුතු කරන ලදී.

සේවක පුහුණු හා අධ්‍යාපන කටයුතු

2022 වර්ෂයේ පහත පුහුණු වැඩසටහන් සඳහා නිලධාරීන් යොමු කිරීමට හැකි විය.

නිලධාරියාගේ නම	තනතුර	පුහුණු වැඩසටහනේ නම	පුහුණු ආයතනයේ නම	කාල සීමාව
1.චමින්ද කුමාර කීර්තිරත්න මයා	සැපයුම් නිලධාරි-වැ.බ.	රජයේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව	නිපුණතා සංවර්ධන අරමුදල	දින 10
2. කල්ප රොෂාන් ගුණතිලක මහතා	ප්‍රවාහන නිලධාරි	මෝටර් රථ කාර්මික ශිල්පය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව	ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනය	වසර 01
3. නලින් චමින්ද ජානක දිසානායක මහතා	කළමනාකරණ සහකාර(ගබඩා)	ගබඩා කළමනාකරණය	සැපයුම් හා ද්‍රව්‍ය කළමනාකරණ ආයතනය	මාස 03

තවද සියළු ස්ථිර කාර්ය මණ්ඩලය 2022 වර්ෂයේදී විෂය දැනුම යාවත් කාලීන කිරීම සඳහා ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනයේ පුහුණු වැඩමුළුවක් සංවිධානය කර යොමු කරවන ලදී.

සේවක සුභසාධනය

වෛද්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය,යතුරු පැදි හිමි නිලධාරීන්ට යතුරුපැදි ණය ලබාදීම පෙර වර්ෂයේ දී මෙන් මෙම වර්ෂය තුළ ද අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලදී.

ප්‍රසම්පාදන හා ප්‍රවාහන ක්ෂේත්‍රය

සැපයුම් අංශය

මණ්ඩලය මඟින් ක්‍රියාත්මක කරනු ලබන රක්ෂණ යෝජනා ක්‍රම වලට අදාළ පහත ලිපිලේඛන රජයේ ප්‍රසම්පාදන ක්‍රමවේදය අනුගමනය කරමින් බාහිරින් මුද්‍රණය කිරීමට කටයුතු කරන ලදී.

තෙවන පාර්ශව රක්ෂණ යෝජනා ක්‍රමය

- තෙවන පාර්ශව අයදුම්පත්
- තෙවන පාර්ශව කුවිතාන්සි පොත්
- තෙවන පාර්ශව ආවරණ පොත්
- තෙවන පාර්ශව කාඩ්පත්

වගා රක්ෂණ යෝජනා ක්‍රමය

- වගා රක්ෂණ අයදුම්පත්‍ර
- වී වගා රක්ෂණ අයදුම්පත්
- අතිරේක බෝග හානි අයදුම්පත්
- හානි වාර්තා කිරීමේ ලේඛන
- හානි වාර්තා කිරීමේ පොත්

ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය යටතේ

- ගොවි විශ්‍රාම ගෙවීමේ පොත්
- ගොවි විශ්‍රාම වැටුප් හඳුනාගැනීමේ කාඩ්පත්

ධීවර විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය යටතේ

- ධීවර විශ්‍රාම වැටුප් ගෙවීමේ පොත්
- ධීවර විශ්‍රාම වැටුප් හඳුනාගැනීමේ කාඩ්පත්

මූල්‍යමය කටයුතු සඳහා යොදා ගන්නා - පොදු කුවිතාන්සි පොත්

මීට අතිරේකව ප්‍රධාන කාර්යාලයට හා දිස්ත්‍රික් කාර්යාලවලට අවශ්‍ය පොදු 35, නිවාඩු ඉල්ලුම් පත්‍ර, පශු රක්ෂණ අයදුම්පත්, පශු රක්ෂණ ඔප්පු, සුවසෙත අයදුම්පත්, සුවසෙත ඔප්පු හා ප්‍රවාහන රාජකාරි සඳහා අවශ්‍ය ලිපි ලේඛන මණ්ඩලීය ඩුප්ලෝ මුද්‍රණ යන්ත්‍රය මඟින් මුද්‍රණය කිරීම ද සිදු කරන ලදී.

දිස්ත්‍රික් කාර්යාල හා ප්‍රධාන කාර්යාලයට අවශ්‍ය තාක්ෂණික උපකරණ මිලදී ගැනීමේදී ප්‍රසම්පාදන ක්‍රමවේදයක් අනුව කටයුතු කළ අතර, ඒ අනුව දිස්ත්‍රික් කාර්යාල සඳහා කාර්යාල උපකරණ (මේස, පුටු, කබඩ්) මිලදී ගැනීම ද සිදු කරන ලදී.

ප්‍රධාන කාර්යාලයේ අංශවලින් ඉල්ලුම් කරන ලිපිද්‍රව්‍ය ප්‍රසම්පාදන ක්‍රමවේදයන් අනුගමනය කරමින් මිලට ගෙන ගබඩාව වෙත ලබාදීම සිදුකරන ලදී. ඊට අමතරව කණිෂ්ඨ සේවකයින් සඳහා ලබා දෙන නිල ඇඳුම් ප්‍රසම්පාදන ක්‍රමවේදය අනුව මිලදී ගැනීමට මෙම වසරේදී ද කටයුතු කරන ලදී.

<u>ප්‍රවාහන සංචිතය</u>

මණ්ඩලයේ කාර්යභාරය ඉටුකිරීම සඳහා ප්‍රධාන කාර්යාලය, දිස්ත්‍රික් කාර්යාල සතුව වාහන 29ක් ඇත. මෙම වාහන වලින් වෙන් කළ වාහන 02 ක් ඇති අතර, අනෙකුත් වාහන ප්‍රධාන කාර්යාලයේ සහ දිස්ත්‍රික් කාර්යාලවල සංචිත රාජකාරිවල යොදා ඇත. එම වාහන පහත පරිදිවේ.

අනු අංකය	වාහන අංකය	වර්ගය	ලියාපදිංචි වර්ෂය	ආයු කාලය
01	32-1427	Mitsubishi Pajero	1985	38
02	32-4880	Toyota (Land Crusir)	1988	35
03	32-4850	Toyota (Land Crusir)	1988	35
04	32-4852	Toyota (Land Crusir)	1988	35
05	32-4938	Mitsubishi Pajero	1988	35
06	32-4920	Mitsubishi Pajero	1988	35
07	32-5210	Mitsubishi Pajero	1988	35
08	51-2423	Nissan (Cab)	1990	33
09	32-7718	Dihasthu (Jeep) (Rocky)	1990	33
10	32-7719	Dihasthu (Jeep) (Rocky)	1990	33
11	32-8016	Dihasthu (Jeep) (Rocky)	1990	33
12	53-9447	Mitsubishi (L200)	1992	31
13	53-9446	Mitsubishi (L200)	1992	31
14	58-4436	Mitsubishi (L200)	1996	27
15	58-4437	Mitsubishi (L200)	1996	27
16	HH-6105	Bolero (Jeep)	2003	20
17	KD-3476	Toyota (121)	2006	17
18	KF-2280	Mitsubishi Pajero	ලියාපදිංචි වර්ෂය-2007 නිෂ්පාදිත වර්ෂය -1992	- 31
19	QM-4647	Bajaj (Threewheel)	2007	16
20	KH-5041	Chevrolet (Aveo)	2008	15
21	KI-2554	Nissan (Sunny)	2008	15
22	KP-8706	Maruti (800)	2011	12
23	KP-8723	Maruti (800)	2011	12
24	KQ-0253	Maruti (800)	2011	12
25	NC-4104	Toyota (Hiace)	2015	8
26	NC-4096	Toyota (Hiace)	2015	8
27	CAL-6100	Micro(Rexton)	2015	8
28	CAL-6101	Micro(Rexton)	2015	8
29	TVS	Champ බයිසිකල් - 48cc	2008	15

කාර්යාල ගොඩනැගිලි

මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලය මෙම වසර තුල දී ද නො:117, සුභද්‍රාරාම පාර, ගංගොඩවිල, නුගේගොඩ ලිපිනයේ පිහිටි පුද්ගලික ගොඩනැගිල්ලේ කුළී පදනම මත පවත්වාගෙන යන ලදී. මණ්ඩලයේ ප්‍රාදේශීය කාර්යාල 30 ක් පවත්වාගෙන යන අතර, මින් මණ්ඩලයට අයත් ගොඩනැගිලි 06කි. අනෙකුත් දිස්ත්‍රික් කාර්යාල මාසික කුලී පදනම මත රාජ්‍ය හා පෞද්ගලික ගොඩනැගිලි තුළ තවදුරටත් පවත්වාගෙන යනු ලැබේ.

සැලසුම් අංශය

සැලසුම් අංශය - 2022

2022 වර්ෂය තුළ සැලසුම් අංශය විසින් කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ දැක්ම හා මෙහෙවර අනුව ක්‍රියාත්මක වෙමින්, මණ්ඩලයේ සියලු අංශයන් සම්බන්ධීකරණය කොට අරමුණු හා ඉලක්ක කරා ළඟා වීමට අවශ්‍ය සැලසුම් සකස් කිරීම, ව්‍යාපෘති හා යෝජනා ක්‍රම සැලසුම් කිරීම, දත්ත හා සංඛ්‍යාත කාල ක්‍රමනුගතව රැස් කිරීම, විශ්ලේෂණය කිරීම, නිගමන හා නිර්දේශ ඉදිරිපත් කිරීම, පර්යේෂණ කටයුතු සිදු කිරීම ආදී කර්තව්‍යන්හි නිරත විය.

<u>ඉදිරි වර්ෂ පහ සඳහා සැලසුම් සකස් කිරීම</u>

- 2022 හා 2023 වර්ෂ සඳහා ක්‍රියාත්මක සැලැස්ම සකස් කිරීම

2022 වර්ෂය සඳහා වන ක්‍රියාත්මක සැලැස්ම හා පස් අවුරුදු උපාය මාර්ගික සැලැස්මේ කෙටුම්පත, 2022/02/23 දින පැවති 516 වන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමට ඉදිරිපත් කරන ලද අතර, එහිදී තීරණය වූ පරිදි, 2022/04/30 දින 519 විශේෂ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමක් කැඳවමින් මණ්ඩලීය ඉදිරි කටයුතු ක්‍රියාත්මක කරන ආකාරය පිළිබඳ වැඩිදුර සාකච්ඡා කරන ලදී.

එහිදී සකච්ඡා කෙරුණු කරුණු පදනම් කර ගනිමින්, විධායක නිලධාරීන් හා අනෙකුත් අවශ්‍ය නිලධාරීන්ගේ සහභාගිත්වයෙන්, 2022/05/23, 2022/05/28 හා අංශ මට්ටමෙන් අවශ්‍ය පරිදි සාකච්ඡා හා රැස්වීම් පවත්වමින්, උපායමාර්ගික සැලැස්ම ඇතුලත් 2022 ක්‍රියාත්මක සැලැස්ම සකස් කරන ලදී.

නව සභාපති තුමාගේ පැමිණීමෙන් පසු ඒ වන විටත් සකස් කර අවසන් කර තිබූ 2022 ක්‍රියාත්මක සැලැස්ම හා උපාය මාර්ගික සැලැස්ම (ක්‍රියාත්මක සැලැස්ම) අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීමට අපේක්ෂා කරමින් තව දුරටත් සාකච්ඡා කරන ලදී. ඒ අනුව නව සංකල්පයක් යටතේ සංශෝධන කටයුතු සිදු කල යුතු වන බව තීරණය විය. එය 2022 වර්ෂයේ අවසන් මාස කිහිපය බැවින්, ඒ වන විටත් සකස් කර අවසන් කර තිබූ 2022 ක්‍රියාත්මක සැලැස්ම හා උපාය මාර්ගික සැලැස්ම අනුසාරයෙන් 2023 වර්ෂයම පදනම් කර ගනිමින් නව ක්‍රියාත්මක සැලැස්ම සකස් කිරීම සඳහා උපදෙස් ලැබුණි. එහිදී මණ්ඩලයේ දැක්ම , මෙහෙවර හා පරමාර්ථ ද වර්තමානයට හා අනාගත ඉදිරි සැලැස්ම සකස් කිරීමට ගැලපෙන අයුරින් ඉදිරි අරමුණු හා අපේක්ෂා අනුව සකස් කරන ලදී. ඒ අනුව සාමාන්‍යයෙන් මෙවැනි කටයුත්තක් සඳහා යම් සැලකිය යුතු කාලයක් ගත වුවද 2022 වාර්තාව සකස් කර පුර්ව සුදානමක් සහිතව සිටි බැවින් 2022 ක්‍රියාත්මක සැලැස්ම හා උපාය මාර්ගික සැලස්ම නව සංකල්පයක් හා ආකෘතියක් යටතේ සකස් කෙරුණු අතර එහිදී ලැබුණු අදහස් පාදක කර ගනිමින් 2023 ක්‍රියාත්මක සැලස්ම සකස් කරන ලදී.

ඒ සඳහා, මේ පිලිබඳ විශේෂඥයෙකු වන ඉංජී. ප්‍රභාත් විතානගේ මහතාගේ ප්‍රධානත්වයෙන්, විධායක නිලධාරීන්, සංවර්ධන නිලධාරීන්, කළමනාකරණ සහකාර නිලධාරීන් ඇතුළු 50කගේ සහභාගිත්වයෙන් 2022/10/19 හා 2022/10/20 යන දෙදින හෙක්ටර් කොබ්බැකඩුව ගොවි කටයුතු පර්යේෂණ අයතනයේදී විශේෂ වැඩමුළුවක් පවත්වන ලදී.

එහිදී, අංශ මට්ටමින් ආයතනික කාර්යන් විශ්ලේෂණය දැක්ම, මෙහෙවර, අභිමතාර්ථ හා පරමාර්ථයන්හි අවශ්‍ය සංශෝධන සිදු කරන ලදී. මෙසේ කෙටුම්පත් කරන ලද උපායමාර්ගික සැලැස්ම හා 2023 ක්‍රියාත්මක සැලැස්ම පිලිබඳ 2022/11/17 හා 2022/11/22 යන දිනයන්හිදී, ප්‍රධාන කාර්යාලයේ විධායක නිලධාරීන් හා වැඩිදුර සාකච්ඡා කිරීමේ රැස්වීම් පැවැත්විය.

ඒ අනුව, කෙටුම්පත් කරන ලද, 2023 වර්ෂය සඳහා වන ක්‍රියාත්මක සැලස්ම 2022 වර්ෂයේ දෙසැම්බර් 23 පැවති 523 වන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමට ඉදිරිපත් කර අනුමැතිය ලබා ගන්නා ලද අතර එහි පිටපත් කෘෂිකර්ම අමාත්‍යාංශය, මුදල් අමාත්‍යාංශය වැනි අවශ්‍ය ආයතනවලට යොමු කරන ලදී.

- රාජ්‍ය ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක සංවර්ධන වැඩසටහන් සඳහා සැලසුම් සකස් කිරීම.

රාජ්‍ය ප්‍රතිපාදන මත ක්‍රියාත්මක වන සංවර්ධන වැඩසටහන් වලට අදාළව, 2023 වර්ෂය සඳහා වූ ක්‍රියාත්මක සැලසුම් සකස් කිරීමේ කටයුතු සැලසුම් අංශයේ මූලිකත්වයෙන් සිදු කරන ලදී.

ඒ යටතේ අනිවාර්ය වගා රක්ෂණ යෝජනා ක්‍රමය , විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රමය හා ප්‍රාග්ධන අවශ්‍යතාවයට අදාලව, 2023 වර්ෂය සඳහා ප්‍රතිපාදන වෙන් කරවා ගැනීම සඳහා වූ ක්‍රියාත්මක සැලැස්ම හා 2022 වාර්ෂික ප්‍රගතිය අදාළ ආකෘතින්ට අනුව සම්පූර්ණ කර කෘෂිකර්ම අමාත්‍යාංශය වෙත යොමු කරන ලදී.

<u>අංශ අතර සම්බන්ධීකරණය, දත්ත හා තොරතුරු රැස්කිරීම හා බාහිර ආයතන සම්බන්ධීකරණය</u>

- <u>අංශ අතර සම්බන්ධීකරණය, දත්ත හා තොරතුරු රැස්කිරීම</u>

සැලසුම් අංශය විසින් 2022 වර්ෂය පුරා කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ සියලුම අංශ සමඟ මනා සම්බන්ධීකරණයක් පවත්වා ගනිමින්, එක් එක් අංශයන්ගේ යාවත්කාලීන දත්ත හා සංඛ්‍යාත තොරතුරු ක්‍රමානුකූලව රැස් කිරීම සිදු කරන ලද අතර, එම සංඛ්‍යාලේඛන විශ්ලේෂණය මඟින් මාසික, කාර්තුමය හා වාර්ෂික ප්‍රගති වාර්තා සකස් කර අවශ්‍ය කටයුතු සඳහා ඉහල කළමණාකාරීත්වය වෙත ඉදිරිපත් කරන ලදී.

- බාහිර ආයතන සම්බන්ධීකරණය

තවද, මුදල් අමාත්‍යාංශය, ශ්‍රී ලංකා මහා බැංකුව, කෘෂිකර්ම අමාත්‍යාංශය ඇතුළු කෘෂිකාර්මික ක්ෂේත්‍රය හා සම්බන්ධ සියලු ආයතන හා අනිකුත් ආයතන සම්බන්ධීකරණය කරමින්, 2022 වර්ෂයට අදාලව එම ආයතන විසින් ඉල්ලුම් කරන ලද සියළු වාර්තා සකස් කර ආයතන ප්‍රධානී මඟින් අදාළ ආයතන වලට කඩිනමින් යොමු කිරීමට කටයුතු කරන ලදී.

- කාර්යයසාධන වාර්තා සකස් කිරීම

2022 වර්ෂය තුළ මෙම මණ්ඩලය විසින් අත්කරගන්නා ලද ප්‍රගතිය පිළිබඳ දත්ත හා තොරතුරු අංශ මට්ටමෙන් රැස් කර, ඒ අනුව 2022 වර්ෂය සඳහා කාර්ය සාධන වාර්තාව, අදාල ආකෘතින්ට අනුව සකස් කරන ලද අතර එය ආයතන ප්‍රධානීන් මගින් රේඛීය අමාත්‍යාංශය වෙත යොමු කරන ලදී.

<u>ව්‍යාපෘති හා පර්යේෂණ කටයුතු ක්‍රියාත්මක කිරීම</u>

ලෝක බැංකුවට අනුබද්ධ, ජාත්‍යන්තර මූල්‍ය සංස්ථාවේ තාක්ෂණික දායකත්වය යටතේ සකස් කර අවසන් කරන ලද, කෘෂිකාර්මික තොරතුරු කළමනාකරණ පද්ධතිය (AIMS), ක්ෂේත්‍ර මට්ටමෙන් ක්‍රියාත්මක කිරීම සඳහා දිස්ත්‍රික්ක කාර්යාල වෙත හඳුන්වා දීමේ කටයුතු 2022 වර්ෂය තුළ ආරම්භ කෙරිණි.

- කෘෂිකාර්මික තොරතුරු කළමණාකරන පද්ධතිය (AMIS) හා වෙබ්/ජංගම යෙදවුම (Web/Mobile Application) දිස්ත්‍රික් කාර්යාල වෙත හඳුනවා දීම හා ක්ෂේත්‍රයේ ක්‍රියාත්මක කිරීම

2022/23 මහ කන්නයේ ආරම්භයත් සමඟ කෘෂිකාර්මික තොරතුරු කළමණාකරන පද්ධතිය (AIMS) අනුරාධපුර දිස්ත්‍රික්කය මූලික කර ගනිමින් දිවයින පුරා දිස්ත්‍රික් කාර්යාල වෙත හඳුන්වා දීමේ කටයුතු ආරම්භ කරන ලදී. එහිදී වාරික අය කිරීමක් සහිතව රක්ෂණයට දායක වන ගොවීන්ගේ තොරතුරු, වගා බිම්වල තොරතුරු, මෙම පද්ධතියට ඇතුලත් කර ගැනීම සඳහා දිස්ත්‍රික් කාර්යාල මෙහෙයවන ලදී.

උක්ත වැඩසටහන යටතේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ ක්ෂේත්‍ර භාරව කටයුතු කරනු ලබන දිස්ත්‍රික් අධ්‍යක්ෂ, සංවර්ධන නිලධාරීන් හා ක්ෂේත්‍ර නිලධාරීන් පුහුණු කිරීමේ කටයුතු, ප්‍රධාන කාර්යාලයේ නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් ක්ෂේත්‍රය තුළ ප්‍රයෝගික පුහුණු වැඩසටහනක් ලෙස 2022/11/12 හා 2022/11/13 යන දෙදින තුළ අනුරාධපුර දිස්ත්‍රික්කයේදී සිදු කරන ලදී. තව ද දත්ත පද්ධතියට දත්ත ඇතුලත් කිරීමේ කටයුතු සඳහා සහය දැක්වීමට, ප්‍රධාන කාර්යාලයේ තාක්ෂණික දැනුම සහිත නිලධාරියෙකු 2022/11/12 සිට සතියක කාලයක්, අනුරාධපුර දිස්ත්‍රික්කයේ ක්ෂේත්‍ර වැඩසටහන සඳහා සහභාගී කරවන ලදී. උක්ත වැඩසටහන සඳහා දත්ත පද්ධතිය පිලිබඳ පෙර පුහුණුවක් සහිත රජරට විශ්ව විද්‍යාලයට අයත් සිසුන් දෙදෙනෙකු ද, අවශ්‍ය තාක්ෂණික මෙවලම් ද සමඟින් මේ සඳහා යොමු කරන ලදී.

මීට සමගාමීව, දිවයිනේ සියළුම දිස්ත්‍රික්ක සඳහා කෘෂිකාර්මික තොරතුරු කළමනාකරණ දත්ත පද්ධතියට (AIMS), දත්ත ඇතුලත් කිරීම හා එහි භාවිතයන් පිලිබඳ අවශ්‍ය උපදෙස් හා මඟපෙන්වීම් ලබා දෙන ලදී. මේ යටතේ දිස්ත්‍රික් කාර්යාලයන්හි ක්ෂේත්‍ර භාරව කටයුතු කරනු ලබන දිස්ත්‍රික් අධ්‍යක්ෂවරුන්, සංවර්ධන නිලධාරීන්, ක්ෂේත්‍ර නිලධාරීන් හා දත්ත ඇතුලත් කිරීමේ කටයුතුවලට සම්බන්ධවන අනෙකුත් නිලධාරීන් පුහුණු කිරීමේ වැඩසටහනක් ආරම්භ කරන ලදී. එහි පළමු වැඩසටහන, 2022/12/23 දින, කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලීය, පුහුණු මධ්‍යස්ථානයේදී පැවැත්විණි. මෙහිදී හම්බන්තොට, අනුරාධපුර, පොළොන්නරුව, මොණරාගල, මනම්පිටිය හා දෙහිඅත්තකන්ඩිය යන දිස්ත්‍රික් කාර්යාලයන්හි නිලධාරීන් 24 දෙනෙකු සඳහා කෘෂිකාර්මික තොරතුරු කළමනාකරණ පද්ධතිය (AIMS) හැසිරවීම, දත්ත ඇතුලත් කිරීම, සිතියම් ගත කිරීම, ඡායාරූප උඩුගත කිරීම ආදී ක්‍රියාවලින් පිලිබඳ විස්තරාත්මක හා ප්‍රායෝගික පුහුණුවක් ලබා දෙන ලදී. තවද අනෙකුත් දිස්ත්‍රික්කවල නිලධාරීන් පුහුණු කිරීමට අදාලව පුහුණු සැසි 4ක් යටතේ වැඩමුළු පැවැත්වීම සඳහා මූලික සැලසුම සකස් කිරීමේ කටයුතු ද 2022 වර්ෂයේදී සිදු කරන ලදී.

මෙලෙස, අනුරාධපුරය, හම්බන්තොට, අම්පාර, මොණරාගල, මනම්පිටිය, දෙහිඅත්තකණ්ඩිය ඇතුළු ප්‍රධාන කෘෂිකාර්මික දිස්ත්‍රික්කයන්හි රක්ෂණය වූ ගොවීන්ගේ හා වගා බිම්වල තොරතුරු, වගා බිම්වල අධීක්ෂණයට අදාල විස්තර හා එම ඡායාරූප පද්ධතියට ඇතුලත් කිරීමේ කටයුතු ප්‍රධාන කාර්යාලයේ සැලසුම් අංශයේ අධීක්ෂණය හා මෙහෙයවීම යටතේ සාර්ථකව ආරම්භ කරන ලදී. උක්ත වැඩසටහනට අදාලව ප්‍රගති සමාලෝචනය හා ක්ෂේත්‍ර මට්ටමේ ගැටළු නිරාකරණය කිරීමේ කටයුතු දුරස්ථ සන්නිවේදන ක්‍රම (දුරකථන සංවාද, ZOOM Meeting, AnyDesk) භාවිතයෙන් දෙනිකව සිදු කරන ලදී. තව ද අනුරාධපුර දිස්ත්‍රික් වැඩසටහනෙහි ප්‍රගති සමාලෝචන රැස්වීමක්, 2022/11/24 දින ප්‍රධාන කාර්යාලයේ සැලසුම් අංශයේ නිලධාරීන්ගේ සහභාගිත්වයෙන්, අනුරාධපුර දිස්ත්‍රික් කාර්යාලයේදී පවත්වන ලදී.

මීට සමගාමීව කෘෂිකාර්මික තොරතුරු කළමනාකරණ පද්ධතිය හරහා කෘෂි රක්ෂණ ක්‍රියාවලිය ක්‍රමවත් හා කඩිනම් කිරීමට අදාලව, ප්‍රධාන කාර්යාලය හා ක්ෂේත්‍ර භාර නිලධාරීන් තාක්ෂණික පහසුකම්වලින් සවිබල

ගැන්වීමේ කටයුතු ආරම්භ කරන ලදී. ඒ යටතේ ක්ෂේත්‍ර රාජකාරිවල නිරත වන නිලධාරීන් සඳහා ටැබ් යන්ත්‍ර ලබා දීම සඳහා වූ මූලික කටයුතු ආරම්භ කරන ලදී.

- බාහිර ආයතන දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

2022/23 මහ කන්නයේ සිට කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය විසින් ආරම්භ කරනු ලැබූ, කෘෂිකාර්මික තොරතුරු කළමනාකරණ පද්ධතිය (AIMS), භාවිතයෙන් රක්ෂණය කරන ලද වගා බිම් අධීක්ෂණය කිරීමේ නව ක්‍රියාවලිය පිළිබඳව, රක්ෂණ හා සම්බන්ධ බාහිර ආයතන දැනුවත් කිරීම සම්බන්ධ වැඩසටහන් මාලාවක්, ආරම්භ කරන ලදී. එහි පළමු අදියරෙහි, මූලික වැඩසටහන, 2022/12/13 දින කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ සභාපතිතුමාගේ ප්‍රධානත්වයෙන් අනුරාධපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේදී පවත්වන ලදී. ඒ සඳහා ප්‍රධාන රාජ්‍ය හා පෞද්ගලික බැංකුවල වගා ණය හා සම්බන්ධ නිලධාරීන්, කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ නිලධාරීන් හා අනුරාධපුර දිස්ත්‍රික් නිලධාරීන් ඇතුළුව 48 දෙනෙකු සහභාගී විය.

- කාලගුණ දර්ශක මත පදනම් වූ රක්ෂණ ක්‍රමවේදය හඳුන්වාදීමේ ව්‍යාපෘතියෙහි ප්‍රතිඵල ඇගයීම හා පසු විපරම් කිරීම

ජාත්‍යන්තර මූල්‍ය සංස්ථාවේ තාක්ෂණික සහය ඇතිව ක්‍රියාත්මක කර අවසන් වූ කාලගුණික දර්ශක මත පදනම් වූ රක්ෂණ ක්‍රමවේදය හඳුන්වා දීමේ ව්‍යාපෘතියේ, ප්‍රතිඵල ඇගයීමට අදාල සම්මුඛ පරීක්ෂණයෙන් 2022/12/05 දින , IFC ආයතනයෙහි පැවැත්විය. ඒ සඳහා ව්‍යාපෘතියට සම්බන්ධ වූ විදේශ නියෝජිතයන් හා සැලසුම් අංශයේ නිලධාරීන් සහභාගී විය.

තවද, මෙම ව්‍යාපෘතිය ඇගයීමේ කටයුතු සඳහා විදේශ නියෝජිතයින්ගෙන් සමන්විත ඇගයීම් කමිටුවක් දිවයිනට පැමිණෙන ලදී. ඒ අනුව 2022/11/15 දින එම කණ්ඩායම හා මණ්ඩලයේ ඉහල කළමනාකාරිත්වය අතර හමුවක් පැවති අතර එදින සවස මණ්ඩලීය විධායක නිලධාරීන් හා සැලසුම් අංශයේ ව්‍යාපෘති හා සම්බන්ධව කටයුතු කල නිලධාරීන්ගෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය විමසීමේ රැස්වීමක් IFC ආයතනයේදී පැවැත්වුණි.

තවද, මෙම ව්‍යාපෘතියේ කටයුතු ඇගයීමට අදාලව, ඇගයීම් කමිටුව 2022/11/16 දින ව්‍යාපෘතිය සිදු වූ ගම්පහ දිස්ත්‍රික්කයේ නිරීක්ෂණ චාරිකාවක් සිදු කල අතර ඒ සඳහා, ප්‍රධාන කාර්යාලයේ හා ගම්පහ දිස්ත්‍රික් කාර්යාලයේ නිලධාරීන්, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ දිස්ත්‍රික් නිලධාරීන් හා ගොවීන් සම්බන්ධ විය.
කාලගුණ දර්ශක මත පදනම් වූ රක්ෂණ ක්‍රම සකස් කිරීමට හා රක්ෂණ යෝජනා ක්‍රම මිලකරණය පිලිබඳ පුහුණු වැඩමුළුවක් විදේශ විශේෂඥයින් විසින් 2022/06/21, 2022/16/22 හා 2022/06/23 යන දිනයන් හීදී මාර්ගගත ක්‍රමවේද ඔස්සේ පැවැත්විණි. මේ සඳහා සැලසුම් අංශයේ නිලධාරීන් සම්බන්ධ විය .

IFC ආයතනයේ නිලධාරීන්ගේ ඉල්ලීම පරිදි, මෙම ව්‍යාපෘතිය සිදුවූ ආකාරය පිලිබඳ වාර්තාමය කෙටි චිත්‍රපටියක්, IFC ආයතනයේ නිලධාරීන්ගේ තාක්ෂණික සහය ඇතිව පටිගත කිරීමේ කටයුතු 2022-06-08 හා 2022-09-09 යන දෙදින, කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලීය පරිශ්‍රයේදී හා ආසන්න වී වගා කටයුතු සිදුවන ක්ෂේත්‍රයකදී සිදුවිය. මේ සඳහා සැලසුම් අංශයේ නිලධාරීන් අදහස් දැක්වීමෙන් හා පසුබිම් රූගත කිරීම් සඳහා දායක විය.

- GIZ ව්‍යාපෘතිය යටතේ ERP පද්ධතියක් සකස් කිරීමට අදාල කාර්යය ප්‍රවාහ සටහන් (Workflow) සකස් කිරීම

AIMS හා GIZ ව්‍යාපෘතිය හා සම්බන්ධව ව්‍යාපාර විශ්ලේෂකයෙකු (Business Analyst) වශයෙන් සැලසුම් අංශයේ, නෙත්මි උපේකා නිලධාරිනිය පත් කර ඇති අතර ඇය විසින් එක් එක් අංශයන්හි කාර්යයභාරයන් හා ක්‍රියාවලින් හඳුනාගෙන ඒ අනුව කාර්යය ප්‍රවාහ සටහන් (Workflow) සකස් කිරීමේ කටයුතු ආරම්භ කරන ලදී.

මුදල් අංශය

මූල්‍ය සම්පිණ්ඩනය

2022 වර්ෂය තුල මණ්ඩලයේ කෘෂි රක්ෂණ යෝජනා ක්‍රමය රුපියල් මිලියන 2,319 ක ශුද්ධ ලාභයක් උපයා ගත් අතර, මෙම වර්ෂය තුලදී උපයා ගත් මෙහෙයුම් ලාභය රුපියල් මිලියන 2,663 කි.

2018 අය වැය යෝජනා අනුව අනිවාර්ය රක්ෂණ යෝජනා ක්‍රමය එම භෝග වර්ග හය සඳහා මෙම වර්ෂයේදීද ක්‍රියාත්මක කල අතර, ඒ තුලින් වී, බඩඉරිඟු, ලොකු ළෑණු, අර්තාපල්, සෝයා, මිරිස් යන භෝග සඳහා අක්කරයකට රු. 40,000/- ක උපරිමයකට යටත්ව ආවරණය සැළසීමට කටයුතු කර ඇත.

කන්න කිහිපයක පටන් පැවති අධික නියං තත්වය හා කාලගුණික හා දේශගුණික විපර්යාසයන්ගෙන් සිදුවූ බලපෑම සළකා බලා වර්ෂය තුල ගොවියන්ගෙන් අයකරනු ලබන වාර මුදල ගොවියන්ගෙන් අය නොකර රජය විසින් ලබාදීමට තීරණය කල අතර, එම මුදල රුපියල් මිලියන 1,950 කි.

මීට අමතරව 2022 වර්ෂය තුලදී අතිරේක රක්ෂණ වාරමුදලක් අය කිරීම තුලින් වගාවන්ට සිදුවන සියලු අවධානම් ආවරණය වන පරිදි අවම වාරික මුදල රු. 6,400/- කට යටත්ව අක්කරයකට ලබාදෙන වන්දි මුදල රු. 100,000/- දක්වා වැඩි කිරීමට කටයුතු කර ඇත.

තවද, රටෙහි පවතින ආර්ථික අර්බුදය යටතේ වුවද, 2022 වර්ෂයේදී මණ්ඩලීය අනෙකුත් රක්ෂණ යෝජනා ක්‍රමවල පෙර වර්ෂයට සාපේක්ෂව 5.1% ක වර්ධනයක් අත්පත් කරගෙන ඇත.

2022 වර්ෂය තුල මණ්ඩලයේ අනිවාර්ය වගා රක්ෂණ වන්දි වගකීම රුපියල් මිලියන 698.7 ක් පමණ වී ඇත.

2022 වර්ෂය තුලදී, ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය මගින් ගොවීන් 169,741 ක් සඳහා රුපියල් මිලියන 3,918 ක ශුද්ධ මුදලක් විශ්‍රාම වැටුප් වශයෙන් ගෙවා ඇති අතර, ධීවර විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය තුල ධීවරයින් 5,556 කට රුපියල් මිලියන 78.3 ක මුදලක් විශ්‍රාම වැටුප් වශයෙන් ගෙවන ලදී.

පෙර විසර පහක මූල්‍ය තොරතුරු

ලාභදායීත්වය

- **කෘෂි රක්ෂණ යෝජනා ක්‍රමය**



වර්ෂය	1 2018	2 2019	3 2020	4 2021	5 2022
මෙහෙයුම් ලාභය (රු.මි.)	1,144.7	878	1,401.3	1,752	2,663
ශුද්ධ ලාභය (රු.මි.)	921	652.3	1,153.7	1,494.4	2,319

2022 වර්ෂය තුල කෘෂි රක්ෂණ යෝජනා ක්‍රමය තුලින් රුපියල් මිලියන 2,319 ක ශුද්ධ ලාභයක් උපයාගත් අතර, එය 2021 වර්ෂයට සාපේක්ෂව 55.17% ක වැඩිවීමක් පෙන්නුම් කරයි. මෙම තත්වය සඳහා හේතු සාධක වී ඇත්තේ පෙර වර්ෂයට සාපේක්ෂව රක්ෂණ ආදායම ඉහළ යාමත් වන්දි ගෙවීම් ඇතුළු මෙහෙයුම් වියදම් අඩුවීමත් වේ. මේ අනුව 2021 වර්ෂයේ මුළු රක්ෂණ ආදායම රුපියල් මිලියන 152.6 ක් වූ අතර, එය 2022 වර්ෂයේදී රුපියල් මිලියන 713.2 කි. එය 2021 වර්ෂයට සාපේක්ෂව 367% ක වැඩිවීමකි. මීට අමතරව මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරන තෙවන පාර්ශවීය රක්ෂණ යෝජනා ක්‍රමය තුලින් ඉපයූ ආදායම පෙර වර්ෂයට සාපේක්ෂව ඉහළ ප්‍රගතියක් පෙන්නුම් කල අතර, එමගින් 2022 වර්ෂය තුලදී මණ්ඩලය ඉපයූ ආදායම රුපියල් මිලියන 311 ක් වූ අතර, එය 2021 වර්ෂයට සාපේක්ෂව 4.9% ක වර්ධනයකි

- <u>ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය</u>



	1 2018	2 2019	3 2020	4 2021	5 2022
ආදායම (රු.මී.)	211.9	233.4	209.8	224	276.9
මෙහෙයුම් වියදම (රු.මී.)	3114	3271	4555	3766	3967.9

2022 වර්ෂය තුලදී ගොවීන් 169,741 කට රුපියල් මිලියන 3,918 ක් වූ ශුද්ධ විශ්‍රාම වැටුප් ගෙවීමක් සිදු කර ඇත. මෙම වර්ෂය තුල ගෙවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ මුළු මෙහෙයුම් වියදම රුපියල් මිලියන 3967.9 ක් වූ අතර, පෙර වර්ෂයේ මෙන්ම මෙම වර්ෂය තුලදීද මහා භාණ්ඩාගාරය මගින් විශ්‍රාම වැටුප් ගෙවීම සඳහා ප්‍රතිපාදන වශයෙන් රුපියල් මිලියන 4,158 ක් ලබාදීමට කටයුතු කරන ලදී.

- <u>ධීවර විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය</u>



	1 2018	2 2019	3 2020	4 2021	5 2022
ආදායම	69.7	53	29.6	35.2	102.4
මෙහෙයුම් වියදම	66.1	67.2	115.4	78.7	81.6

2022 වර්ෂය තුලදී රුපියල් මිලියන 78.3 ක මුදලක් විශ්‍රාම වැටුප් වශයෙන් ධීවරයින් වෙත ගෙවා ඇති අතර, ඒ සඳහා මණ්ඩලය සතු අරමුදල් යොදා ගන්නා ලදී.

2022 සම්සේථ යෝජනා ක්‍රම සඳහා ඒකාබද්ධ ගිණුම් ප්‍රකාශන සහ කෘෂි රක්ෂණ යෝජනා ක්‍රමය

කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය
ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනය
මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

		කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය (සමූහය)		කෘෂි රක්ෂණ යෝජනා ක්‍රමය	
		2022.12.31	**2021.12.31**	**2022.12.31**	**2021.12.31**
	සටහන්	රු. ශත.	රු. ශත.	රු. ශත.	රු. ශත.
වත්කම්					
ජංගම නොවන වත්කම්					
දේපළ , පිරියත හා උපකරණ	1	58,734,565.10	52,340,853.15	53,958,364.70	49,701,372.45
		58,734,565.10	52,340,853.15	53,958,364.70	49,701,372.45
කල් පිරීම දක්වා රඳවාගත් ආයෝජන					
භාණ්ඩාගාර බැඳුම්කර		1,562,157,095.25	1,045,073,943.17	522,795,607.14	-
		1,562,157,095.25	1,045,073,943.17	522,795,607.14	-
ජංගම වත්කම්					
තොගය	2.1	35,479,123.85	10,444,427.65	31,718,050.45	8,986,803.01
ලැබිය යුතු දෑ	2.2	176,995,438.57	772,083,675.90	959,808,915.80	1,600,691,389.17
ලැබිය යුතු වාරික	2.3	4,254,814,019.25	2,904,272,630.51	4,252,903,299.25	2,902,448,847.51
තැන්පතු හා පූර්ව ගෙවීම්	2.4	6,075,138.98	5,308,286.19	6,075,138.98	5,308,286.19
අත්තිකාරම්	2.5	668,883.19	742,918.82	668,883.19	742,918.82
කල් පිරීම දක්වා රඳවාගත් මූල්‍ය සාධන පත්‍ර	2.6	5,170,060,616.87	4,414,732,250.04	4,092,320,982.00	3,733,511,529.73
බැංකුවේ ඇති මුදල්	2.7	88,918,256.55	29,912,263.50	84,816,800.47	14,014,103.40
		9,733,011,477.26	8,137,496,452.61	9,428,312,070.14	8,265,703,877.83
මුළු වත්කම්		**11,353,903,137.61**	**9,234,911,248.93**	**10,005,066,041.98**	**8,315,405,250.28**
ස්කන්ධ හා බැරකම්					
ප්‍රාග්ධන හා සංචිත					
භාණ්ඩාගාරය දායක කළ මූලික ප්‍රාග්ධන		50,000,000.00	50,000,000.00	50,000,000.00	50,000,000.00
කෘ.ගො.ර.ම සංචිත අරමුදල (හිඟ)/ අතිරික්ත	3	(84,680,098,305.19)	(82,567,418,019.18)	6,907,682,321.95	4,588,669,420.07
රජයේ ප්‍රධානය - ප්‍රාග්ධන	4	12,128,063.62	17,915,566.53	12,128,063.62	17,915,566.53
කෘ.ගො.ර.ම සංචිත අරමුදල	5	435,124,724.78	301,967,881.11	435,124,724.78	301,967,881.11
මරණ පාරිතෝෂික අරමුදල	6	1,292,310,846.99	1,178,731,261.16	1,258,775,352.29	1,146,766,066.46
කාර්ය මණ්ඩල වෛද්‍ය රක්ෂණ අරමුදල		18,812,989.19	13,572,359.07	18,812,989.19	13,572,359.07
කෙතට අරුණ අනිවාර්ය රක්ෂණ අරමුදල		706,503,600.00	706,503,600.00	706,503,600.00	706,503,600.00
ප්‍රත්‍යාගණන සංචිතය		60,979,166.66	60,979,166.66	58,129,166.66	58,129,166.66
නිෂ්පාදන ප්‍රවර්ධන සහ දිරි දීමනා අරමුදල		31,660,458.10	24,545,950.47	31,660,458.10	24,545,950.47
භාණ්ඩාගාර බැඳුම්කර මත රජයේ ප්‍රදාන		1,081,488,000.00	1,081,488,000.00	-	-
ප්‍රාග්ධන දීමනා GIZ		65,792,099.98	-	65,792,099.98	
		(80,925,298,355.87)	(79,131,714,234.18)	9,544,608,776.57	6,908,070,010.37
ජංගම නොවන බැරකම්					
පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන		61,124,641.91	84,311,918.25	24,842,727.00	30,787,791.93
විශ්‍රාම වැටුප් බැරකම		87,503,204,013.80	82,828,949,558.70	-	-
		87,564,328,655.71	82,913,261,476.95	24,842,727.00	30,787,791.93
ජංගම බැරකම්					
මුද්‍රණ කටයුතු සඳහා ප්‍රතිපාදන		1,742,199.31	2,634,747.38	500,000.00	1,116,614.60
පූර්ව වාරික ලැබීම්	7.1	45,942,713.24	25,831,363.48	45,942,713.24	24,131,012.48
අනෙකුත් ගෙවිය යුතු දෑ	7.2	4,353,136,401.60	4,247,367,978.36	77,645,436.60	175,441,794.01
උපචිත වියදම්	7.3	16,784,421.08	18,544,529.46	14,259,286.03	16,872,639.41
හානිපූරණය සඳහා ප්‍රතිපාදන	7.4	297,267,102.54	1,158,985,387.48	297,267,102.54	1,158,985,387.48
		4,714,872,837.77	5,453,364,006.16	435,614,538.41	1,376,547,447.98
මුළු ස්කන්ධ හා බැරකම්		11,353,903,137.61	9,234,911,248.93	10,005,066,041.98	8,315,405,250.28

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ගේ අවශ්‍යතා හා අනුකූල වේ

.....	.....
මූල්‍ය අංශ ප්‍රධානී	අධ්‍යක්ෂ ජනරාල්

මෙම මූල්‍ය ප්‍රකාශ සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වගකිව යුතු වේ.
අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් අත්සන් තබන ලද්දේ:

.....	.....
අධ්‍යක්ෂ මණ්ඩල සමාජික	අධ්‍යක්ෂ මණ්ඩල සමාජික
කෘෂිකර්ම හා ගොවිජන රක්ෂණ මණ්ඩලය	කෘෂිකර්ම හා ගොවිජන රක්ෂණ මණ්ඩලය

කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය
ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනය
විස්තීරණ ආදායම් ප්‍රකාශනය

		කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය (සමූහය)		කෘෂි රක්ෂණ යෝජනා ක්‍රමය	
		2022.12.31	2021.12.31	2022.12.31	2021.12.31
ආදායම	සටහන්	රු. ශත.	රු. ශත.	රු. ශත.	රු. ශත.
රක්ෂණ වාරික සහ දායක මුදල්	8.1	503,235,295.13	505,227,300.78	390,559,060.16	390,852,447.50
රක්ෂණ වාරික-භාණ්ඩාගාර දායක මුදල		1,950,000,000.00	1,950,000,000.00	1,950,000,000.00	1,950,000,000.00
වන්දි සඳහා ප්‍රදානය- ජා.ර.හා.අ. භෝග බද්ධ		378,504,691.86	963,444,973.83	378,504,691.86	963,444,973.83
පොළී ආදායම	8.2	888,117,028.85	236,492,245.00	713,257,269.63	152,608,628.56
මුළු ආදායම		**3,719,857,015.84**	**3,655,164,519.61**	**3,432,321,021.65**	**3,456,906,049.89**
මෙහෙයුම් වියදම					
වන්දි ගෙවීම්	9.1	(712,325,510.81)	(1,650,202,697.16)	(712,325,510.81)	(1,650,202,697.16)
ප්‍රතිරක්ෂකගෙන් ආපසු අයකරගත හැකි හිමිකම් පෑම		-	-	-	-
මෙහෙයුම් වියදම්	9.2	(72,516,884.47)	(70,062,875.89)	(56,858,637.47)	(54,700,948.89)
විශ්‍රාම වැටුප් ගෙවීම් සහ කොමිස්		(3,997,234,231.00)	(3,794,503,178.00)	-	-
දායක මුදල් ආපසු ගෙවීම සහ ශුද්ධ පොළිය		(17,025,847.42)	(15,023,588.00)	-	-
සමූහ රක්ෂණ වාරිකය		(18,946,560.00)	(19,490,194.20)	-	-
බෙලහීන ප්‍රතිලාභ ගෙවීම		(1,153,362.69)	(1,122,190.00)	-	-
		(4,819,202,396.39)	**(5,550,404,723.25)**	**(769,184,148.28)**	**(1,704,903,646.05)**
මෙහෙයුම් අතිරික්තය/ හිඟය		**(1,099,345,380.55)**	**(1,895,240,203.64)**	**2,663,136,873.37**	**1,752,002,403.84**
විශ්‍රාම වැටුප් ගෙවීම සඳහා රජයේ ප්‍රදානය		3,968,000,000.00	3,753,000,000.00	-	-
පරිපාලන වියදම් සඳහා රජයේ ප්‍රදානය		190,000,000.00	247,000,000.00	-	-
අනෙකුත් ආදායම	10	9,820,857.57	11,136,623.60	6,745,479.27	8,160,201.36
		4,167,820,857.57	**4,011,136,623.60**	**6,745,479.27**	**8,160,201.36**
		3,068,475,477.02	**2,115,896,419.96**	**2,669,882,352.64**	**1,760,162,605.20**
වියදම්					
පරිපාලන වියදම්	11	(417,450,416.91)	(336,085,803.04)	(229,100,719.52)	(184,219,914.26)
මූල්‍ය හා අනෙකුත්	12	(179,615.16)	(111,957.30)	(100,879.17)	(67,630.00)
මුළු වියදම්		**(417,630,032.07)**	**- 336,197,760.34**	**(229,201,598.69)**	**(184,287,544.26)**
ශුද්ධ අතිරික්තය / (හිඟය)		**2,650,845,444.95**	**1,779,698,659.62**	**2,440,680,753.95**	**1,575,875,060.94**
කෘ.ගොා.ර.ම. සංචිත අරමුදල් සඳහා ප්‍රතිපාදනය		(133,156,843.67)	(87,600,120.19)	(133,156,843.67)	(87,600,120.19)
ප්‍රතිපාදනයෙන් පසු ශුද්ධ අතිරික්තය (හිඟය)		**2,517,688,601.28**	**1,692,098,539.43**	**2,307,523,910.28**	**1,488,274,940.75**
වෙනත් විස්තීර්ණ ආදායම					
පාරිතෝෂික ලාභ/ (අලාභ)		37,127,258.25	18,693,910.13	11,488,991.60	6,084,834.57
විශ්‍රාම වැටුප් බැරකමේ වැඩිවීම		(4,674,254,455.10)	(4,411,586,355.01)	-	-
		(4,637,127,196.85)	(4,392,892,444.88)	11,488,991.60	6,084,834.57
විස්තීරණ ආදායමේ ශුද්ධ අතිරික්තය / (හිඟය)		**(2,119,438,595.57)**	**(2,700,793,905.45)**	**2,319,012,901.88**	**1,494,359,775.32**

කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය
ස්කන්ධ වෙනස්වීම් ප්‍රකාශනය
2022 දෙසැම්බර් 31 දිනට

සමූහය

විස්තරය	ප්‍රාග්ධනය සඳහා රජයේ ප්‍රදානය රු.	සමුච්චිත අතිරික්තය / හිඟය රු.	ප්‍රාග්ධන වියදම් සඳහා රජයේ ප්‍රදානය රු.	කෘ.ගොං.ර.ම සංචිත අරමුදල රු.	ගොවි මරණ පාරිතෝෂික අරමුදල රු.	කාර්ය මණ්ඩල වෛද්‍ය රක්ෂණ අරමුදල රු.	කෙකට අරුණ අනිවාර්ය රක්ෂණ අරමුදල රු.	ප්‍රත්‍යාගණන සංචිතය රු.	නිෂ්පාදන ප්‍රවර්ධන සහ දිරි දීමනා අරමුදල රු.	භාණ්ඩාගාර බැඳුම්කර සඳහා රජයේ ප්‍රදානය රු.	ප්‍රාග්ධන ප්‍රාදානය GIZ රු.	එකතුව රු.
2021 ජනවාරි 01 දිනට ශේෂය	**50,000,000**	**(79,866,624,114)**	**3,169,323**	**214,367,761**	**1,108,122,512**	**8,678,452**	**706,503,600**	**60,979,167**	**17,595,272**	**1,081,488,000.00**	-	(76,615,720,027)
පෙර වසර ගැලපීම		17,000										17,000
වර්ෂය තුළ එකතු කිරීම:	-		20,000,000	87,600,120	19,490,194	6,381,447	-	-	14,825,022	-		148,296,784
පොළී ආදායම	-				52,418,185	451,642	-	-	-	-		52,869,827
ක්‍රමක්ෂය- රජයේ ප්‍රදානය	-	-	(5,253,757)	-	-	-	-	-	-	-		(5,253,757)
ප්‍රතිලාභ ගෙවීම	-				(1,299,630)	(1,939,182)	-	-	(7,874,344)			(11,113,156)
COVID – 19 සෞඛ්‍ය සහ සමාජ ආරක්ෂණ අරමුදල									-			-
ශුද්ධ අතිරික්තය /(හිඟය)	-	(2,700,793,905)	-	-	-			-	-	-		(2,700,793,905)
2021 දෙසැම්බර් 31 දිනට ශේෂය	**50,000,000**	**(82,567,401,019)**	**17,915,567**	**301,967,881**	**1,178,731,261**	**13,572,359**	**706,503,600**	**60,979,167**	**24,545,950**	**1,081,488,000**	-	(79,131,697,234)
වර්ෂය තුළ එකතු කිරීම:	-	6,741,310	-	133,156,844	18,946,560	5,503,200		-	15,552,007	-	65,792,100	245,692,020
පොළී ආදායම					95,985,651	1,821,998						97,807,649
ක්‍රමක්ෂය- රජයේ ප්‍රදානය	-	-	(5,787,503)	-	-	-		-				(5,787,503)
ප්‍රතිලාභ ගෙවීම					(1,352,625)	(2,084,568)			(8,437,499)			(11,874,692)
ශුද්ධ අතිරික්තය /(හිඟය)	-	(2,119,438,596)	-	-	-	-						(2,119,438,596)
2022දෙසැම්බර් 31 දිනට ශේෂය	**50,000,000**	**(84,680,098,305)**	**12,128,064**	**435,124,725**	**1,292,310,847**	**18,812,989**	**706,503,600**	**60,979,167**	**31,660,458**	**1,081,488,000**	**65,792,100**	**(80,925,298,356)**

ස්කන්ධ වෙනස්වීම් ප්‍රකාශනය
කෘෂි රක්ෂණ යෝජනා ක්‍රමය

විස්තරය	ප්‍රාග්ධනය සඳහා රජයේ ප්‍රදානය රු.	සමුච්චිත අතිරික්තය / හිඟය රු.	ප්‍රාග්ධන වියදම් සඳහා රජයේ ප්‍රදාන රු.	කෘ.ගොං.ර.ම සංචිත අරමුදල රු.	ගොවි මරණ පාරිතෝෂිකය අරමුදල රු.	කාර්ය මණ්ඩල වෛද්‍ය රක්ෂණ අරමුදල රු.	කෙකට අරුණ අනිවාර්ය රක්ෂණ අරමුදල රු.	ප්‍රත්‍යාගණන සංචිතය රු.	නිෂ්පාදන ප්‍රවර්ධන සහ දිරි දීමනා අරමුදල රු.	භාණ්ඩාගාර බැඳුම්කර සඳහා රජයේ ප්‍රදානය රු.	ප්‍රාග්ධන ප්‍රාදනය GIZ රු.	එකතුව රු.
2021ජනවාරි 01 දිනට ශේෂය	**50,000,000**	**3,094,309,645**	**3,169,323**	**214,367,761**	**1,077,622,157**	**8,678,452**	**706,503,600**	**58,129,167**	**17,595,272**	-	-	**5,230,375,377**
වර්ෂය තුළ එකතු කිරීම:	-		20,000,000	87,600,120	17,737,354	6,381,447	-	-	14,825,022	-	-	146,543,944
පොළී ආදායම	-				52,418,185	451,642	-	-	-	-	-	52,869,827
ක්‍රමක්ෂය- රජයේ ප්‍රදානය	-	-	(5,253,757)	-	-	-	-	-	-	-	-	(5,253,757)
මෝටර් රථ සඳහා මාරු කළ පිරිවැය	-	-	-	-	-	-	-	-	-		-	-
මෝටර් වාහනවල සමුච්චිත ක්ෂය	-	-	-	-	-	-	-	-	-		-	-
නැවත ඇගයීමේ වටිනාකම් මෝටර් රථ ගිණුමට මාරු	-	-	-	-	-	-	-	-	-		-	-
ප්‍රතිලාභ ගෙවීම	-				(1,011,630)	(1,939,182)	-	-	(7,874,344)	-	-	(10,825,156)
COVID – 19 සෞඛ්‍ය සහ සමාජ ආරක්ෂණ අරමුදල											-	-
ශුද්ධ අතිරික්තය /(හිඟය)	-	1,494,359,775	-	-	-			-	-	-	-	1,494,359,775
2021 දෙසැම්බර් 31 දිනට ශේෂය	**50,000,000**	**4,588,669,420**	**17,915,567**	**301,967,881**	**1,146,766,066**	**13,572,359**	**706,503,600**	**58,129,167**	**24,545,950**	-	-	**6,908,070,010**
වර්ෂය තුළ එකතු කිරීම:	-	-	-	133,156,844	17,197,260	5,503,200		-	15,552,007	-	65,792,100	237,201,410
පොළී ආදායම					95,985,651	1,821,998				-		97,807,649
ක්‍රමක්ෂය- ගොවි විශ්‍රාම වැටුප් රජයේ ප්‍රදානය	-	-	(5,787,503)	-	-	-		-		-		(5,787,503)
ප්‍රතිලාභ ගෙවීම					(1,173,625)	(2,084,568)			(8,437,499)	-	-	(11,695,692)
COVID – 19 සෞඛ්‍ය සහ සමාජ ආරක්ෂණ අරමුදල									-		-	-
ශුද්ධ අතිරික්තය /(හිඟය)	-	2,319,012,902	-	-	-	-				-		2,319,012,902
2022 දෙසැම්බර් 31 දිනට ශේෂය	**50,000,000**	**6,907,682,322**	**12,128,064**	**435,124,725**	**1,258,775,352**	**18,812,989**	**706,503,600**	**58,129,167**	**31,660,458**	-	**65,792,100**	**9,544,608,777**

කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය

මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

2022 දෙසැම්බර් 31 දිනට

	කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය (සමූහය)		කෘෂි රක්ෂණ යෝජනා ක්‍රමය	
	2022.12.31	**2021.12.31**	**2022.12.31**	**2021.12.31**
	රු. ශත.	**රු. ශත.**	**රු. ශත.**	**රු. ශත.**
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහ				
ශුද්ධ අතිරික්තය/ (හිඟය)	(2,119,438,595.57)	(2,700,793,905.45)	2,319,012,901.88	1,494,359,775.32
පහත දැ සඳහා ගැලපුම්				
ක්ෂයවීම්	20,284,691.45	19,445,260.75	19,098,611.15	18,437,621.51
ක්‍රමක්ෂය- රජයේ ප්‍රදානය	(5,787,502.91)	(5,253,756.74)	(5,787,502.91)	(5,253,756.74)
පෙර වසර සම්බන්ධයෙන් ගැලපීම්	17,000.00	(1,179,625.30)	-	-
විශ්‍රාම වැටුප් බැරකම	4,674,254,455.10	4,411,586,355.01	-	-
කෘ.ගො.ර.අ. සංචිත අරමුදල සඳහා ප්‍රතිපාදනය	133,156,843.67	87,600,120.19	133,156,843.67	87,600,120.19
පාරිතෝෂික ලාභය/අලාභය	(18,946,560.00)	(19,490,194.20)	(17,197,260.00)	(17,737,354.20)
	(37,127,258.25)	**(18,693,910.13)**	**(11,488,991.60)**	**(6,084,834.57)**
දේපල, පිරියත, උපකරණ බැහැර කිරීම මත ලාභය/ අලාභය	4,765,851,669.06	4,474,014,249.58	117,781,700.31	76,961,796.19
විශ්‍රාමික පාරිතෝෂිකය සඳහා ප්‍රතිපාදන	14,280,736.91	12,233,973.05	5,543,926.64	4,867,170.67
කාරක ප්‍රාග්ධන වෙනස්කම්වලට පෙර මෙහෙයුම් අතිරික්තය	**2,660,693,810.40**	**1,785,454,317.18**	**2,442,338,528.83**	**1,576,188,742.18**
වට්ටෝරු භාණ්ඩවල (වැඩිවීම)/අඩුවීම	(25,034,696.20)	(1,448,055.37)	(22,731,247.44)	(1,433,812.20)
ලැබිය යුතු දෑ (වැඩිවීම)/අඩුවීම	595,088,237.33	(507,180,839.10)	640,882,473.37	(459,001,796.20)
ලැබිය යුතු වාරික (වැඩිවීම)/අඩුවීම	(1,350,541,388.74)	(951,783,493.21)	(1,350,454,451.74)	(952,771,663.21)
තැන්පතු සහ පූර්ව ගෙවීම් (වැඩිවීම)/අඩුවීම	(766,852.79)	615.61	(766,852.79)	615.61
අත්තිකාරම්හි (වැඩිවීම)/අඩුවීම	74,035.63	(71,018.23)	74,035.63	(71,018.23)
හානි පූරණය සඳහා ප්‍රතිපාදන වැඩිවීම/(අඩුවීම)	(861,718,284.94)	583,966,926.16	(861,718,284.94)	583,966,926.16
මුද්‍රණ කටයුතු සඳහා ප්‍රතිපාදන වැඩිවීම/(අඩුවීම)	(892,548.07)	(80,550.08)	(616,614.60)	30,566.64
පූර්ව වාරික අත්තිකාරම් වැඩිවීම/(අඩුවීම)	20,111,349.76	(8,822,083.33)	21,811,700.76	(10,522,434.33)
අනෙකුත් ගෙවිය යුතු දෑ වැඩිවීම/(අඩුවීම)	105,768,423.24	116,430,044.76	(97,796,357.41)	99,933,473.41
උපචිත වියදම් වැඩිවීම/(අඩුවීම)	(1,760,108.38)	(3,149,205.03)	(2,613,353.38)	(647,715.07)
	(1,519,671,833.16)	**(772,137,657.82)**	**(1,673,928,952.54)**	**(740,516,857.42)**
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් උත්පාදිත මුදල්	1,141,021,977.24	1,013,316,659.36	768,409,576.29	835,671,884.76
විශ්‍රාමික පාරිතෝෂිකය - ගෙවන ලද	(340,755.03)	(20,654,472.50)	-	(8,485,827.50)
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහ	**1,140,681,222.21**	**992,662,186.86**	**768,409,576.29**	**827,186,057.26**
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහ				
වෛද්‍ය රක්ෂණ අරමුදල	5,240,630.12	4,893,906.78	5,240,630.12	4,893,906.78
ගොවි මරණ පාරිතෝෂික අරමුදල	132,526,145.83	90,098,943.53	129,206,545.83	86,881,263.53
නිෂ්පාදන ප්‍රවර්ධන සහ දිරි දීමනා අරමුදල	7,114,507.63	6,950,678.43	7,114,507.63	6,950,678.43
වසර තුළ ආයෝජන	(1,278,123,973.97)	(1,099,416,606.22)	(881,605,059.41)	(937,824,430.04)
දේපල, පිරියත සහ උපකරණ මිලයට ගැනීම	(26,678,403.30)	(9,787,217.85)	(23,355,603.30)	(9,334,312.85)
ආයෝජන ක්‍රියාකාරකම් වලින්ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහ	**(1,159,921,093.69)**	**(1,007,260,295.33)**	**(763,398,979.13)**	**(848,432,894.15)**
මූල්‍ය ක්‍රියාකාරකම් වලින්ජනිත වූ මුදල් ප්‍රවාහ				
ප්‍රාග්ධන වියදම් සඳහා රජයේ ප්‍රදාන	-	20,000,000.00	-	20,000,000.00
ප්‍රාග්ධන වියදම් සඳහා ප්‍රදාන	65,792,099.98	-	65,792,099.98	-
නව විශ්‍රාම වැටුප් යෝජනා අරමුදල	6,741,309.56	-	-	-
රජයේ බැඳුම්කර	5,712,455.06	5,214,424.86	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහ	**78,245,864.60**	**25,214,424.86**	**65,792,099.98**	**20,000,000.00**
මුදල් හා මුදලට සමාන දෑ ශුද්ධ වැඩිවීම / (අඩුවීම)	**59,005,993.12**	**10,616,316.39**	**70,802,697.14**	**(1,246,836.89)**
වසර ආරම්භයේදී මුදල් සහ මුදලට සමාන දෑ	**29,912,263.50**	**19,295,947.12**	**14,014,103.40**	**15,260,940.29**
වසර අවසානයේදී මුදල් සහ මුදලට සමාන දෑ	**88,918,256.62**	**29,912,263.51**	**84,816,800.54**	**14,014,103.40**

කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය

කෘෂි රක්ෂණ යෝජනා ක්‍රමය

වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති

1. පොදු ප්‍රතිපත්ති

1.1 වාර්තාකරණ අස්ථිත්වය

කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය (මෙහි මින් මතු "මණ්ඩලය" ලෙස සඳහන් කරනු ලබන) 1999 අංක 20 දරණ පනතෙන් සංස්ථාගත කරන ලද අතර නුගේගොඩ, ගංගොඩවිල, සුභද්‍රාරාම පාරේ අංක 117 දරණ ස්ථානයේ පිහිටා ඇත.

1.2 ප්‍රධාන ක්‍රියාකාරකම් හා මෙහෙයුම්වල ස්වභාවය

කෘෂිකාර්මික සහ උද්‍යාන භෝග සහ ඖෂධීය ශාක, පශු සම්පත්, ධීවර සහ වන විද්‍යාව, කෘෂිකාර්මික උපකරණ සහ මෙවලම් සහ කෘෂිකාර්මික උද්‍යාන විද්‍යාත්මක නිපැයුම් සහ ඖෂධීය ශාක, ධීවර සහ වනාන්තර නිෂ්පාදන ගබඩා කිරීම සහ සංරක්ෂණය ඇතුළුව කෘෂිකාර්මික රක්ෂණයේ මණ්ඩලය මූලිකවම නියැලී සිටියි. එසේම, කෘෂිකාර්මිකයන් සඳහා වෛද්‍ය ප්‍රතිලාභ සැපයීම, සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීම සහ පොහොර රක්ෂණ කටයුතුවල සහ කෘෂිකාර්මිකයන්ට හිමි රථ වාහන සඳහා තෙවන පාර්ශවීය රක්ෂණ ආවරණ සැපයීමේ මණ්ඩලය නිරතව සිටියි. සමාලෝචිත මූල්‍ය වර්ෂය තුළ මණ්ඩලයේ ප්‍රධාන ක්‍රියාකාරකම්වල ස්වභාවයෙහි වෙනසක් සිදු නොවුණි.

1.3 පිළියෙල කිරීමේ පදනම

(අ) අනුකූලතා ප්‍රකාශය

මෙම මූල්‍ය ප්‍රකාශන මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය, විස්තීරණ ආදායම් ප්‍රකාශනය, අරමුදල් සහ සංචිතවල වෙනස්කම් පිළිබඳ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්වලින් සමන්විත වේ. මෙම ගිණුම් ප්‍රකාශන ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (ශ්‍රී.ල.මූ.වා.ප්‍ර/ ශ්‍රී.ල.ගි.ප්‍ර.) ප්‍රකාරව පිළියෙල කර ඇත.

(ආ) ගණනය සඳහා පදනම

අදාළ සටහන් යටතේ සාධාරණ වටිනාකම් සම්බන්ධයෙන් යෝග්‍ය අනාවරණ කරනු ලබන අවස්ථාවන් හැරුණු විට මෙම මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය පදනමින් පිළියෙල කර ඇත.

(ඇ) සන්සන්දනාත්මක තොරතුරු

ප්‍රවර්ථන කාල සීමාවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අවබෝධය ඉහළ නැංවීම පිණිස සහ අන්තර් කාලසීමා සන්සන්දනීයභාවය වැඩිදියුණු කිරීම පිණිස, මූල්‍ය ප්‍රකාශනයන්හි වාර්තා කොට ඇති සියලු මුදල් ප්‍රමාණ සඳහා පෙර කාල සීමාවට අදාළ ප්‍රමාණාත්මක, ආඛ්‍යාන සහ විස්තරාත්මක තොරතුරු ඇතුළු සන්සන්දනාත්මක තොරතුරු හෙළිදරව් කරනු ලැබ ඇත.

මූල්‍ය ප්‍රකාශනයන්හි අයිතමයන් ඉදිරිපත් කිරීම හෝ වර්ගීකරණය සංශෝධනය කරනු ලැබ ඇති විටිදී, වඩා හොඳ ඉදිරිපත් කිරීමක් සැපයීම පිණිස ප්‍රවර්ථන වසර සමග අනුකූල වනසේ සංසන්දනාත්මක මුදල් ප්‍රමාණ ද ප්‍රතිවර්ගීකරණය කර ඇත.

(ඇ) කෘත්‍යාත්මක සහ ඉදිරිපත් කිරීමේ ව්‍යවහාර මුදල් ඒකකය

මෙම මුදල් ප්‍රකාශන මණ්ඩලයේ කෘත්‍යාත්මක සහ ඉදිරිපත් කිරීමේ ව්‍යවහාර මුදල් ඒකකය වන ශ්‍රී ලංකා රුපියල්වලින් ඉදිරිපත්කර ඇත.

(ඉ) තක්සේරු සහ තීරණ භාවිතය

ශ්‍රී.ල.මූ.වා.ප්‍ර /.ශ්‍රී.ල.ගි.ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය වාර්තා සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම, ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ වාර්තා කරනු ලැබූ වත්කම්, බැරකම්, ආදායම් අනුකූලව මූල්‍ය වාර්තා සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම, ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ වාර්තා කරනු ලැබූ වත්කම්, බැරකම්, ආදායම් සහ වියදම් ප්‍රමාණ භාවිතය කෙරෙහි බලපාන්නා වූ තීන්දු, තක්සේරු සහ උපකල්පන සිදුකිරීමට කළමණාකාරීත්වයට නියම කරයි. යොදා ගනු ලැබූ මෙම ඇස්තමේන්තු සහ තීන්දු සැබෑ ප්‍රතිඵලවට වඩා වෙනස්විය හැක.

ඇස්තමේන්තු සහ පාදක උපකල්පන අඛණ්ඩ පදනමකින් සමාලෝචනය කරනු ලැබේ. ගිණුම්කරණ ඇස්තමේන්තු ප්‍රතිශෝධනය කිරීම අදාළ කාලසීමාවට පමණක් බලපාන්නේ නම්, ඒවා පිළිගනු ලබන්නේ එම ඇස්තමේන්තු ප්‍රතිශෝධනය කර ඇති කාලසීමාව තුළ වන අතර ප්‍රවර්ථන හා යම් අනාගත කාලසීමාවන්ට එම ප්‍රතිශෝධනය බලපාන්නේ නම් ප්‍රතිශෝධන කාලසීමා හා අනාගත කාලසීමාවන් සඳහා ද පිළිගනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශනවල පිළිගෙන ඇති ප්‍රමාණ මත වඩාත්ම සැළකිය යුතු බලපෑම් ඇති කරන ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිතා කිරීමේදී තක්සේරු ප්‍රකාශනවල පිළිගෙන ඇති ප්‍රමාණ මත වඩාත්ම සැලකිය යුතු බලපෑම් ඇතිකරන ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිතා කිරීමේදී තක්සේරු අවිනිශ්චිතතා සහ තීරණාත්මක තීන්දු පිළිබඳ සැලකියයුතු ක්ෂේත්‍ර පිළිබඳ තොරතුරු මූල්‍ය ප්‍රකාශනයන්හි සටහන්වල අඩංගු කර ඇත.

ඊ) ප්‍රවර්තන ව්‍යාපාරය (අඛණ්ඩ පැවැත්ම)

ප්‍රවර්ථන ව්‍යාපාරයක් ලෙස අඛණ්ඩව පැවතීමට මණ්ඩලයට ඇති හැකියාව පිළිබඳව කළමනාකාරීත්වය තක්සේරුවක් කර තිබේ. එබැවින්, ප්‍රවර්ථන ව්‍යාපාරයක පදනමින් මූල්‍ය ප්‍රකාශන අඛණ්ඩව පිළියෙල කරනු ලැබේ.

2. වත්කම් හා ඒවායේ තක්සේරු පදනම

2.1 දේපළ, පිරියත හා උපකරණ

(අ) පිළිගැනීම සහ මැනීම

දේපල, පිරියත හා උපකරණ අයිතම ප්‍රකාශ කර ඇත්තේ පිරිවැයට හෝ එකතු වූ ක්ෂය කිරීම් හා හානි අලාභ අඩුකොට සාධාරණ වටිනාකමටය.

සියලු දේපළ, පිරියත සහ උපකරණ මුලින්ම වාර්තා කර ඇත්තේ සමුච්චිත ක්ෂයවීම් හෝ වටිනාකමේ සමුච්චිත හානිවීම් අඩුකර පිරිවැයටය. වත්කමක වැදගත් සංරචක වෙනම හඳුනාගනු ලැබ ක්ෂය කරනු ලැබේ. දේපලක, පිරියතක හෝ උපකරණයක සැලකිය යුතු කොටස් යම් කාල අන්තර තුළ ප්‍රතිස්ථාපනය කරනු ලැබීමට අවශ්‍ය වූ විට, ප්‍රතිස්ථාපිත කොටස පිළිගැනීමෙන් ඉවත් කර නව කොටස එය ආශ්‍රිත ප්‍රයෝජ්‍ය ආයු කාලය සහ ක්ෂයවීම

සහිතව අස්තිත්වය මගින් පිළිගනු ලැබේ. අනෙකුත් සියලු අළුත්වැඩියා සහ නඩත්තු පිරිවැය දරන ලද වියදම් ලෙස ආදායම් ප්‍රකාශයේ පිළිගනු ලැබේ.

රු. 63,480,159.28 ක මුළු ඓතිහාසික පිරිවැයක් සහිත පූර්ණව ක්ෂයකරන ලද වත්කම් දේපළ, පිරියත හා උපකරණවල ඇතුළත් කොට තිබේ.

(ආ) පිරිවැය

දේපල, පිරියත හා උපකරණවල පිරිවැය ඒවායේ මිලදී ගැනීමේ මිලෙන් සහ අදාළ වත්කම එහි අපේක්ෂිත භාවිතය සඳහා වැඩකරන තත්ත්වයට ගෙන ඒම සඳහා වූ කිසියම් සෘජුවම ආරෝපණීය වූ පිරිවැයෙන් සමන්විත වේ.

වත්කම්වල ඉපැයුම් ධාරිතාවය දිගටම පවත්වා ගනු හෝ ඉහළ නැංවීම පිණිස ස්ථීර ස්වභාවයේ වත්කම් අත්කර ගැනීම, ව්‍යාප්ත කිරීම හෝ වැඩි දියුණු කිරීම සඳහා දරණ ලද වියදම් ප්‍රාග්ධන වියදම් ලෙස සලකනු ලැබේ.

ප්‍රධාන පරීක්ෂාකිරීම් ඇතුළුව වෙනම ගිණුම් තබා ඇති දේපළ, පිරියත හෝ උපකරණ අයිතමයක සංරචකයක් ප්‍රතිස්ථාපනය කිරීම සඳහා දරණ ලද වියදම ප්‍රාග්ධනීකරණය කරනු ලැබේ. අනෙකුත් තදනන්තර පිරිවැය ප්‍රාග්ධනීකරණය කරනු ලබන්නේ එම කොටස තුළ අන්තර්ගත අනාගත ආර්ථික ප්‍රතිලාභ සමාගමට ගලා ඒමට හැකියාවක් ඇත්නම් සහ අයිතමයේ පිරිවැය විශ්වසනීය ලෙස මැණිය හැකිනම් පමණි.

(ඇ) ප්‍රත්‍යාගණනය

වත්කමක් ලෙස පිළිගැනීමෙන් පසුව, සාධාරණ වටිනාකම විශ්වසනීය ලෙස මැණිය හැකි ඉඩම් සහ ගොඩනැගිලි, කිසියම් තදනන්තර සමුච්චිත ක්ෂය සහ තදනන්තර සමුච්චිත හානි අලාභ අඩු කොට ප්‍රත්‍යාගණනය සිදුකළ දිනයට ප්‍රත්‍යාගණන වටිනාකමට දක්වා තිබේ. ප්‍රත්‍යාගණනය කරන ලද වත්කමක සාධාරණ වටිනාකම වාර්තාකරණ දිනයේදී එහි ධාරණ වටිනාකමින් ප්‍රමාණාත්මකව වෙනස් නොවන බව සහතික කිරීම පිණිස තක්සේරු කිරීම් සිදුකරනු ලැබේ.

මෝටර් රථ වාහන ප්‍රත්‍යාගණනය කිරීමේදී, ලාභ හෝ අලාභ ප්‍රකාශනයේ හඳුනාගනු ලැබූ එම වත්කමේම කිසියම් පූර්ව අඩුවීමක් හිලව් කරන්නේ නම් හැර ප්‍රත්‍යාගණන වටිනාකමේ කිසියම් වැඩිවීමක් ස්කන්ධයේ ප්‍රත්‍යාගණන සංචිතයට බැර කරනු ලැබේ. වටිනාකමේ අඩුවීමක්, ප්‍රත්‍යාගණන සංචිතයේ කලින් හඳුනාගනු ලැබූ වැඩිවීමක් ඉක්මවා යන විටදී ලාභ හෝ අලාභ ප්‍රකාශනයේ හඳුනාගනු ලැබේ. බැහැර කිරීමේදී, යම් ආශ්‍රි ප්‍රත්‍යාගණන සංචිතයක් ප්‍රත්‍යාගණන සංචිතයෙන් රඳවාගත් ඉපැයුම්වලට මාරුකරනු ලබන අතර බැහැර කිරීම මත ලාභ හෝ අලාභ තීරණය කිරීමේදී ගිණුම්වලට ගනු නොලැබේ.

(ඇ) ක්ෂයවීම්

සරල මාර්ග ක්‍රමය මත පහත දැක්වෙන වාර්ෂික අනුපාතයන්ට එම වත්කම්වල ඇස්තමේන්තුගත ප්‍රයෝජ්‍ය ආයුකාලය තුළ එම ප්‍රමාණ පොත්වලින් ඉවත්කිරීම පිණිස, ක්ෂයවීම් විස්තීරණ ආදායම් ප්‍රකාශනයේ වැය බරක් සේ දක්වනු ලබයි.

ගොඩනැගිලි	4%
රථ වාහන	20%
ලීබඩු සහ සවිකිරීම්	10%
ප්‍රචාරක උපකරණ	10%
හානි වැළැක්වීමේ උපකරණ	10%

අස්වනු කැපීමේ උපකරණ	10%
පාපැදි	20%
මිනින්දෝරු උපකරණ	10%
කිරුම් උපකරණ	10%
සුබසාධන උපකරණ	10%
දුරකථන	20%
පරිගණක	20%
යතුරු පැදි	20%

2.2 අස්පෘශ්‍ය වත්කම්

වත්කමට ආරෝපණය කළ හැකි අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ගලා ඒම අපේක්ෂා කරන්නේ නම් සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති ශ්‍රී.ල.ගි.ප්‍ර. - 38 අස්පෘශ්‍ය වත්කම් ප්‍රකාරව වත්කමේ පිරිවැය විශ්වාසනීය ලෙස මැණිය හැකි නම් අස්පෘශ්‍ය වත්කමක් පිළිගනු ලැබේ. ඒ අනුව මෙම වත්කම් සමුච්චිත ක්‍රමක්ෂය සහ කිසියම් සමුච්චිත හානි අලාභ අඩුකර මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ දක්වනු ලැබේ.

පරිගණක මෘදුකාංග සරල රේඛීය ක්‍රමය මත වසර 5 ක කාල සීමාවක් පුරා ක්‍රමක්ෂය කරනු ලැබේ.

2.3 වට්ටෝරු භාණ්ඩ

වට්ටෝරු භාණ්ඩ ප්‍රකාශ කර ඇත්ත් පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගයන්ගෙන් වඩා අඩු අගයටය. ශුද්ධ උපලබ්ධි කළ අගය යනු, තොගයක් සමාන්‍ය ව්‍යාපාරික කටයුතු වලදී විකිණිය හැකි ඇස්තමේන්තු මිලෙන් එම තොග වැඩි දුරටත් සම්පූර්ණ කිරීමට දැරිය යුතු ඇස්තමේන්තුගත විකුණුම් වියදම් අඩුකළපසු ලැබෙන අගයයි. මෙම පිරිවැයට තොග භාණ්ඩ අත්කර ගැනීමේ සහ ඒවා දැනට තිබෙන ස්ථානයට සහ තත්ත්වයට ගෙන ඒමට දරණ ලද වියදම් ද ඇතුළත්ය.

2.4 මූල්‍ය වත්කම්

ශ්‍රී.ල.ගි.ප්‍ර. 39 හි විෂය පථය තුළ මූල්‍ය වත්කම් ලෙස ලාභ හෝ අලාභ තුලින් පැන නගින සාධාරණ වටිනාකමක් ඇති මූල්‍ය වත්කම්, ණය සහ ලැබිය යුතු දෑ, කල් පිරීම තෙක් රඳවා ගත් ආයෝජන, විකිණීම සඳහා ඇති මූල්‍ය වත්කම් හෝ ඉදිරි රැකුම් සාධන පත්‍ර ලෙස නම් කරනු ලැබූ සාධාරණ වටිනාකමට ඇති ව්‍යුත්පන්න උපකරණ මූල්‍ය වත්කම් ලෙස වර්ගීකරණය කරනු ලැබේ.

මූල්‍ය වත්කම්හි මූලික පිළිගැනීම මත අධ්‍යක්ෂ මණ්ඩලය ඒවායේ වර්ගීකරණය තීරණය කරයි. සියලු මූල්‍ය වත්කම් ආරම්භයේදී සාධාරණ වටිනාකමට, ලාභ හෝ අලාභ තුලින් පැන නගින සාධාරණ වටිනාකමට නොවන අවස්ථාවන්හිදී සෘජුව ආරෝපණීය ගනුදෙනු පිරිවැයටත් පිළිගනු ලැබේ.

මූලිකවම ණය සහ ලැබිය යුතු දෑ සහ තැන්පත් ඒවා ආරම්භ කරනු ලබන දිනයේදී පිළිගනු ලැබේ. අනෙකුත් සියලු මූල්‍ය වත්කම් (ලාභ සහ පාඩු තුලින් පැන නගින සාධාරණ වටිනාකමට නියම කල වත්කම් ඇතුළුව) ආරම්භයේදී පිළිගනු ලබන්නේ සාධන පත්‍රයේ ගිවිසුම් ප්‍රතිපාදනයන්ට මණ්ඩලය පාර්ශවකරුවකු වූ වෙළඳ දිනයටය.

යම් වත්කමකින් මුදල් ප්‍රවාහයන් කෙරෙහි ඇති ගිවිසුම්කර හිමිකම් අවසානවීමේදී හෝ මූල්‍ය වත්කමෙහි හිමිකාරිත්වයේ සියලු අවදානම් සහ පරිදාන සැලකිය යුතු ලෙස පවරනු ලබන විටකදී, ගනුදෙනුවක මූල්‍ය වත්කම් මත ගිවිසුම්කර මුදල් ප්‍රවාහ ලැබීමට ඇති අයිතිය එය පවරන විටදී මණ්ඩලය මූල්‍ය වත්කම පිළිගැනීම ඉවත්

කරනු ලැබේ. පවරනු ලැබූ මූල්‍ය වත්කමක් මණ්ඩලය විසින් නිර්මාණය කරනු ලැබූ හෝ රඳවා ගනු ලැබූ යම් බැඳියාවක්, වෙනම වත්කමක් හෝ බැරකමක් ලෙස පිළිගනු ලැබේ.

මූල්‍ය වත්කම් සහ බැරකම් හිලව් කරනු ලබන අතර මුදල් ප්‍රමාණ හිලව් කිරීමට මණ්ඩලයට නෛතික අයිතිවාසිකමක් ඇති විටකදී සහ ශුද්ධ පදනමක් මත පියවීමට හෝ වත්කම උපලබ්ධිකර වත්කම සමගාමීව පියවීමට අදහස් කරන්නේ නම් පමණක් ශුද්ධ මුදල් ප්‍රමාණ මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ ඉදිරිපත් කරනු ලැබේ.

මණ්ඩලයේ මූල්‍ය වත්කම්වලට මුදල් හා කෙටිකාලීන ආයෝජන සහ වෙළඳ සහ අනෙකුත් ලැබිය යුතු දෑ ඇතුළත් වේ.

(අ) ලාභ හෝ පාඩු තුලින් පැන නගින සාධාරණ වටිනාකමට මූල්‍ය වත්කම්

ලාභ හෝ පාඩු තුලින් පැන නගින සාධාරණ වටිනාකමට මූල්‍ය වත්කම්වලට වෙළඳාම සඳහා රඳවාගෙන සිටිනු ලබන මූල්‍ය වත්කම් සහ ලාභ සහ හෝ පාඩු හරහා සාධාරණ වටිනාකමට මුල් පිළිගැනීම මත නම්කළ මූල්‍ය වත්කම් ඇතුළත් වේ. මූල්‍ය වත්කම් ආසන්න කාලීනව විකිණීමේ හෝ ප්‍රතිමිලදීගැනීමේ කාර්යය සඳහා අත්කරගෙන ඇත්නම් ඒවා වෙළඳාම සඳහා රඳවාගෙන ඇති සේ වර්ගීකරණය කරනු ලැබේ.

ලාභ හෝ පාඩු හරහා සාධාරණ වටිනාකමට මූල්‍ය වත්කම්, විස්තීරණ ආදායම් ප්‍රකාශයේ මූල්‍ය ආදායමට හෝ මූල්‍ය වියදමට පිළිගනු ලැබූ සාධාරණ වටිනාකමේ වෙනස්කම් සහිතව සාධාරණ වටිනාකමට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ දක්වනු ලැබේ.

(ආ)ණය සහ ලැබියයුතු දෑ

ණය සහ ලැබියයුතු දෑ සක්‍රීය වෙළඳපොළක මිල ගණන් ඉදිරිපත් කර නොමැති ස්ථාවර සහ නිශ්චයනීය ගෙවීම් සහිත ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් වේ. මූලික ගණනය කිරීමෙන් පසුව එබඳු මූල්‍ය වත්කම් හානි අඩුකොට සළුල පොළී ක්‍රමවේදය භාවිතා කරමින් තදනන්තරව ක්‍රමක්ෂිත පිරිවැය අනුව ගණනය කරනු ලැබේ. ක්‍රමක්ෂිත පිරිවැය ගණනය කරනු ලබන්නේ අත්කර ගැනීමේදී කිසියම් වට්ටමක් හෝ ආධික්‍යයක් සහ සළුල පොළී ක්‍රමවේදයේ අනුකලක කොටසක් වන ගාස්තු හෝ පිරිවැය සැලකිල්ලට ගනිමිනි. සළුල පොළී ක්‍රමවේද ක්‍රමක්ෂය විස්තීරණ ආදායම් ප්‍රකාශයේ මූල්‍ය ආදායමේ අන්තර්ගත කරනු ලැබේ. හානි හේතුකොට ගෙන ඇතිවන අලාභ මූල්‍ය පිරිවැයේ විස්තීරණ ආදායම් ප්‍රකාශයේ පිළිගනු ලැබේ.

ණය සහ ලැබියයුතු දෑ සමන්විත වනුයේ වෙළඳ ලැබියයුතු දෑ, සේවක ණය, තැන්පතු අත්තිකාරම්, අනෙකුත් ලැබියයුතු දෑ සහ මුදල් සහ මුදලට සමාන දෑ ආදියෙනි.

(ඇ) කල්පිරීම දක්වා රඳවාගනු ලැබූ ආයෝජන

ස්ථාවර සහ නිශ්චයනීය ගෙවීම් සහිත ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් සහ ස්ථාවර කල්පිරීම්, මණ්ඩලයට කල්පිරීම දක්වා රඳවා ගැනීමේ ධනාත්මක අභිප්‍රායක් සහ හැකියාවක් ඇතිවිටදී, කල්පිරීම දක්වා රඳවා ගැනීම ලෙස වර්ගීකරණය කරනු ලැබේ. මූලික මැනීමෙන් පසුව කල්පිරීම දක්වා රඳවාගනු ලැබූ ආයෝජන හානි අඩුකොට සළුල පොළී ක්‍රමවේදය භාවිතා කරමින් ක්‍රමක්ෂිත පිරිවැය අනුව මනිනු ලැබේ. සළුල පොළී ක්‍රමවේද ක්‍රමක්ෂය විස්තීරණ ආදායම් ප්‍රකාශයේ මූල්‍ය ආදායමේ අන්තර්ගත කරනු ලැබේ. හානි හේතු කොට ගෙන ඇතිවන අලාභ මූල්‍ය පිරිවැයේ විස්තීරණ ආදායම් ප්‍රකාශයේ පිළිගනු ලැබේ. සළුල පොළී ක්‍රමවේද ක්‍රමක්ෂය විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ මූල්‍ය ආදායමේ අන්තර්ගත කරනු ලැබේ.

රජයේ සුරැකුම්පත්වල සහ ස්ථාවර තැන්පතුවල ආයෝජන කල්පිරීම දක්වා රඳවාගත් ආයෝජන යටතේ වර්ගීකරණය කර ඇත.

(ඈ) විකිණීම සඳහා ඇති මූල්‍ය ආයෝජන

විකිණීම සඳහා ඇති මූල්‍ය වත්කම් යනු විකුණුම සඳහා ඇති ලෙස නම් කර ඇති හෝ ඉහත සඳහන් කවර හෝ මූල්‍ය වත්කම් කාණ්ඩයකට වර්ගීකරණය කර නොමැති ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් වේ. මූලික පිළිගැනීමට පසුව, ඒවා සාධාරණ වටිනාකමට ගණනය කරනු ලබන අතර හානි අලාභ හැර එහි වෙනස්කම් අනෙකුත් විස්තීර්ණ ආදායමේ පිළිගනු ලබන අතර, අරමුදල් සහ සංචිතවල වෙන්කර ඇති සාධාරණ වටිනාකමේ ඉදිරිපත් කරනු ලැබේ. විකිණීම සඳහා ඇති ණය සුරැකුම් මත පොළී ආදායම සඵල පොළී ක්‍රමවේදය භාවිතා කරමින් ගණනය කරනු ලබන අතර ලාභයෙහි හෝ අලාභයෙහි පිළිගනු ලැබේ. ආයෝජනයක් පිළිගැනීම ඉවත් කළ විට, අරමුදල් සහ සංචිතවල එකතුවූ ලාභය හෝ පාඩුව ලාභ හෝ අලාභවල ප්‍රතිවර්ගීකරණය කරනු ලැබේ.

මූලික පිළිගැනුම මත විකිණීම සඳහා ඇති මූල්‍ය අයෝජනයක් ලෙස මණ්ඩලය කවර හෝ මූල්‍ය වත්කමක් නම් කර නොමැත.

2.5 මූල්‍ය වත්කම් හානිවීම

සෑම වාර්තාකරණ දිනයකදීම මූල්‍ය වත්කමක් හෝ මූල්‍ය වත්කම් සමූහයක් හානිවීමේ වාස්තවික සාක්ෂි ඇත්දැයි සමාගම තක්සේරු කරන අතර එවැනි හානිවීමක් සිදුව ඇත්නම්, වත්කමේ ධාරණ අගය සහ ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහයේ වත්මන් වටිනාකම අතර වෙනස ලබා ගැනීම මගින් හානියේ ප්‍රමාණය ගණනය කරනු ලැබේ.

3. බැරකම් සහ ප්‍රතිපාදන

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය මත ජංගම බැරකම් ලෙස වර්ගීකරණය කර ඇති බැරකම් වනුයේ ඉල්ලුම මත හෝ වාර්තාකරණ දිනයේ සිට වසරක් තුළ ගෙවීමට නියමිතව ඇති දේය. ජංගම නොවන බැරකම් වනුයේ වාර්තාකරණ දිනයේ සිට වසරකට පසුව ගෙවීමට නියමිත ශේෂ වේ.

මෙම මූල්‍ය වාර්තා සකස් කිරීමේදී, දන්නා සියලු බැරකම් සඳහා හේතු දක්වා ඇත. අතීත සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස මණ්ඩලයට නෛතික හෝ සම්මුතික බැඳීමක් ඇති විටදී සහ බැඳීම නිරාකරණය සඳහා ආර්ථික ප්‍රතිලාභ පිටතට ගලායාමටත් අවශ්‍ය කරනු ලැබීමට ඉඩ ඇති විටදී ප්‍රතිපාදන සහ බැරකම් පිළිගනු ලැබේ.

3.1 හිමිකම් පෑම් සඳහා ප්‍රතිපාදන

ගෙවීමට ඇති ඉල්ලුම් කර ඇති මුදල් සඳහා බැරකම, භෝගයේ අවදානම් සාධක සහ රක්ෂිතයාගේ විෂය කරුණු මත පදනම්ව හඳුනාගනු ලැබේ. 2022 මූල්‍ය වසර සඳහා වන්දි ප්‍රතිපාදනය පහත වගුවෙන් පෙන්නුම් කෙරේ.

රක්ෂිත විෂයය	**හානිපූරණ සඳහා ප්‍රතිපාදන(රු.)**
කෙතට අරුණ	239,273,691.00
පශු සම්පත්	5,000,000.00
සුවසෙත සහ කෘෂි උපකරණ	6,000,000.00
අතිරේක භෝග	2,020,400.00

චංචල දේපළ	44,973,011.54
	297,267,102.54

තෙවන පාර්ශවීය රක්ෂණ වන්දි සඳහා ප්‍රතිපාදන

තෙවන පාර්ශවීය ප්‍රතිපාදනය හඳුනාගනු ලබන්නේ අනුගාමී වසර තුනක ආදායමින් 15% ක හරිත සාමාන්‍ය අනුපාතයටය. එම 15% අනුපාතයෙන් පිළිවෙලින් 7% ක්, 5% ක් සහ 3% ක් වත්මන් වසරේ ආදායම, පෙර වසරේ ආදායම සහ පෙර වසරට පෙර වසරේ ආදායම සඳහා සමානුපාතිකව වෙන් කරනු ලැබේ.

3.2 බොල් ණය සඳහා ප්‍රතිපාදන

අඩමාන ණය සඳහා ප්‍රතිපාදන ලෙස මුළු කාර්යය මණ්ඩල ණයෙන් 5% ක ප්‍රතිපාදනයක් සලසා ඇත.

3.3 විශ්‍රාම ප්‍රතිලාභ

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති - 19 'විශ්‍රාමික ප්‍රතිලාභ පිරිවැය' අනුකූල වන පරිදි සියලු ස්ථීර සේවකයන් සඳහා සේවයේ පළමු වසර සම්පූරණ කිරීමේ සිට විශ්‍රාමික පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන සලසා ඇත. කෙසේ වෙතත්, 1983 අංක 12 දරණ පාරිතෝෂික ගෙවීම් පනත සමග සේවකයකු සඳහා වන වගකීම ඇති වනුයේ පස් වසරක අඛණ්ඩ සේවා කාලයක් සම්පූර්ණ කිරීමේදී පමණි. බැරකම් සඳහා බාහිරින් අරමුදල් සපයනු නොලැබේ.

3.4 ප්‍රාග්ධන බැඳීම් සහ අසම්භාව්‍ය බැරකම්

අසම්භාව්‍ය බැරකම් වනුයේ, ආර්ථික ප්‍රතිලාභ පැවරුම සිදු වීමට ඉඩක් නොමැති හෝ විශ්වාසනීය ලෙස මිණීමට නොහැකි අවස්ථාවන්හිදී අවිනිශ්චිත අනාගත සිදුවීම් හෝ වත්මන් බැඳීම් මගින් පමණක් පැවැත්ම තහවුරු කරන භාව්‍ය බැඳීම් වේ.

මණ්ඩලයේ ප්‍රාග්ධන වෙන්කිරීම් සහ අසම්භාව්‍ය බැරකම් මූල්‍ය ප්‍රකාශනයන්හි අදාළ සටහන්වල හෙළිදරව් කර ඇත.

4. විස්තීර්ණ ආදායම් ප්‍රකාශය

4.1 ආදායම

1. මණ්ඩලයේ ආදායම රක්ෂණ වාරික, භාණ්ඩාගාර බිල්පත්වලින් සහ සේවක ණය සඳහා පොළී ආදායම සහ අනෙකුත් විවිධ ආදායම් නියෝජනය කරයි .
2. සියලුම ආදායම් උපචිත පදනමකින් පිළිගනු ලැබ ඇත.
3. ගොවීන් වෙනුවෙන් සහනාධාරයක් ලෙස රක්ෂණ වාරික රජයෙන් ලැබී ඇත.
4. ප්‍රාග්ධන වියදම් සඳහා ලැබුණු රජයේ ප්‍රදාන ක්‍රමික පදනමක් මත ආදායම ලෙස පිළිගෙන ඇත.

4.2 ආදායම් පිළිගැනීම

1. රක්ෂණ වාරික ආදායම රක්ෂිතයේ කාලය මත පදනම්ව පිළිගනු ලැබේ .
2. ඉහත ආදායම උපචිත පදනමකින් වන අතර ආශ්‍රිත වියදම් සමග ගලපනු ලැබේ.
3. උපචිත ආදායම කාල පදනමකින් උපචිත වේ .

4.3 රජයේ ප්‍රදාන සඳහා ගිණුම්කරණය

මණ්ඩලය දරණ ලද වියදම් වෙනුවෙන් ඊට ගෙවනු ලබන ප්‍රදාන එම වියදම් හඳුනාගනු ලැබූ කාල සීමාව තුළ ආදායම් ලෙස විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ පිළිගනු ලැබේ. වත්කමක පිරිවැය වෙනුවෙන් මණ්ඩලයට ගෙවනු ලබන ප්‍රදාන ආශ්‍රිත වත්කමේ ප්‍රයෝජ්‍ය ආයු කාලය පුරා ක්‍රමික පදනමකින් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ පිළිගනු ලැබේ.

4.4 වියදම

දරණ ලද පිරිවැය සහ නිශ්චිත වියදම් අයිතම ඉපැයුම අතර සෘජු සම්බන්ධතාවයේ පදනම මත විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ වියදම් පිළිගනු ලැබේ. මණ්ඩලය පවත්වාගෙන යාම සහ ප්‍රාග්ධන වත්කම් කාර්යක්ෂම තත්වයෙන් පවත්වාගෙන යාම සඳහා දරණ ලද සියලු වියදම්, වසර සඳහා අතිරික්තය සකස් කිරීමේදී ආදායමට බැර කර ඇත.

අංක 401/4 2008.10.15 දරණ අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාව මගින් පහත දැක්වෙන අනුපාත මත වෙන්කරනු ලැබූ මණ්ඩලයේ වක්‍ර වියදම්

වියදම	**අනුපාත**
වැටුප්, සේ.අ.අ, සේ.භා.අ	50%
වෛද්‍ය වියදම්	50%
උපදේශන ගාස්තු	60%
සුබසාධනය	50%
නිල ඇඳුම්	50%
සංග්‍රහ	60%
මුද්‍රණ	60%
නෛතික ගාස්තු	40%
අධ්‍යක්ෂ මණ්ඩල දීමනා	60%
කුලී	55%
දුරකථන	55%
තැපැල් ගාස්තු	40%
විදුලි	55%
ගමන්, අතිකාල	50%
ජල බිල්පත්	55%
දෛනික වේතන	50%

ආරක්ෂක කටයුතු	75%
ප්‍රධාන කාර්යාලීය උපකරණ	75%
වාහන නඩත්තුව	57%
පරිගණක වියදම්	75%
ඉන්ධන වියදම්	68%
ලිපි ද්‍රව්‍ය	50%
ගොඩනැගිලි නඩත්තුව	55%
ප්‍රචාරය සහ පුහුණුව	80%

4.5 අතිරික්තය

සියලු බැරකම්, බොල් සහ අඩමාන ණය සහ දේපළ, පිරියත සහ උපකරණ ක්ෂයවීම සඳහා ප්‍රතිපාදන වෙන්කිරීමෙන් පසුව අතිරික්තය ගණනය කරනු ලැබේ .

4.6 සංචිත අරමුදල

හදිසි අවස්ථා සංචිත අරමුදලක් 2002 වසරේදී පිහිටවූ අතර ප්‍රතිපත්තිය වනුයේ මෙහෙයුම් අතිරික්තයෙන් 5% ක් සැපයීමයි.

4.7 පූර්ව -වාරික

නියමිත කාලයට පෙර ලැබුනේ නම් පශු සම්පත් සහ අනිවාර්ය රක්ෂණය සඳහා රක්ෂණ වාරික ලදුපත් පූර්ව වාරික සේ සලකනු ලැබේ.

5. මුදල් ප්‍රවාහ ප්‍රකාශය

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 07 ප්‍රකාරව මුදල් ප්‍රවාහ ප්‍රකාශය ඉදිරිපත් කර ඇත්තේ ‘‘වක්‍ර ක්‍රමය ’’යොදා ගනිමිනි.

6. වාර්තාකරණ දිනයෙන් පසු සිදුවීම්

වාර්තාකරණ දිනයෙන් පසු සිදුවීම් වනුයේ, වාර්තාකරණ දිනය සහ මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම සඳහා බලය පවරනු ලැබූ දිනය අතර සිදුවන වාසිදායක හෝ අවාසිදායක සිදුවීම් වේ. වාර්තාකරණ දිනයෙන් පසු සියලු ප්‍රමාණාත්මක සිදුවීම් සලකා බලනු ලැබ ඇති අතර යෝග්‍ය තැන්හිදී, මූල්‍ය ප්‍රකාශනයන්හි අදාළ සටහන්වල ගැලපීම් හෝ අනාවරණ සිදුකර ඇත.

7. සම්බන්ධිත පාර්ශව ගනුදෙනු

ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය හා ධීවර විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය කෘෂිකාර්මික රක්ෂණ යෝජනා ක්‍රමයේ සම්බන්ධිත පාර්ශව ලෙස සලකනු ලැබේ. සම්බන්ධිත පාර්ශව සමග සිදුකළ මෙම ගනුදෙනු සාධාරණ වටිනාකම මත පදනම්ව හෙළි කරනු ලැබේ. කෘෂිකාර්මික රක්ෂණ යෝජනා ක්‍රමය ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට රු. 295,230,441.79 ක් වූ ණයක් ප්‍රදානය කොට ඇත.

8. පෙර වසරේ ගැලපුම්

වාර්තාකරණ කාලපරිච්ඡේදය තුළ පෙර වසර සඳහා ගැලපුම් නොමැත.

9. අවිනිශ්චිත අවස්ථා

නඩු 72 ක් විමර්ශනය කර ඇති අතර එම නඩුවල වත්මන් තත්ත්වය පහත වගුවේ දක්වා ඇත.

කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයෙහි නීතිමය නඩු වල වත්මන් තත්ත්වය

	අධිකරණය	නඩු අංකය	පැමිණිලිකරු / වග උත්තර කරු	නඩු නිමිත්ත	වර්තමාන තත්ත්වය
1	අභියාචනා අධිකරණය	CA(writ) 269/2019 01	සෙලින්කෝ සමාගම එදිරිව මණ්ඩලය	කෘෂිකාර්මිකයන් නොවන පාර්ශවයන් සඳහා තෙවන පාර්ශව රක්ෂණ ඔප්පු නිකුත් කිරීම සම්බන්ධව	ඊලඟ පියවර සඳහා
2	සේවක වන්දි අධිකරණය අනුරාධපුර	WC/NF/1149/2019 01	එම්.එම්. සෙනෙවිරත්න බණ්ඩා මයා එදිරිව මණ්ඩලය	රාජකාරි කටයුතු අතර සිදු වූ රිය අනතුරක් සඳහා අය විය යුතු යැයි කියනු ලබන රක්ෂණ මුදල ලබා ගැනීම සඳහා මණ්ඩලයට එරෙහිව ගොනු කර අති පැමිණිල්ල	නඩුව විභාග වෙමින් පවතී.
3	අනුරාධපුර මහා අධිකරනය	HC/233 & HC/234 02	සදගෝමි මහේෂිකා මිය එදිරිව පොලීසිය	සැකසීම රක්ෂණ මුදල් වංචා කිරීම සහ කූට ලේඛණ	නඩුව විභාග වෙමින් පවතී.
4	අනුරාධපුර මහෙස්ත්‍රාත් අධිකරණය	B/2171/2002 01	පොලීසිය එදිරිව කේ.ඒ. හීන්බණ්ඩාර	ගොවි විශ්‍රාම වැටුප් වාර මුදල් වංචා කිරීම	2005 සිට තබා ඇත
5	අනුරාධපුර මහෙස්ත්‍රාත් අධිකරණය	B/520/2013 01	පොලීසිය එදිරිව කේ.ජී. සුදත් බණ්ඩාර මයා	මණ්ඩලයට ලැබිය යුතු මුදල් වංචාව	නඩුව විභාග වෙමින් පවතී.
6	කොළඹ මහා අධිකරණය	3/8/2 මා.අ /2006 01	පොලීසිය එදිරිව මණ්ඩලය	මාච්ල්ආරු වගාවට වන්දි	නඩුව නීතිපති දෙපාර්තමේන්තුවට යොමුකර ඇත
7	දිසා අධිකරණය (දිවයින පුරා)	65	හානියට හිමිකම් කියන්නන් (පැමිණිලිනරු) එදිරිව මණ්ඩලය	තෙවන පාර්ශවිය රක්ෂණ යටතේ හානි හිමිකම	නඩුව විභාග වෙමින් පවතී.

කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය
ගිණුම් සඳහා සටහන්

සටහන 1 - ජංගම නොවන වත්කම්
දේපළ,පිරියත හා උපකරණ

සමූහය රු.

වත්කම්	2022.01.01 දිනට පිරිවැය	බැහැර කිරීම	පිරිවැය එකතු කිරීම	2022.12.31 දිනට පිරිවැය	2022.01.01 දිනට සමුච්චිත ක්ෂයවීම	බැහැර කිරීම	වර්ෂය සඳහා ක්ෂයවීම	2022.12.31 දිනට සමුච්චිත ක්ෂයවීම	2022.12.31 දිනට ලියාහළ අගය
ලී බඩු සහ සවිකිරීම්	15,566,292.81	-	1,198,745.00	16,765,037.81	11,248,154.06	-	727,980.24	11,976,134.30	4,788,903.51
කාර්යාල උපකරණ	15,293,056.98	-	3,060,886.00	18,353,942.98	12,431,087.61	-	493,147.51	12,924,235.12	5,429,707.86
රථ වාහන	70,869,310.00	-	2,732,785.75	73,602,095.75	42,488,310.17	-	14,479,546.54	56,967,856.71	16,634,239.04
සුඛසාධන උපකරණ	751,196.25	-	9,250.00	760,446.25	587,704.65	-	33,606.41	621,311.06	139,135.19
පරිගණක උපකරණ	52,346,475.91	-	19,513,900.00	71,860,375.91	42,158,607.03	-	4,102,553.23	46,261,160.26	25,599,215.65
පරිගණක මෘදුකාංග	1,475,000.00	-	-	1,475,000.00	1,475,000.00	-	-	-	-
දුරකථන	1,510,807.50	-	-	1,510,807.50	1,510,807.50	-	-	1,510,807.50	-
යතුරු පැදි	146,300.00	-	-	146,300.00	146,300.00	-	-	146,300.00	-
ගොඩනැගිලි	11,349,842.73	-	- 521,063.45	10,828,779.28	5,223,682.26	-	354,257.90	5,577,940.16	5,250,839.12
වායු සමීකරණ යන්ත්‍ර	1,051,272.74	-	-	1,051,272.74	846,721.74	-	61,181.00	907,902.74	143,370.00
ප්‍රවාරක උපකරණ	2,422,836.43	-	683,900.00	3,106,736.43	2,336,558.08	-	25,233.62	2,361,791.70	744,944.73
පාපැදි	146,864.20	-	-	146,864.20	135,469.20	-	7,185.00	142,654.20	4,210.00
අස්වනු කැපීමේ උපකරණ	60,371.00	-	-	60,371.00	60,371.00	-	-	60,371.00	-
හානි වැලැක්වීමේ උපකරණ	41,280.00	-	-	41,280.00	41,280.00	-	-	41,280.00	-
මිනින්දෝරු උපකරණ	4,099.00	-	-	4,099.00	4,099.00	-	-	4,099.00	-
කිරුම් උපකරණ	1,036.35	-	-	1,036.35	1,036.35	-	-	1,036.35	-
නොරාඩ් උපකරණ	344,423.50	-	-	344,423.50	344,423.50	-	-	344,423.50	-
	173,380,465.39	**-**	**26,678,403.30**	**200,058,868.70**	**121,039,612.15**	**-**	**20,284,691.45**	**139,849,303.60**	**58,734,565.10**

සටහන

දේපළ, පිරියත හා උපකරණවලට 2022 දෙසැම්බර් 31 දිනට තවමත් භාවිතයේ පවතින රු .63,840,159.25ක දළ වටිනාකමක් සහිත පූර්ණව ක්ෂය කරන ලද වත්කම් ඇතුළත් වේ .

කෘෂි රක්ෂණ යෝජනා ක්‍රමය

වත්කම්	2022.01.01 දිනට පිරිවැය	බැහැර කිරීම	පිරිවැය එකතු කිරීම	2022.12.31 දිනට පිරිවැය	2022.01.01 දිනට සමුච්චිත ක්ෂයවීම	බැහැර කිරීම	වර්ෂය සඳහා ක්ෂයවීම	2022.12.31 දිනට සමුච්චිත ක්ෂයවීම	2022.12.31 දිනට ලියාහළ අගය
ලී බඩු සහ සවිකිරීම්	14,074,236.36	-	1,198,745.00	15,272,981.36	10,074,374.52	-	653,170.64	10,727,545.16	4,545,436.20
කාර්යාල උපකරණ	13,392,528.89	-	3,060,886.00	16,453,414.89	10,710,724.48	-	466,665.23	11,177,389.71	5,276,025.18
රථ වාහන	68,019,310.00	-	2,732,785.75	70,752,095.75	40,778,310.17	-	13,909,546.54	54,687,856.71	16,064,239.04
සුඛසාධන උපකරණ	717,020.50	-	9,250.00	726,270.50	561,583.98	-	32,554.41	594,138.39	132,132.11
පරිගණක උපකරණ	28,013,773.94	-	16,191,100.00	44,204,873.94	18,614,337.81	-	3,649,997.81	22,264,335.62	21,940,538.32
පරිගණක මෘදුකාංග	-	-	-	-	-	-	-	-	-
දුරකථන	1,510,807.50	-	-	1,510,807.50	1,510,807.50	-	-	1,510,807.50	-
යතුරු පැදි	146,300.00	-	-	146,300.00	146,300.00	-	-	146,300.00	-
ගොඩනැගිලි	11,349,842.73	-	- 521,063.45	10,828,779.28	5,223,682.26	-	354,257.90	5,577,940.16	5,250,839.12
වායු සමීකරණ යන්ත්‍ර	-	-	-	-	-	-	-	-	-
ප්‍රවාරක උපකරණ	1,999,999.29	-	683,900.00	2,683,899.29	1,913,720.94	-	25,233.62	1,938,954.56	744,944.73
පාපැදි	146,864.20	-	-	146,864.20	135,469.20	-	7,185.00	142,654.20	4,210.00
අස්වනු කැපීමේ උපකරණ	60,371.00	-	-	60,371.00	60,371.00	-	-	60,371.00	-
හානි වැලැක්වීමේ උපකරණ	41,280.00	-	-	41,280.00	41,280.00	-	-	41,280.00	-
මිනින්දෝරු උපකරණ	4,099.00	-	-	4,099.00	4,099.00	-	-	4,099.00	-
කිරුම් උපකරණ	1,036.35	-	-	1,036.35	1,036.35	-	-	1,036.35	-
නොරාඩ් උපකරණ	344,423.50	-	-	344,423.50	344,423.50	-	-	344,423.50	-
	139,821,893.25	**-**	**23,355,603.30**	**163,177,496.56**	**90,120,520.71**	**-**	**19,098,611.15**	**109,219,131.86**	**53,958,364.70**

සටහන

දේපළ, පිරියත හා උපකරණවලට 2022 දෙසැම්බර් 31 දිනට තවමත් භාවිතයේ පවතින රු .33,415,830.24ක දළ වටිනාකමක් සහිත පූර්ණව ක්ෂය කරන ලද වත්කම් ඇතුළත් වේ .

ගිණුම් සඳහා සටහන්

	කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය (සමූහය)		කෘෂි රක්ෂණ යෝජනා ක්‍රමය	
	2022.12.31	**2021.12.31**	**2022.12.31**	**2021.12.31**
	රු. ශත.	රු. ශත.	රු. ශත.	රු. ශත.
සටහන 2- ජංගම වත්කම්				
සටහන 2.1 - තොග				
මුද්‍රණ ද්‍රව්‍ය	29,323,332.11	9,722,238.14	26,387,060.46	8,337,125.06
ලිපි ද්‍රව්‍ය	6,155,791.74	722,189.51	5,330,989.99	649,677.95
	35,479,123.85	**10,444,427.65**	**31,718,050.45**	**8,986,803.01**
	-			
සටහන 2.2 ලැබිය යුතු දෑ				
කාර්ය මණ්ඩල ණය හා අත්තිකාරම්	39,953,302.53	33,267,306.29	39,953,302.53	33,267,306.29
යතුරු පැදි ණය	738,106.11	1,304,772.61	738,106.11	1,304,772.61
ලැබිය යුතු වැටුප්	171,011.38	171,011.38	171,011.38	171,011.38
කාර්ය මණ්ඩල විශේෂ ණය - 2004	4,800.00	4,800.00	4,800.00	4,800.00
විවිධ ණයගැතියෝ	758,961.95	738,521.95	71,982.75	51,542.75
ස.තො.ස ආයතනයෙන් ලැබිය යුතු මුද	256,520.00	256,520.00	256,520.00	256,520.00
කෘෂිකර්ම අමාත්‍යාංශය -කෘෂි පාලන ම	-	2,618,608.52	-	2,618,608.52
ජා.ර.හා.අ. භෝග බද්ද	90,000,000.00	693,000,000.00	90,000,000.00	693,000,000.00
යතුරු පැදි වියදම් (කාර්ය මණ්ඩලය)	2,566.70	2,566.70	2,566.70	2,566.70
අදාළ පාර්ශවයන් විසින් ගෙවිය යුතු	-	-	830,608,291.45	866,002,153.47
බොල් ණයගැතියෝ සඳහා ප්‍රතිපාදන	(1,997,665.12)	(1,663,365.32)	(1,997,665.12)	(1,663,365.32)
FAO වෙතින් ලැබිය යුතු මුදල්	-	5,675,472.77	-	5,675,472.77
මරණ පාරිතෝෂිතය	5,000.00	50,000.00	-	-
තැපැල් දෙපාර්තමේන්තුවෙන් ලැබිය	47,102,835.00	36,657,461.00	-	-
	176,995,438.57	**772,083,675.90**	**959,808,915.80**	**1,600,691,389.17**
සටහන 2.2 ලැබිය යුතු දෑ				
අදාළ පාර්ශවයන් විසින් ගෙවිය යුතු				
ලැබිය යුතු ජීවිත රක්ෂණ වාරික	-	-	279,420,377.40	263,396,742.40
ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය (පර	-	-	-	-
ධීවර විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය (පරි	-	-	62,893,599.67	55,164,714.52
ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය (ප්‍ර	-	-	4,133,861.40	1,409,499.70
ගොවි විශ්‍රාම වැටුප් අත්තිකාරම	-	-	484,160,452.98	546,031,196.85
			830,608,291.45	**866,002,153.47**
සටහන 2.3 ලැබිය යුතු වාරික				
	-	-	-	-
අතිරේක බෝග	1,778,080.25	784,121.00	1,778,080.25	784,121.00
පශු සම්පත්	572,677.00	1,757,504.51	572,677.00	1,757,504.51
වංචල දේපල	92,250.00	72,250.00	92,250.00	72,250.00
සුවසෙත හා පුද්ගලික	841,140.00	215,820.00	841,140.00	215,820.00
රක්ෂණ වාරිකය- භාණ්ඩාගාර දායකත්ව	4,249,619,152.00	2,899,619,152.00	4,249,619,152.00	2,899,619,152.00
විශ්‍රාම වැටුප් සඳහා ගොවීන්ගේ දායක	1,910,720.00	1,823,783.00	-	-
	4,254,814,019.25	**2,904,272,630.51**	**4,252,903,299.25**	**2,902,448,847.51**
සටහන 2.4 - තැන්පතු හා පූර්ව ගෙවීම්				
තැන්පතු - (ඉන්ධන)	150,000.00	150,000.00	150,000.00	150,000.00
තැන්පතු - (ප්‍රවාහන)	5,000.00	5,000.00	5,000.00	5,000.00
රක්ෂණය	707,466.98	680,614.19	707,466.98	680,614.19
කුලිය	5,212,672.00	4,472,672.00	5,212,672.00	4,472,672.00
	6,075,138.98	**5,308,286.19**	**6,075,138.98**	**5,308,286.19**

කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය

ගිණුම් සඳහා සටහන්

	කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය (සමූහය)		කෘෂි රක්ෂණ යෝජනා ක්‍රමය	
	2022.12.31	**2021.12.31**	**2022.12.31**	**2021.12.31**
	රු. ශත.	රු. ශත.	රු. ශත.	රු. ශත.
සටහන 2.5 - අත්තිකාරම්				
ගමන් වියදම් අත්තිකාරම්	8,000.00	8,000.00	8,000.00	8,000.00
ඉන්ධන අත්තිකාරම්	20,119.65	47,445.65	20,119.65	47,445.65
වැටුප් අත්තිකාරම්	50,261.41	50,261.41	50,261.41	50,261.41
විවිධ අත්තිකාරම්	11,035.00	26,035.00	11,035.00	26,035.00
ප්‍රාග්ධන අත්තිකාරම්	565,800.00	565,800.00	565,800.00	565,800.00
දිස්ත්‍රික් පරිපාලන ගිණුම	205.63	205.63	205.63	205.63
පශු රක්ෂණ අත්තිකාරම්	13,461.50	45,171.13	13,461.50	45,171.13
	668,883.19	**742,918.82**	**668,883.19**	**742,918.82**
සටහන 2.6 - කල්පිරීම් දක්වා රඳවාගත් මූල්‍ය සාධන පත්‍ර				
භාණ්ඩාගාර බිල්පත්	278,520,632.82	3,592,073,552.49	225,625,993.34	2,910,852,832.18
ස්ථාවර තැන්පතු- මහජන බැංකුව	3,985,116,592.53	175,585,142.48	3,511,320,495.76	175,585,142.48
ස්ථාවර තැන්පතු- ලංකා බැංකුව	822,396,282.59	581,585,068.49	271,347,383.97	581,585,068.49
ස්ථාවර තැන්පතු- ප්‍රාදේශීය සංවර්ධන බැංකුව	84,027,108.93	65,488,486.58	84,027,108.93	65,488,486.58
	5,170,060,616.87	**4,414,732,250.04**	**4,092,320,982.00**	**3,733,511,529.73**
සටහන 2.7 - බැංකුවේ ඇති මුදල්				
ලංකා බැංකු ගිණුම - 164811	961,203.69	578,021.24	961,203.69	578,021.24
ලංකා බැංකු ගිණුම - 164667	921,068.75	199,551.47	921,068.75	199,551.47
ලංකා බැංකු ගිණුම -164693	1,950,794.69	1,218,296.30	1,950,794.69	1,218,296.30
ලංකා බැංකු ගිණුම -1622	1,685,892.37	1,370,524.62	1,685,892.37	1,370,524.62
ලංකා බැංකු ගිණුම -1616	66,410,916.50	618,216.52	66,410,916.50	618,216.52
ලංකා බැංකු ගිණුම -8600879	2,293,613.17	237,791.30	2,293,613.17	237,791.30
ලංකා බැංකු ගිණුම -8600818	25,944.93	25,944.93	25,944.93	25,944.93
ලංකා බැංකු ගිණුම - 164790	118,692.76	13,501.35	-	-
ලංකා බැංකු ගිණුම - 164795	513,051.48	731,681.91	-	-
ලංකා බැංකු ගිණුම -8403704	44,373.50	41,323.50	-	-
ලංකා බැංකු ගිණුම -87144457	32,900.00	200,000.00	-	-
ලංකා බැංකු ගිණුම -87649201	282,701.00	369,755.00	-	-
මහජන බැංකු ගිණුම -112352	890,625.24	648,573.42	890,625.24	648,573.42
මහජන බැංකු ගිණුම -112343	1,277,095.78	400,664.82	1,277,095.78	400,664.82
මහජන බැංකු ගිණුම -100440112349	1,228,556.00	74,505.69	-	74,505.69
මහජන බැංකු ගිණුම -100260112349	53,040.00	53,040.00	53,040.00	53,040.00
මහජන බැංකු ගිණුම -100350112349	283,459.77	96,452.92	283,459.77	96,452.92
මහජන බැංකු ගිණුම -100170112349	855,982.67	742,241.77	855,982.67	742,241.77
මහජන බැංකු ගිණුම -335100190008791	3,205,901.88	1,623,529.89	3,205,901.88	1,623,529.89
මහජන බැංකු ගිණුම -335100280008791	1,537,683.98	659,021.68	1,537,683.98	659,021.68
මහජන බැංකු ගිණුම -100530112349	82,208.00	82,208.00	82,208.00	82,208.00
මහජන බැංකු ගිණුම -335100190112349	474,426.81	67,475.81	474,426.81	67,475.81
මහජන බැංකු ගිණුම -100180112344	720,210.25	336,241.52	-	-
මහජන බැංකු ගිණුම -100150112345	481,006.21	570,835.96	-	-
මහජන බැංකු ගිණුම -100110112347	209,323.84	12,643,055.36	-	-
මහජන බැංකු ගිණුම -100130112351	334,317.26	701,116.47	-	-
මහජන බැංකු ගිණුම -100370008791	67,466.78	157,997.03	-	-
ප්‍රාදේශීය සංවර්ධන බැංකු ගිණුම - 134010103277	1,471,942.24	5,318,043.02	1,471,942.24	5,318,043.02
රැස් කිරීමේ ගිණුම්	503,857.00	132,652.00	435,000.00	-
	88,918,256.55	**29,912,263.50**	**84,816,800.47**	**14,014,103.40**

ගිණුම් සඳහා සටහන්

	කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය (සමූහය)		කෘෂි රක්ෂණ යෝජනා ක්‍රමය	
	2022.12.31	**2021.12.31**	**2022.12.31**	**2021.12.31**
	රු. ශත.	රු. ශත.	රු. ශත.	රු. ශත.
සටහන 3 - කෘ.ගො.ර.ම. සමුච්චිත අතිරික්තය				
ජනවාරි 01 දිනට ශේෂය	(82,567,418,019.18)	(79,865,444,488.43)	4,588,669,420.07	3,094,309,644.75
පෙර වසර ගැලපීම	17,000.00	(1,179,625.30)	-	-
ගැළපුම් ශේෂය	**(82,567,401,019.18)**	**(79,866,624,113.73)**	**4,588,669,420.07**	**3,094,309,644.75**
එකතු කළා:				
නව ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය	6,741,309.56	-	-	-
වසර සඳහා අතිරික්තය (හිඟය)	(2,119,438,595.57)	(2,700,793,905.45)	2,319,012,901.88	1,494,359,775.32
දෙසැම්බර් 31 දිනට ශේෂය	**(84,680,098,305.19)**	**(82,567,418,019.18)**	**6,907,682,321.95**	**4,588,669,420.07**

සටහන 4 - රජයේ ප්‍රදානය - ප්‍රාග්ධනය

ප්‍රාග්ධනය සඳහා රජයේ ප්‍රදානය				
ජනවාරි 01 දිනට ශේෂය	17,915,566.53	3,169,323.27	17,915,566.53	3,169,323.27
එකතු කළා:				
වසර සඳහා ප්‍රදානය - මහ භාණ්ඩාගාරය	-	20,000,000.00		20,000,000.00
අඩු කළා:				
රජයේ ප්‍රදානය ක්‍රමක්ෂය	(5,787,502.91)	(5,253,756.74)	(5,787,502.91)	(5,253,756.74)
දේපල, පිරියත හා උපකරණවල පිරිවැය ඒවායේ මිලදී ගැනීමේ මිලෙන් සහ අදාළ වත්කම එහි අපේක්ෂිත භාවිතය සඳහා වැඩකරන තත්ත්වයට ගෙනඒම සඳහාවූ කිසියම් සෘජුවම ආරෝපණීය වූ පිරිවැයෙන් සමන්විත වේ.

වත්කම්වල ඉපැයුම් ධාරිතාවය දිගටම පවත්වා ගනු හෝ ඉහළ නැංවීම පිණිස ස්ථීර ස්වභාවයේ වත්කම් අත්කර ගැනීම, ව්‍යාප්ත කිරීම හෝ වැඩි දියුණු කිරීම සඳහා දරන ලද තදනන්තර වියදම ප්‍රාග්ධන වියදම් ලෙස සලකනු ලැබේ.

ප්‍රධාන පරීක්ෂාකිරීම් ඇතුළුව වෙනම ගිණුම් තබා ඇති දේපල, පිරියත හෝ උපකරණ අයිතමයක් ප්‍රතිස්ථාපනය කිරීම සඳහා දරන ලද වියදම ප්‍රාග්ධනීකරණය කරනු ලැබේ. අනෙකුත් තදනන්තර පිරිවැය ප්‍රාග්ධනීකරණය කරනු ලබන්නේ එම කොටස තුළ අන්තර්ගත අනාගත ආර්ථික ප්‍රතිලාභ සමාගමට ගලාඒමට හැකියාවක් ඇත්නම් සහ අයිතමයේ පිරිවැය විශ්වසනීය ලෙස මැණිය හැකිනම් පමණි.

(ඇ) ක්ෂයවීම්

සරල මාර්ග ක්‍රමය මත පහත දැක්වෙන වාර්ෂික අනුපාතයන්ට එම වත්කම්වල ඇස්තමේන්තුගත ප්‍රයෝජ්‍ය ආයුකාලය තුළ එම ප්‍රමාණ පොත්වලින් ඉවත්කිරීම පිණිස, ක්ෂයවීම් විස්තිරණ ආදායම් ප්‍රකාශයේ වැයබරක් සේ දක්වනු ලබයි.

කාර්යාල උපකරණ	10%
ලී බඩු සහ සවිකිරීම්	10%
සුබසාධන උපකරණ	10%
පරිගණක	20%

2.2 අස්පෘශ්‍ය වත්කම්

වත්කමට ආරෝපණය කළ හැකි අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ගලා ඒමේ තත්වයක් තිබෙනම් සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති ශ්‍රී.ල.ගි.ප්‍ර. -38 අස්පෘශ්‍ය වත්කම් ප්‍රකාරව වත්කමේ පිරිවැය විශ්වාසනීය ලෙස මිණිය හැකි නම් අස්පෘශ්‍ය වත්කමක් පිළිගනු ලැබේ. ඒ අනුව මෙම වත්කම් සමුච්චිත ක්‍රමක්ෂය සහ කිසියම් සමුච්චිත හානි ආලාභ අඩුකර මූල්‍ය ප්‍රකාශනවල දක්වනු ලැබේ.

පරිගණක මෘදුකාංග සරලරේඛීය ක්‍රමය මත වසර 5 ක කාලා සීමාවක් පුරා ක්‍රමක්ෂය කරනු ලැබේ.

2.3 වට්ටෝරු භාණ්ඩ

වට්ටෝරු භාණ්ඩ ප්‍රකාශ කර ඇත්තේ වඩා අඩු පිරිවැයට සහ ශුද්ධ උපලබ්ධි කළ අගයටය. ශුද්ධ උපලබ්ධිකළ අගය යනු සාමාන්‍ය ව්‍යාපාරික කටයුතුවලදී ඇස්තමේන්තුගත සම්පූර්ණ කිරීමේ සහ විකුණුම් වියදම් අඩුකිරීමෙන් පසු ඇස්තමේන්තුගත විකුණුම් මිලය. මෙම පිරිවැයට තොග හා භාණ්ඩ අත්කරගැනීමේ සහ ඒවා දැනට තිබෙන ස්ථානයට ගෙන ඒමට දරන ලද වියදමද ඇතුලත්ය.

2.4 මූල්‍ය වත්කම්

ශ්‍රී.ල.ගි.ප්‍ර. 39 හි විෂය පථය තුළ මූල්‍ය වත්කම් යෝග්‍ය පරිදි ලාභය හෝ පාඩුව, ණය සහ ලැබිය යුතු දෑ, කල් පිරීම තෙක් රඳවා ගත් ආයෝජන, විකිණීම සඳහා ඇති මූල්‍ය වත්කම් හෝ ඉදිරි රැකුම් සාධන පත්‍ර ලෙස නම් කරනු ලැබූ ව්‍යුත්පන්න හරහා සාධාරණ වටිනාකමට මූල්‍ය වත්කම් ලෙස වර්ගීකරණය කරනු ලැබේ.

සිය මූල්‍ය වත්කම්හි මූලික පිළිගැන්ම මත අධ්‍යක්ෂ මණ්ඩලය ඒවායේ වර්ගීකරණය තීරණය කරයි.

සියලු මුල්‍ය වත්කම් ආරම්භයේදී සාධාරණ වටිනාකම ධන ලෙසත් ලාභහෝ පාඩු මගින් වත්කම් සාධාරණ වටිනාකමට නොවන අවස්ථාවන්හිදී සෘජුව ආරෝපණීය ගනුදෙනු පිරිවැයටත් ආරම්භයේදී පිළිගනු ලැබේ.

ණය සහ ලැබිය යුතු දෑ සහ තැන්පත් ආරම්භයේදී ඒවා ආරම්භ කරනු ලබන දිනයේදී පිළිගනු ලැබේ. අනෙකුත් සියලු මූල්‍ය වත්කම් (ලාභ සහ පාඩු හරහා සාධාරණ වටිනාකමට නිමිත කළ වත්කම් ඇතුළුව) ආරම්භයේදී පිළිගනු ලබන්නේ සාධන පත්‍රයේ ගිවිසුම් ප්‍රතිපාදනයන්ට මණ්ඩලය පාර්ශවකරුවකු වූ වෙළඳ දිනයටය.

යම් වත්කමකින් මුදල් ප්‍රවාහයන් කෙරෙහි ඇති ගිවිසුම්කර හිමිකම් අවසානවීම්දී හෝ මූල්‍ය වත්කමක හිමිකාරිත්වයේ සියලු අවදානම් සහ පරිදාන සැළකියයුතු ලෙස පවරනු ලබන විටකදී ගනුදෙනුවක මූල්‍ය වත්කම් මත ගිවිසුම්කර මුදල් ප්‍රවාහ ලැබීමට ඇති අයිතිය එය පවරන විටදී මණ්ඩය මූල්‍ය වත්කම පිළිගැනීම ඉවත්කරනු ලැබේ. පවරනු ලැබූ මූල්‍ය වත්කමක මණ්ඩලය විසින් නිර්මාණය කරනු ලැබූ හෝ රඳවාගනු ලැබූ යම් බැදියාවක් වෙනම වත්කමක් හෝ බැරකමක් ලෙස පිළිගනු ලැබේ.

මූල්‍ය වත්කම් සහ බැරකම් හිලව් කරනු ලබන අතර මුදල් ප්‍රමාණ හිලව් කිරීමට මණ්ඩලයට නෛතික අයිතිවාසිකමක් ඇතිවිටකදී සහ ශුද්ධ පදනමක් මත පියවීමට හෝ වත්කම උපලබ්ධිකර බැරකම සමගාමීව පියවීමට අදහස් කරන්නේ නම් පමණක් ශුද්ධ මුදල් ප්‍රමාණය මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ ඉදිරිපත් කරනු ලැබේ.

මණ්ඩලයේ මූල්‍ය වත්කම්වලට මුදල් සහ කෙටිකාලීන ආයෝජන සහ වෙළඳ සහ අනෙකුත් ලැබිය යුතු දෑ ඇතුලත් වේ .

(අ) ලාභ හෝ පාඩු හරහා සාධාරණ වටිනාකමට මූල්‍ය වත්කම්

ලාභ හෝ පාඩු හරහා සාධාරණ වටිනාකමට මූල්‍ය වත්කම්වලට වෙළඳහා සඳහා රඳවා ගෙන සිටිනු ලබන මූල්‍ය වත්කම් සහ ලාභ හෝ පාඩු හරහා සාධාරණ වටිනාකමට මුල් පිළිගැනීම මත නම් කළ මූල්‍ය වත්කම් ඇතුළත් වේ. මූල්‍ය වත්කම් ආසන්න කාලීනව විකිණීමේ හෝ ප්‍රතිමිලදී ගැනීමේ කාර්යය සඳහා අත්කර ගෙන ඇත්නම්, ඒවා වෙළඳාම සඳහා රඳවාගෙන ඇති සේ වර්ගීකරණය කරනු ලැබේ.

ලාභ හෝ පාඩු හරහා සාධාරණ වටිනාකමට මූල්‍ය වත්කම්, විස්තිරණ ආදායම් ප්‍රකාශයේ මූල්‍ය ආදායමට හෝ මූල්‍ය වියදමට පිළිගනු ලැබූ සාධාරණ වටිනාකමේ වෙනස්කම් සහිතව සාධාරණ වටිනාකමට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ දක්වනු ලැබේ.

(ආ) ණය සහ ලැබිය යුතු මුදල්

ණය සහ ලැබිය යුතු දෑ සක්‍රීය වෙළඳපොලක මිල ගණන් ඉදිරිපත් කර නොමැති ස්ථාවර සහ නිශ්චයනීය ගෙවීම් සහිත ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් වේ. මූලික ගණනය කිරීමෙන් පසුව එබඳු මූල්‍ය හානි අඩුකොට සඵල පොළී ක්‍රමවේදය භාවිතාකරමින් තදනන්තරව ක්‍රමක්ෂිත පිරිවැය අනුව ගණනය කරනු ලැබේ. ක්‍රමක්ෂිත පිරිවැය ගණනය කරනු ලබන්නේ අත්කරගැනීමේදී කිසියම් වට්ටමක් හෝ ආධික්‍යයක් සහ සඵල පොළී අනුපාතයේ අනුකලක කොටසක්වන ගාස්තු හෝ පිරිවැය සැලකිල්ලට ගනිමිනි.සඵල පොළී අනුපාත ක්‍රමක්ෂය විස්තීර්ණ අදායම් ප්‍රකාශනයේ මූල්‍ය ආදායමේ අන්තර්ගත කරනු ලැබේ . හානිවීම් හේතු කොට ගෙන ඇතිවන අලාභ මූල්‍ය පිරිවැයේ විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ පිළිගනු ලැබේ.

ණය සහ ලැබිය යුතු දෑ සමන්විත වනුයේ වෙළඳ ලැබිය යුතු දෑ, සේවක ණය, තැන්පතු, අත්තිකාරම්, අනෙකුත් ලැබුය යුතු දෑ සම මුදල් සහ මුදලට සමාන දෑ ආදියෙනි.

(ඇ) කල්පිරීම දක්වා රඳවාගනු ලැබූ ආයෝජන

සථාවර සහ නිශ්චයනීය ගෙවීම් සහිත ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් සහ ස්ථාවර කල්පිරීම් මණ්ඩලටයට කල්පිරීම දක්වා රඳවා ගැනීමේ ධනාත්මක අභිප්‍රායක් සහ හැකියාවක් ඇතිවිටදී ඒවා කල්පිරීම දක්වා රඳවා ගැනීම සේ වර්ගීකරණය කරනු ලැබේ. මූලික ගණනය කිරීමෙන් පසුව කල්පිරීම දක්වා රඳවාගනු ලැබූ ආයෝජන හානි අඩුකොට සඵල පොළී ක්‍රමවේදය භාවිතා කරමින් තදනන්තරව ක්‍රමක්ෂිත පිරිවැය අනුව ගණනය කරනු ලැබේ. සඵල පොළී ක්‍රමවේද ක්‍රමක්ෂය විස්තීර්ණ අදායම් ප්‍රකාශයේ මූල්‍ය ආදායමේ අන්තර්ගත කරනු ලැබේ. හානි හේතු කොට ගෙන ඇතිවන අලාභ මූල්‍ය පිරිවැයේ විස්තීර්ණ අදායම් ප්‍රකාශයේ පිළිගනු ලැබේ

රජයේ සුරැකුම්පත් සහ ස්ථාවර තැන්පතුවල අයෝජන, කල්පිරීම දක්වා රඳවාගනු ලැබූ ආයෝජන යටතේ වර්ගීකරණය කර තිබේ.

(ඈ) විකිණීම සඳහා ඇති මූල්‍ය ආයෝජන

විකිණීම සඳහා ඇති මූල්‍ය වත්කම් යනු විකුණුම සඳහා ඇති ලෙස නම් කර ඇති හෝ ඉහත සඳහන් කවර හෝ මූල්‍ය වත්කම් කාණ්ඩයකට වර්ගීකරණය කර නොමැති ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් වේ .මූලික පිළිගැනීමට පසුව ,ඒවා සාධාරණ වටිනාකමට ගණනය කරනු ලබන අතර හානි අලාභ හැර එහි වෙනස්කම් අනෙකුත් විස්තීර්ණ ආදායමේ පිළිගනු ලබන අතර අරමුදල් සහ සංචිතවල වෙන්කර ඇති සාධාරණ වටිනාකමේ ඉදිරිපත් කරනු ලැබේ .විකිණීම සඳහා ඇති ණය සුරැකුම් මත පොළී ආදායම සඵල පොළී අනුපාතය භාවිතා කරමින් ගණනය කරනු ලබන අතර ලාභයෙහි හෝ අලාභයෙහි පිළිගනු ලැබේ .ආයෝජනයක් පිළිගැනීම ඉවත් කළ විට ,අරමුදල් සහ සංචිතවල එකතුවූ ලාභය හෝ පාඩුව ලාභ හෝ අලාභවල ප්‍රතිවර්ගීකරණය කරනු ලැබේ.

මූලික පිළිගැනුම මත විකිණීම සඳහා ඇති මූල්‍ය අයෝජනයක් ලෙස මණ්ඩලය කවර හෝ මූල්‍ය වත්කමක් නම් කර නොමැත.

2.5.1 මූල්‍ය වත්කම් හානි

සෑම වාර්තාකරණ දිනයකදීම මූල්‍ය වත්කමක් හෝ මූල්‍ය වත්කම් සමූහයක් හානිවීමේ වාස්තවික සාක්ෂි ඇත්දැයි මණ්ඩලය තක්සේරු කරයන අතර එවැනි හානිවීමක් සිදුව ඇත්නම්, වත්කමේ ධාරණ අගය සහ ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහයේ වත්මන් වටිනාකම අතර වෙනස ලබා ගැනීම මගින් හානියේ ප්‍රමාණය ගණනය කරනු ලැබේ .

3. බැරකම් සහ ප්‍රතිපාදන

මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය මත ජංගම බැරකම් ලෙස වර්ගීකරණය කර ඇති බැරකම් වනුයේ ඉල්ලුම මත හෝ වාර්තාකරණ දිනයේ සිට වසරක් තුළ ගෙවීමට නියමිතව ඇති දේය. ජංගම නොවන බැරකම් වනුයේ වාර්තාකරණ දිනයේ සිට වසරකට පසුව ගෙවීමට නියමිත ශේෂ වේ .

මෙම මූල්‍ය වාර්තා සකස් කිරීමේදී, දන්නා සියලු බැරකම් සඳහා හේතු දක්වා ඇත .අතීත සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස මණ්ඩලයට නෛතික හෝ සම්මුතික බැඳීමක් ඇති විටදී සහ බැඳීම නිරාකරණය සඳහා ආර්ථික ප්‍රතිලාභ පිටතට ගලායාමත් අවශ්‍ය කරනු ලැබීමට ඉඩ ඇති විටදී ප්‍රතිපාදන සහ බැරකම් පිළිගනු ලැබේ .

3.1 විශ්‍රාම ප්‍රතිලාභ

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 19 ‘විශ්‍රාමික ප්‍රතිලාභ පිරිවැය’ අනුකූල වන පරිදි සියලු ස්ථිර සේවකයන් සඳහා සේවයේ පළමු වසර සම්පූරණ කිරීමේ සිට විශ්‍රාමික පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන සලසා ඇත . කෙසේවෙතත්, 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනත සමග සේවකයකු සඳහා වන වගකීම ඇති වනුයේ පස් වසරක අඛණ්ඩ සේවා කාලයක් සම්පූර්ණ කිරීමේදී පමණි. බැරකම් සඳහා බාහිරින් අරමුදල් සපයනු නොලැබේ.

3.2 ප්‍රාග්ධන වෙන්කිරීම් සහ අසම්භාව්‍ය බැරකම්

අසම්භාව්‍ය බැරකම් වනුයේ ආර්ථික ප්‍රතිලාභ පැවරුම සිදු වීමට ඉඩක් නොමැති හෝ විශ්වාසනීය ලෙස මිණීමට නොහැකි අවස්ථාවන්හිදී අවිනිශ්චිත අනාගත සිදුවීම් හෝ වත්මන් බැඳීම් මගින් පමණක් පැවැත්ම තහවුරු කරන භව්‍ය බැඳීම් වේ .

මණ්ඩලයේ ප්‍රාග්ධන වෙන්කිරීම් සහ අසම්භාව්‍ය බැරකම් මූල්‍ය ප්‍රකාශනයන්හි අදාළ සටහන්වල හෙළිදරව් කර ඇත.

3.3 ධීවර විශ්‍රාම අරමුදලේ බැරකම්

ධීවර විශ්‍රාම අරමුදලේ බැරකම් 2007 දී සිදුකරන ලද ආයුගණක ගණනය කිරීම මත වත්මන් වටිනාකම පාදකව මූල්‍ය ප්‍රකාශනයන්හි ගිණුම් ගත කර ඇත.

4. විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය

4.1 ආදායම

අ) මණ්ඩලයේ ආදායම රක්ෂණ වාරික, භාණ්ඩාගාර බිල්පත්වලින් සහ සේවක ණය සඳහා පොළී ආදායම සහ අනෙකුත් විවිධ ආදායම් නියෝජනය කරයි.

ආ) වාරික එකතු කිරීමෙන් ලත් සියලු ආදායම් මුදල් පදනමකින් පිළිගනු ලැබේ.

4.2 ආදායම පිළිගැනීම

අ) විශ්‍රාම වැටුප් වාරික ආදායම බඳවා ගන්නා අවස්ථාවේදී පිළිගනු ලැබේ .

ආ) ඉහත ආදායම උපචිත පදනමකින් වන අතර අදාළ වියදම් සමග ගලපනු ලැබේ.

ඇ) පොළී ආදායම කාල පදනමකින් උපචිත වේ .

4.3 රජයේ ප්‍රදාන සඳහා ගිණුම්කරණය

දරන ලද වියදම් වෙනුවෙන් මණ්ඩලයට ගෙවනු ලබන ප්‍රදාන එම වියදම් පිළිගනු ලැබූ කාල සීමාව තුළ ආදායම් ලෙස විස්තීර්ණ ආදායමේ පිළිගනු ලැබේ. වත්කමක පිරිවැය සඳහා මණ්ඩලයට ගෙවනු ලබන ප්‍රදාන ආශ්‍රිත වත්කමේ ප්‍රයෝජ්‍ය ආයු කාලය පුරා ක්‍රමික පදනමකින් විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ පිළිගනු ලැබේ.

4.4 වියදම

ධීවර විශ්‍රාම වැටුප් සහ රක්ෂණ යෝජනා ක්‍රමයේ ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීමේදී සහ ප්‍රාග්ධන වත්කම් කාර්යක්ෂම තත්ත්වයකින් පවත්වා ගෙන යාමේදී දරන ලද සියලු වියදම් වර්ෂය සහා අතිරික්තය හෝ හිඟය තීරණය කිරීසම්දී උපචිත පදනමකින් ආදායමට වැය බරක් සේ දක්වා ඇත.

අංක 401/4 – 2008.10.15 දරන අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාව මගින් පහත දැක්වෙන අනුපාත මත වෙන්කරනු ලැබූ මණ්ඩලයේ වක්‍ර වියදම් පහත දැක්වෙන පරිදි වේ.

වියදම	අනුපාත
කුලීදුරකථන ,	5%
තැපැල් ගාස්තු, ජල ගාස්තු	5%

විදුලිය	5%
ප්‍රධාන කාර්යාල උපකරණ	5%
ගොඩනැගිලි නඩත්තුව	5%
වාහන නඩත්තුව	3%
ඉන්ධන	2%
ලිපි ද්‍රව්‍ය	2%
නිල ඇඳුම්	2%
ආරක්ෂක	5%
පරිගණක වියදම්	5%

5. මුදල් ප්‍රවාහ ප්‍රකාශය

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 07 ප්‍රකාරව මුදල් ප්‍රවාහ ප්‍රකාශය ඉදිරිපත් කර ඇත්තේ ‘‘වක්‍ර ක්‍රමය ’’යොදා ගනිමිනි.

6. වාර්තාකරණ දිනයෙන් පසු සිදුවීම්

වාර්තාකරණ දිනයෙන් පසු සිදුවන සිදුවීම්වල ප්‍රමාණවත් බව සලකා බලා ඇති අතර අවශ්‍ය තැන්හිදී ගිණුම්වල යෝග්‍ය ගැලපීම් සිදුකර ඇත.

7. සම්බන්ධිත පාර්ශව ගනුදෙනු

ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය හා කෘෂිකාර්මික රක්ෂණ යෝජනා ක්‍රමය, ධීවර විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ සම්බන්ධිත පාර්ශව ලෙස සලකනු ලැබේ. මෙම සම්බන්ධිත පාර්ශව සමග සිදුකළ ගනුදෙනු සාධාරණ වටිනාකම මත පදනම්ව හෙළිදරව් කරනු ලැබේ. ධීවර විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට රු. 518,000,000 ක ණයක් ලබා දී ඇත.

8. පෙර වසරේ ගැලපුම්

පෙර වසරේ ගැලපුම් විස්තරය පහත පරිදි වේ.

ගෙවිය යුතු නීති ගාස්තු සඳහා පෙර වසර ගැලපුම රු. 17,000/-

9. අවිනිශ්චිත අවස්ථා

ලැබිය යුතු පොළී

1996 දී භාණ්ඩාගාර බිල්පත් මත ආයෝජනය මත පොළී අහිමිවීම සම්බන්ධයෙන් මණ්ඩලය ලංකා බැංකුවට එරෙහිව කොළඹ දිසා අධිකරණයේ නඩුවක් පවරා ඇත.

විස්තර පහත පරිදිය.

නඩු අංකය	මුදල (රු.)
MR 21843	1,454,670.84
MR 21844	1,172,602.46
MR 21845	2,784,657.55

කෘෂි රක්ෂණ මණ්ඩලය 1996 දී ලංකා බැංකුවේ භාණ්ඩාලාර බිල්පත්වල ආයෝජනය කිරීම මඟින් පොළිය සම්බන්ධයෙන් ඇති වූ පාඩුව පිළිබඳව එම බැංකුවට එරෙහිව කොළඹ දිසා අධිකරණයේ නඩුවක් පවරා ඇත.

පැමිණිල්ලේ ආඥියාවනා අනුව දිසා විනිසුරුවරයා තීන්දුව ලබා දී ඇති අතර පෙත්සම්වල සඳහන් නොවූ අතිරේක සහන ලබා දීම ප්‍රතික්ෂේප කළේය. එබැවින් කෘ.ගො.ර.ම. අධ්‍යක්ෂ මණ්ඩල තීන්දුව ලබා ගනිමින් දිස්ත්‍රික් අධිකරණ තීන්දුවට එරෙහිව අභියාවනයක් ඉදිරිපත් කර ඇත.

කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය
ධීවර විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය
2022 දෙසැම්බර් 31 දිනට
<u>ගිණුම් සඳහා සටහන්</u>

<u>සටහන -01</u>

වත්කම	**2022** ජනවාරි **1** දිනට පිරිවැය	ඉවත් කිරීම්	එකතු කිරීම්	**2022** දෙසැම්බර් **31** දිනට පිරිවැය	**2022** ජනවාරි **01** දිනට සමුච්චිත ක්ෂය	ඉවත් කිරීම්	වසර සඳහා ක්ෂය	මුළු ක්ෂයවීම	ශුද්ධ පොත් වටිනාකම **2022.12.31**
කාර්යාල උපකරණ	528,648.50		-	528,648.50	447,928.96		14,792.00	462,720.96	65,927.54
සුඛසාධන උපකරණ	1,325.00		-	1,325.00	1,325.00		-	1,325.00	-
ගෘහ භාණ්ඩ හා සවි කිරීම්	77,676.92	-	-	77,676.92	68,414.42	-	2,850.00	71,264.42	6,412.50
පරිගණක උපකරණ	264,945.00		-	264,945.00	264,945.00		-	264,945.00	-
	872,595.42	**-**	**-**	**872,595.42**	**782,613.38**	**-**	**17,642.00**	**800,255.38**	**72,340.04**

දේපළ, පිරියත හා උපකරණවලට 2022 දෙසැම්බර් 31 දිනට තවමත් භාවිතයේ පවතින රු .696,175.42ක දළ වටිනාකමක් සහිත පූර්ණව ක්ෂය කරන ලද වත්කම් ඇතුළත් වේ .

කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය
ධීවර විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය
2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා
ආදායම් ප්‍රකාශනය සඳහා සටහන්

	2022.12.31	2021.12.31
සටහන 02 - තොග	රු. ශත.	රු. ශත.
මුද්‍රණ ද්‍රව්‍ය	92,219.05	93,701.62
	92,219.05	**93,701.62**
සටහන 03 - ලැබිය යුතු දෑ		
ගොවි විශ්‍රාම වැටුප් ණය	-	248,129,565.75
මරණ පාරිතෝෂික අත්තිකාරම්	5,000.00	50,000.00
	5,000.00	**248,179,565.75**
සටහන 04 - කල්පිරීම් තෙක් රඳවාගත් මූල්‍ය සාධන පත්‍ර		
භාණ්ඩාගාර බිල්පත් -ලංකා බැංකුව	-	386,997,211.54
ස්ථාවර තැම්පතු -ලංකා බැංකුව	662,541,899.59	-
	662,541,899.59	**386,997,211.54**
සටහන 05- බැංකුවේ ඇති මුදල්		
ගි.අංක.164790 ලංකා බැංකුව යුනියන් පෙදෙස	118,692.76	13,501.35
ගි.අංක.164795 ලංකා බැංකුව යුනියන් පෙදෙස	513,051.48	731,681.91
එකතු කිරීම් ගිණුම	68,857.00	132,652.00
	700,601.24	**877,835.26**
සටහන 06 - ධීවර විශ්‍රාම වැටුප් සමුච්චිත අරමුදල		
ඉදිරියට ගෙනා ශේෂය	(4,103,708,674.39)	(3,675,902,449.83)
පෙර වසර ගැලපීම	17,000.00	-
	(4,103,691,674.39)	**(3,675,902,449.83)**
වර්ෂය තුළදී එකතුකිරීම්		
වසර සඳහා මුළුඅතිරික්තය /(හිඟය)	(406,060,646.43)	(427,806,224.56)
	(4,509,752,320.82)	**(4,103,708,674.39)**

කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය
ධීවර විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය
2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා
ආදායම් ප්‍රකාශනය සඳහා සටහන්

	2022.12.31	2021.12.31
	රු. ශත.	රු. ශත.
සටහන 7 - මරණ පාරිතෝෂික අරමුදල		
ඉදිරියට ගෙනා ශේෂය	30,965,194.70	29,500,354.70
එකතුකළා:		
වසර සඳහා දායක මුදල්	1,749,300.00	1,752,840.00
අඩුකළා:		
මරණ පාරිතෝෂික ගෙවීම්	(179,000.00)	(288,000.00)
	(179,000.00)	(288,000.00)
	1,570,300.00	**1,464,840.00**
	32,535,494.70	**30,965,194.70**
සටහන 08 - ගෙවිය යුතු දෑ		
ගෙවියයුතු -විශ්‍රාමවැටුප්ගෙවීම	5,738,914.00	4,863,160.00
ගෙවියයුතු-කෘෂිකාර්මිකරක්ෂණ යෝජනා ක්‍රමය	62,893,599.68	55,164,714.53
ගෙවියයුතු - ආපසු ගෙවිය යුතු දායක මුදල්	106,702.00	207,450.00
ගෙවියයුතු - මරණ පාරිතෝෂිකය	159,000.00	211,000.00
ගෙවියයුතු - ලංකා බැංකුව	-	236,721.76
ගෙවියයුතු -දිරිදීමනා	-	325.00
ගෙවියයුතු - දායක මුදල් මත ආපසු ගෙවන පොළිය	146,131.00	271,424.00
ගෙවියයුතු - පරිගණක නඩත්තු	11,450.00	-
	69,055,796.68	**60,954,795.29**
සටහන 9 - උපචිත වියදම්		
මුද්‍රණ ගාස්තු	542,199.31	542,305.81
නෛතික ගාස්තු	-	17,000.00
විගණන ගාස්තු සඳහා ප්‍රතිපාදන	264,600.00	529,200.00
	806,799.31	**1,088,505.81**

ධීවර විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය
2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා
ආදායම් ප්‍රකාශනය සඳහා සටහන්

	2022.12.31	2021.12.31
	රු. ශත.	රු. ශත.
සටහන 10 - පරිපාලන වියදම්		
වැටුප් සහ වේතන	3,352,383.20	2,950,603.31
සේ.අ.අ දායක මුදල්	362,230.73	354,072.40
සේ.භා.අ. දායක මුදල්	90,557.68	88,518.10
අතිකාල	-	4,524.00
විශේෂ දීමනා	497,736.00	557,736.00
පාරිතෝෂික	476,364.72	354,351.88
ඉන්ධන	427,929.77	222,322.01
ලිපි ද්‍රව්‍ය	249,691.41	197,464.85
මුද්‍රණ	121,432.57	161,987.30
කාර්ය මණ්ඩල නිලඇඳුම්	10,208.85	7,108.35
කුලී	937,444.40	765,535.85
දුරකථන	333,025.96	201,657.10
තැපැල් ගාස්තු	351,050.86	99,473.49
ජල බිල්පත්	30,877.32	26,607.94
ආරක්ෂක	121,813.04	92,790.00
විදුලිය	135,498.03	119,477.80
රථ වාහන නඩත්තුව	552,388.49	489,631.87
ගොඩනැගිලි නඩත්තුව	35,051.15	23,756.47
කාර්යාල උපකරණ නඩත්තුව	56,212.22	40,157.92
පරිගණක වියදම්	182,651.39	222,420.80
ක්ෂය වීම	17,642.00	17,642.00
විගණන ගාස්තු	239,400.00	178,749.00
	8,581,589.79	**7,176,588.44**

සටහන 11 - මූල්‍ය ගාස්තු

බැංකු ගාස්තු	400.00	100.00
	400.00	**100.00**

විගණකාධිපති වාර්තා

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } ARI/C/AAIB/01/22/09/FA ඔබේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2023 අගෝස්තු 04 දින

නොපති

කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය

කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ සහ එහි ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනාක්‍රමය සහ ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනාක්‍රමවල 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

1. මූල්‍ය ප්‍රකාශන

1.1 සත්ත්වාගණනය කළ මතය

කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ ("මණ්ඩලය") සහ එහි ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනාක්‍රමය සහ ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනාක්‍රමවල ("සමූහය") 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මණ්ඩලයේ සහ සමූහයේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ, 1999 අංක 20 දරන කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, මණ්ඩලයේ සහ සමූහයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, කොළඹුවා පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව இல. 306/72, Battaramulla Road, Battaramulla, Sri Lanka. No. 306/72, Pelikaru Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 agg@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.2 නත්ත්වාගණනය කළ මූල්‍ය සඳහා පදනම

1.2.1 ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සඳහා අදහස් දැක්වීම

සමූහය තුළ ඇති පරිපාලිතවල 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ඉදිරි පත් කරන ලද මූල්‍ය ප්‍රකාශන පිළිබඳව පහත සඳහන් කරුණු මත පදනම්ව මා විසින් නත්ත්වාගණනය කරන ලද මතයන් ප්‍රකාශ කර තිබුණි.

1.2.1.1. ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනාක්‍රමය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 37 හි 59 වන ඡේදය ප්‍රකාරව, සක්‍රීය දායකයන් හා ගොවි විශ්‍රාමිකයන්ගේ විශ්‍රාම වැටුප් වගකීම් කාලානුරූපීව සිදුකරනු ලබන ආයුගණන නත්ත්වේරුව මගින් ගණනය කළ යුතු වුවද 2007 වර්ෂයෙන් පසු දිගින් දිගටම ආයුගණන නත්ත්වේරුවක් සිදු කිරීමකින් තොරව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින දක්වා විශ්‍රාම වැටුප් වගකීම් ගණනය කර තිබුණු අතර එසේ ගණනය කරන ලද විශ්‍රාම වැටුප් වගකීම් රු.82,435,153,268 ක් විය. තවද අවසුදැ විසින් යම්කිසි කැඳිරි පියවීමට ප්‍රතිඝාටයක් ගණෙන්ඩායෙන් සිදුකර නොතිබුණි.

(ආ) සක්‍රීය දායකයින්ගෙන්, නිශ්චිත වර්ෂය සඳහා ලැබිය යුතු දායක මුදලේ වටිනාකම ගවුනාගැනීමට හැකිවන පරිදි විශ්‍රාම වැටුප් යෝජනාක්‍රමය සඳහා බැඳුනා දිනය සහ නිමිකම්සහන දිනය අතුලත් දායකයින්ගේ තාමෙල්ඛනය වරික ලැබීම් ඇතුළත් කරමින් සම්පූර්ණවම සහ යාවත්කාලීනව පවත්වාගෙන නොයෑම නිසා දායකයින්ගෙන් ලද ආදායම් උපචිත පදනම් වෙනුවට මුදල් පදනමට රු.13,420,221 ක් ලෙස ගිණුම් ගත කර තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කැපැල් දෙපාර්තමේන්තුවේ දිසා ගිණුම් කාර්යාලවලින් ආපසු ගෙන්වා ගැනීමට ඇති නිමිකම් නොපැ රු.47,102,835 ක විශ්‍රාම වැටුප් මුදලෙහි නිවැරදිභාවය පරීක්ෂා කිරීමට හැකි අයුරින් මණ්ඩලය විසින් පොත්පත් පවත්වාගෙන ගොස් නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය තුළ ගොවි විශ්‍රාම වැටුප් ගෙවීම් සඳහා මහා භාණ්ඩාගාරයෙන් ලද රු.3,968,000,000 ක මුදලින් රු.3,918,881,123 ක් ගෙවීම් කිරීමෙන් පසු ඉතිරි මුදල වූ රු.49,118,877 ක් නැවත භාණ්ඩාගාරයට ප්‍රේෂණය කර නොතිබුණු අතර එය ආපසු ගෙවිය යුතු මුදලක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂය තුළ ගොවි විශ්‍රාම වැටුප් ගෙවීම්වලින් හිමිකම් නොපෑ රු.167,470,484 ක් ගොවීන්ට ආපසු ගෙවිය යුතු බැරකමක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් නොකර යෝජනාක්‍රමයේ ආදායම ලෙස සලකා ගිණුම්ගත කර තිබුණි.

(ඊ) 2019 ජනවාරි සිට 2022 දෙසැම්බර් මාසය දක්වා වූ කාලපරිච්ඡේදය තුළ රු.4,435,400 ක හිමිකම් නොපෑන ලද ශුද්ධ වාරික මුදල් සහ මාසික බෙලහීන ගෙවීම් සඳහා වූ චෙක්පත් 612 ක් මු.රෙ.396(ඇ)(iii) ප්‍රකාර ගෙවීමට ඇති ණයක් වශයෙන් සටහන් නොකර, ඒ ඒ වර්ෂවලදී ආදායමට ගෙන තිබුණි.

(උ) සමාලෝචිත වර්ෂය තුළදී ගොවි විශ්‍රාම වැටුප් අරමුදලෙහි පරිපාලන වියදම් සඳහා භාණ්ඩාගාරයෙන් ලද රු.190,000,000 ක් ගොවි විශ්‍රාම වැටුප් අරමුදලෙහි බැංකු ගිණුමට බැර නොකර කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ යෝජනා ක්‍රමයේ බැංකු ගිණුමට බැර කර එයින් වියදම් දරා, ජංගම ගිණුමක් මගින් එම ගනුදෙනු අරමුදලෙහි ලෙජරයට සටහන් කර තිබුණි.

(ඌ) සමාලෝචිත වර්ෂය තුළ දී මෙම යෝජනා ක්‍රමයට අදාළව නීතිමය ගනුදෙනු නොතිබියදී කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ නීති වියදමින් සියයට 60 කට සමාන රු.1,348,623 ක් මෙම යෝජනා ක්‍රමයේ නීති වියදම ලෙස ගිණුම්ගත කර තිබුණි. මෙම ප්‍රතිශතය තීරණය කළ පදනම හෙළිදරව් කර නොතිබුණි.

(එ) ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය, ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය සහ කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය යන ගිණුම් ඒකක තුනම එක්ව ක්‍රියාත්මකව තිබුණත්, කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ පරිපාලන වියදමින් සියයට 50 ක් සහ අනෙකුත් වියදම්වලින් සියයට 20 සිට සියයට 50 ක් දක්වා වූ ඉහළ ප්‍රතිශතයන් ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට අන්තර්ග්‍රහණය කර තිබුණි. එම අනුපාතවල සාධාරණත්වය පරීක්ෂා කිරීම සඳහා අනුපාත තීරණය කළ පදනම හෙළිදරව් කර නොතිබුණි.

(ඒ) යෝජනාක්‍රමයේ මුළු වත්කම් රු.1,516,033,327 ක් සහ මුළු වගකීම් රු.87,508,723,633 ක් වූ අතර වත්කම් ඉක්මවූ වගකීම් රු.85,992,690,306 ක් විය. මෙම අවාසිදායක තත්ත්වය යෝජනාක්‍රමයේ අඛණ්ඩ පැවැත්ම කෙරෙහි අහිතකර ලෙස බලපා තිබුණි.

1.2.1.2. ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනාක්‍රමය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ

(අ) ලී බඩු සහ සවි කිරීම්, කාර්යාල උපකරණ සහ පරිගණක වැනි රු.696,175 ක් වටිනා සම්පූර්ණයෙන්ම ක්ෂය කරන ලද වත්කම් තවදුරටත් භාවිතා කරමින් පැවතිය ද ඒවා නැවත තක්සේරු කර ගිණුම්ගත කිරීමට ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 08 අනුව කටයුතු කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 37 හි 59 වන ඡේදය ප්‍රකාරව මෙම යෝජනාක්‍රමයේ සක්‍රීය දායකයන් හා ධීවර විශ්‍රාමිකයන්ගේ විශ්‍රාම වැටුප් වගකීම සඳහා ආයු ගණක තක්සේරුව කාලානුරූපීව සිදු කළ යුතු වුවද 2007 වර්ෂයෙන් පසුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින දක්වා එම ආයු ගණක තක්සේරුව සිදු කර නොතිබුණු අතර එදිනට සක්‍රීය දායකයන් හා ධීවර විශ්‍රාමිකයන්ගේ විශ්‍රාම වැටුප් වගකීම රු.5,068,050,746 ක් විය.

(ඇ) ධීවර විශ්‍රාම වැටුප් යෝජනාක්‍රමය සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මගින් අනුමත කාර්ය මණ්ඩලයක් නොමැතිව තිබියදී මණ්ඩලයේ සභාපතිගේ පෞද්ගලික ලේකම්, තඹුත්තේගම දිස්ත්‍රික් කාර්යාලයේ කාර්යාල සහායක සහ මන්නාරම දිස්ත්‍රික් කාර්යාලයේ කළමනාකරණ සහකාර නිලධාරියෙකු සේවයේ යොදවාගෙන ඒ තිදෙනාට වැටුප් ලෙස එකතුව වූ රු.2,209,812 ක් ගෙවා යෝජනාක්‍රමයේ වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ඈ) 2019 වර්ෂයෙන් ඉදිරියට රැගෙන එන ලද රු.98,000 ක ධීවර මරණ පාරිතෝෂික අරමුදලෙහි ගෙවිය යුතු ශේෂය 2020 වර්ෂයේ නිරවුල් කර ඇතත් එම නිරවුල් කිරීම සඳොස් ලෙස ගිණුම්ගත කිරීම නිසා ශේෂය සමාලෝචිත වර්ෂයේදී ද ඉදිරියට රැගෙන විත් තිබුණි.

(ඉ) යෝජනාක්‍රමයේ මුළු වත්කම් රු.663,412,060 ක් සහ මුළු වගකීම් රු.5,140,628,886 ක් පැවති අතර වත්කම් ඉක්මවූ වගකීම් රු.4,477,216,826 ක් විය. මෙම අවාසිදායක තත්ත්වය යෝජනාක්‍රමයේ අඛණ්ඩ පැවැත්ම කෙරෙහි අහිතකර ලෙස බලපා තිබුණි.

1.2.2 මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන සඳහා අදහස් දැක්වීම

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 16 හි 51 ඡේදය ප්‍රකාරව ජංගම නොවන වත්කම්වල ඵලදායී ජීවිත කාලය සමාලෝචනය නොකිරීම හේතුවෙන් සම්පූර්ණයෙන්ම ක්ෂය කර ඇතිමුත් තවදුරටත් භාවිතා කරමින් පවතින රු.33,415,830 ක පිරිවැය වූ දේපළ පිරියත උපකරණවල ඵලදායී ජීවිත කාලය පිළිබඳ වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 08 ප්‍රකාරව ප්‍රතියෝධනය කර නිවැරදි ධාරණ අගය ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 20 හි 7 ඡේදය ප්‍රකාරව රාජ්‍ය ප්‍රදාන සාධාරණ තහවුරුවක් ලැබෙනතුරු ආදායම් ලෙස හඳුනා නොගත යුතු වුවත්, භාණ්ඩාගාරයෙන් තහවුරුවක් නොමැතිව, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සමාජ ආර්ථික සහ සැලසුම් මධ්‍යස්ථානය විසින් වාර්ෂිකව ඇස්තමේන්තු කර වෙබ් අඩවියෙහි ප්‍රසිද්ධ කර ඇති නොමිලේ රක්ෂණය යටතේ ආවරණය වන වගා බිම අක්කර ගණන පදනම්ව ගණනය කර, අක්කර එකකට රු.675 ක වාරිකයක් බැගින් 2018 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින දක්වා වාරික ආදායම, රු.4,249,619,152 ක් භාණ්ඩාගාරයෙන් ලැබිය යුතු ලෙස මූල්‍ය ප්‍රකාශනවල උපචිත කර තිබුණි. එම වටිනාකම සමුච්චිත අරමුදලින් සියයට 62 ක් වන අතර එම සම්පූර්ණ මුදලම මණ්ඩලයට ලැබීම අවිනිශ්චිත බව නිරීක්ෂණය කෙරේ.

(ඇ) මණ්ඩලය විසින් මෙහෙයවනු ලබන ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනාක්‍රමයෙහි පරිපාලන වියදම් සඳහා භාණ්ඩාගාරයෙන් ලබාදුන් රාජ්‍ය ප්‍රදාන රු.1,500,000 ක් භාණ්ඩාගාරයෙන් ලද මුදල් ලෙස නොපෙන්වා සමූහයේ මූල්‍ය ප්‍රකාශනවල සදොස් ලෙස වෙනත් ආදායම් ලෙස දක්වා තිබුණි.

(ඈ) මණ්ඩලයට අයත් මහිය-ගනය, ඇඹිලිපිටිය සහ අනුරාධපුරය යන නගරවල පිහිටි නිල නිවාස 3 පිහිටි පර්චස් 76.6 ක් වූ ඉඩම් තුන තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවලට ගෙන නොතිබුණි.

(ඉ) ජාත්‍යන්තර මූල්‍ය සංස්ථාව (IFC) සමඟ ඒකාබද්ධව කෘෂි රක්ෂණ යෝජනාක්‍රමවල ඵලදායිතාවය වැඩි දියුණු කිරීම සහ එමඟින් ශ්‍රී ලංකාවේ කෘෂි රක්ෂණ ආවරණය ඉහළ නැංවීමේ පරමාර්ථයෙන් 2016 මැයි 05 වන දින සහයෝගිතා ගිවිසුම්ගතව, වගාහානි සඳහා රක්ෂණ වන්දි ගෙවීමේ ක්‍රියාවලිය මාස 2½ ක් දක්වා අඩුකර ගැනීම සඳහා දර්ශක මත පදනම් වූ රක්ෂණ ක්‍රමවේදය හඳුන්වා දී ගොඩනගාගෙන ඇති කෘෂිකාර්මික කළමනාකරණ තොරතුරු පද්ධතියට, එක්සත් ජාතීන්ගේ ආහාර හා කෘෂිකර්ම සංවිධානය, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට රු.20,391,089 ක මූල්‍ය පහසුකම්, මණ්ඩලය වෙත ලබාදී තිබුණු අතර වර්ෂය අවසාන වන විට මණ්ඩලය විසින් ඒ සඳහා රු.23,009,698 ක් වැයකර තිබුණු නමුත් මෙම කළමනාකරණ තොරතුරු පද්ධතිය මූල්‍ය ප්‍රකාශනවල ගිණුම්ගත කර නොතිබුණි. වන්දි ගණනය කිරීම සහ වන්දි ගෙවීමේ ක්‍රියාවලිය සඳහා තොරතුරු පද්ධතිය භාවිතා නොකරන නිසා ව්‍යාපෘතියේ අපේක්ෂිත පරමාර්ථ අත්කර ගෙන නොතිබුණි.

(ඊ) වගා රක්ෂණ යෝජනාක්‍රමය යටතේ රක්ෂණ ආවරණය ලබාගෙන තිබුණු ගොවීන් 18 දෙනෙකු වෙත, මණ්ඩලයේ අරමුදල්වලින් වන්දි ගෙවීම වෙනුවට ජාතික රක්ෂණ භාර අරමුදලින් සහ භාණ්ඩාගාරයෙන් මුදල් ගෙන්වාගෙන, 2021 යල කන්නය සඳහා රු.336,150 ක වන්දි මුදල් ගෙවා තිබුණි.

(උ) මණ්ඩලයේ දිස්ත්‍රික් කාර්යාල විසින් රක්ෂිතයින්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් මාසය සඳහා එකතු කළ රු.3,284,147 ක් වූ වාරික මුදල් දිස්ත්‍රික් කාර්යාලවලින් ලැබිය යුතු රක්ෂණ වාරික ලෙස සදොස්ව මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දක්වා තිබුණි.

(ඌ) පෞද්ගලික විදුලි සංදේශන සමාගමකින් 2021 ඔක්තෝබර් මාසයේදී පරිත්‍යාග ලෙස ලද වැඩි යන්ත්‍ර 10 ක් ඉන්වෙන්ට්‍රිගත කර හෝ මූල්‍ය නොවන වත්කම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර නොතිබුණි.

(එ) ණය සහ විවිධ කාර්යයන් සඳහා නිලධාරීන් වෙත ලබාදුන් අවුරුදු 02 සිට අවුරුදු 38 ක් දක්වා පැරණි රු.1,107,227 ක් වූ අත්තිකාරම් ශේෂ සමාලෝචිත වර්ෂය තුළදී ද අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.මෙම ශේෂ අයකර ගැනීම අවිනිශ්චිත බව නිරීක්ෂණය වුවද ඒ සඳහා ප්‍රතිපාදන සලසා නොතිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණනයේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාරක්ෂනය කළ හැක සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මණ්ඩලයේ 2022 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු වන මණ්ඩලයේ 2022 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මාගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මාගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මෙම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ විගණනයට අදාළව, මාගේ වගකීම වන්නේ ඉහත සඳහන්ගත් අනෙකුත් තොරතුරු ලබා ගත නැති වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මාගේ දැනුම අතුව ප්‍රමාණෝත්මක වශයෙන් නොගැළපෙනවාද යන්න සලකා බැලීමයි.

මණ්ඩලයේ සහ සමූහයේ 2022 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණෝත්මක වරදවා දැක්වීම ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. නව දුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම වාවස්ථාවේ 154(6) වාවස්ථාවේ ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා නිඹුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමූහය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සමූහය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් හැඳීම හා මණ්ඩලයේ සහ සමූහයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමූහයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ සහ සමූහයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූෂ්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සරලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවිය හැකි, අවස්ථාවෝචිතව උචිත විගණන පරීක්ෂාව සැලසුම් කිරීම පිණිස සමූහයේ අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- හෙළිදරව් කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමූහයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබෙද යන්න සම්බන්ධයෙන් උසාවියේ විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා සමූහයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය වි‍කරණය කළ යුතුය. තවදුරටත්, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල වපුතය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

- ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීම සඳහා සමූහය තුළ ඇති ආයතන හෝ ව්‍යාපාර ක්‍රියාකාරකම්වල මූල්‍ය තොරතුරු සම්බන්ධයෙන් ප්‍රමාණවත් සුදුසු විගණන සාක්ෂි ලබා ගන්නා ලදී. සමූහ විගණනයේ මෙහෙයවීම, අධීක්ෂණය සහ කාර්ය සාධනය සඳහා මා වගකිව යුතුය. මාගේ විගණන මතය සඳහා මම සම්පූර්ණයෙන්ම වගකිව යුතුය.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන සංශික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

2.1.1 මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම් කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා මණ්ඩලය පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම් කොටසේ 1.2.2 (අ),(ඇ),(ඇ),(ඉ) සහ (ඊ) යන ඡේදවල දක්වා ඇති නිරීක්ෂණ හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට මණ්ඩලය සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාළ ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

නීති රීති / විධානයට යොමුව	නිරීක්ෂණ
(අ) කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩල කළමනාකරණ සේවා ගණයෙහි තනතුරු සඳහා වූ බඳවාගැනීමේ පරිපාටියේ 4.3.1(අ) උප වගන්තිය	(i). රක්ෂණ අංශයේ සහකාර අධ්‍යක්ෂ තනතුර සඳහා රාජ්‍ය අංශයේ/ සංස්ථා/ මණ්ඩල හෝ පිළිගත් ආයතනයක වසර 03 ක රක්ෂණ කටයුතු පිළිබඳ පළපුරුද්ද ඇති නිලධාරියෙකු බඳවාගත යුතු වුවත්, එයට පටහැනිව වසර 03 ක ක්ෂේත්‍ර හා පරිපාලන කටයුතු පිළිබඳ පළපුරුද්ද ඇති නිලධාරියෙකු බඳවාගෙන තිබුණි.

(ii) සැලසුම් අංශයේ සහකාර අධ්‍යක්ෂ තනතුර සඳහා රාජ්‍ය අංශයේ/ සංස්ථා/ මණ්ඩල හෝ පිළිගත් ආයතනයක වසර 03 ක සැලසුම්කරණ හෝ කාර්යඵල මෙහෙයුම් ක්ෂේත්‍රයේ පළපුරුද්ද ඇති නිලධාරියෙකු බඳවාගත යුතු වුවත්, එයට පටහැනිව වසර 03 ක ක්ෂේත්‍ර හා පරිපාලන කටයුතු පිළිබඳ පළපුරුද්ද ඇති නිලධාරියෙකු බඳවාගෙන තිබුණි.

(ආ) 2015 මැයි 25 දිනැති PED 1/2015 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය 2 ඡේදය	චක්‍රලේඛයේ ප්‍රතිපාදන නොමැතිව තිබියදී MM 1-1 සේවා ගණයට අයත් නිලධාරීන් 19 දෙනෙකු සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත සමාලෝචිත වර්ෂය තුළදී රු.1,380,533 ක ප්‍රවාහන දීමනා ගෙවා තිබුණි.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණය හැර මණ්ඩලයේ, බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

බලතල, කර්තව්‍ය, කාර්යයන්	නිරීක්ෂණ
1999 අංක 20 දරන කෘෂිකාර්මික සහ ගොවිජන රක්ෂණ පනතේ 7(අ) උප වගන්තිය	කෘෂිකාර්මිකයන්ට ස්ථාවරත්වය ලබාදීමේ හා කෘෂිකාර්මික නිෂ්පාදන ප්‍රවර්ධනය කිරීමේ පරමාර්ථය ඇතිව, පාඩු වෙනුවෙන් මවුන්ට හානි පූර්ණය සැලසීම සඳහා කෘෂිකාර්මිකයින්ගේ ප්‍රතිලාභය පිණිස මණ්ඩලය විසින් පවත්වාගෙන ගිය කෙතට අරුණ රක්ෂණ ක්‍රමයට අදාළ ගොවීන් 8,185 කට 2017 සහ 2018 වර්ෂවල දී ගෙවන ලද රු.70,800,200 ක වන්දි මුදල්, ගිණුම් අංක, ගොවීන්ගේ නම් හා හැඳුනුම්පත් අංක නොගැලපීම හේතුවෙන් වාණිජ බැංකු මගින් ආපසු එවා ඇෂත් අදාළ ගොවීන් හඳුනාගෙන රම ශේෂය නිරවුල් කිරීමට වසර 5 ක් තිස්සේ කටයුතු කර නොතිබුණි.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

2.3 වෙනත් කරුණු

ගෙන නිරීක්ෂණයෙන් කරනු ලැබේ

(අ) 2021/22 මහ කන්නය සඳහා ගෙවීන් 26,904 දෙනෙකුට ගෙවීමට නියමිත වන්දි මුදලින් රු.10,777,000 ක මදිකි අනතුරු රක්ෂණ වාරිකයක් අඩු කරගෙන තිබුණු අතර එම මුදල අඩු කර ගත් දිනයේ සිට වසරක කාලයකට මදිකි අනතුරු රක්ෂණ ආවරණයෙක් ලබා දියයුතු වුවත් ගෙවීන් 14,779 දෙනෙකුට රක්ෂණ වාරික මුදලක් අඩු කර ගත් දිනයේ සිට මාස 7 ක් ගත වී තිබුණද රක්ෂණ සහතික ලබා දී නොතිබුණි.

(ආ) ඇඹිලිපිටිය දිස්ත්‍රික් කාර්යාල පරිශ්‍රය හා නිල නිවාසය 1998 වර්ෂයේ සිට අබලන් තත්ත්වයේ සහ අඳුන්වැඩියා කළ යුතු තත්ත්වයේ පවතින බව මණ්ඩලය වඳනාගෙන නිබුණු නමුත් අඳුන්වැඩියා කර නොමැති බව හෙතිහ විගණන පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.

(ඇ) 2021 වර්ෂයේදී සංවර්ධන නිලධාරී තනතුර සඳහා නිලධාරීන් 15 දෙනෙකු බඳවාගෙන තිබුණු අතර එම බඳවාගැනීමේ සාමිලිම පරීක්ෂණයේදී ලකුණු ලබා ගත් අනුපිළිවෙල මෙය යැයේ සඳහ, යාත්‍රාවේදීගෙන් 3, 5, 7 සහ 12 යන ස්ථානවල පාති ඇති, අයදුම්කරුවන් 4 දෙනෙකු බඳවා නොගෙන ඊට වඩා අඩු ලකුණු ලබා තිබුණු අයදුම්කරුවන් 4 දෙනෙකු බඳවාගෙන තිබුණි.

(ඈ) ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍යාංශයේ සේවය සඳහා මුදාහරින ලද නිලධාරියෙකුට 2011, 2012 හා 2013 වර්ෂ සඳහා මණ්ඩලයෙන් ගෙවන ලද වැටුප් මුදලින් ප්‍රතිපූර්ණය කර නොගත් රු.171,011 ක් වූ මුදල වර්ෂ 10 ක පමණ මුල්‍ය ප්‍රකාශනවල ඉදිරියට ගෙනෙමින් පවතී.

(ඉ) 2018 දෙසැම්බර් 31 දිනට පැවති රු.426,871 ක් වූ ආපසු ගෙවිය යුතු වෙන්ඩර් තැන්පතු වටිනාකම් කල්ඉක්මවූ වර්ෂය අවසානය වන විටත් නිරවුල් කර නොතිබුණි.

ඩබලිව්. ඒ.ඒ. විතුමරත්න
විගණකාධිපති

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. ARI/C/FPS/1/22/07/FA | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date 2023 ජුනිදින

MANAGEMENT
05 JUL 2023
Agricultural Bank Transfer
Insurance Board

සභාපති
කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය

ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමයේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

යථෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති

පිටපත් :- 1. ලේකම් - කෘෂිකර්ම අමාත්‍යාංශය
2. ලේකම් - මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය

+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naeal.gov.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය
எனது இல.
My No. ARI/SWPS/1/22/07/FA

ඔබේ අංකය
உமது இல.
Your No.

දිනය
திகதி
Date 2023 ජූලි 03 වැනිදා

06 JUL

05 JUL 2023

සභාපති
සාමාන්‍යාධිකාරී හා ගොවිජන රක්ෂණ මණ්ඩලය

ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමයේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනය සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පළමුවැව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වන වගන්තිය ප්‍රකාරව මිනඇකෘයිසේ වාර්තාව

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාරූපණය කළ මතය

ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විත්තීරණ ආදායම ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) වගවීම්වාවේ සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1987 අංක 12 දරන ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රම පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) වගවීම්වාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාරූපණය කළ මතය සඳහා පදනම් සොයමේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, අවසිදලේ මූල්‍ය ප්‍රකාශන මගින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මූදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් විදිහිමිකු කරන බව මා දරන්නා වූ මතය වේ.

+94 11 2 88 70 28 - 34 +94 11 2 88 70 25 www.naosl.gov.lk

1.2 සන්සිඩියරිය සඳහා මූල්‍ය සැපයීම

ගණන් කිරීම්වලින් පැහැදිලි වේ.

(අ) ශ්‍රී ලංකා මිණුම්කරුගේ පනතේ 37 වන 59 වන වගන්තිය ප්‍රකාරව, සමාගම් ලේඛකාධිකාරීවරයාගේ විශ්‍රාම වැටුප් වගකීම් නෛතිකයන්ගේ උපදෙස් පරිදි ගණනය කළ අතර එහි ගණනය කරන ලද විශ්‍රාම වැටුප් වගකීම රු.82,435,153,268 ක් විය. නමුත් අවසන් විගණිත මූල්‍ය ප්‍රකාශනවල මෙම බැඳීම පියවීමට ප්‍රමාණවත් ආයෝජනයක් සිදුකර නොතිබුණි.

(ආ) සමාගම් ලේඛකාධිකාරීවරයාගේ, මිණුම් වර්ෂය සඳහා ලැබිය යුතු දායක මුදලේ වර්තමාන වටිනාකම ගණනය කිරීමට භාවිතා කරන ලද විශ්‍රාම වැටුප් යෝජනාක්‍රමය සඳහා බැඳුණ දිනය සහ මිණුම්කරුගේ දිනය අතුළත් දායකයින්ගේ තාවලේඛනය වර්තන ලැබීම් අතුළත් කරමින් සම්පූර්ණව සහ යාවත්කාලීනව පවත්වාගෙන නොයාම නිසා දායකයින්ගෙන් ලද ආදායම් උපචිත පදනම් වෙනුවට මුදල් පදනම්ව රු.13,420,221 ක් ලෙස මිණුම් ගත කර තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට නැපැල් දෙපාර්තමේන්තුවේ දිනා මිණුම් නාරියාලවලින් ආපසු ගෙන්වා ගැනීමට ඇති නිමිතම නොහැ රු.47,102,835 ක විශ්‍රාම වැටුප් මුදලෙහි නිවැරදිභාවය පරීක්ෂා කිරීමට හැකි අයුරින් මණ්ඩලය විසින් නොඑහත් පවත්වාගෙන ගොස් නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය තුළ ගෙවී විශ්‍රාම වැටුප් ගෙවීම සඳහා මහා භාණ්ඩාගාරයෙන් ලද රු.3,968,000,000 ක මුදලින් රු.3,918,881,123 ක් ගෙවීම් කිරීමෙන් පසු ඉතිරි මුදල වූ රු.49,118,877 ක් නැවත භාණ්ඩාගාරයට ප්‍රේෂණය කර නොතිබුණු අතර එය අංසපූ ගෙවිය යුතු මුදලක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂය තුළ ගොඩ විශ්‍රාම වැටුප් ගෙවීම්වලින් නිමිතම නොහැ රු.167,470,484 ක් ගොවින්ට ආපසු ගෙවිය යුතු බැරකමක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් නොකර යෝජනාක්‍රමයේ ආදායම් ලෙස සලකා මිණුම්ගත කර තිබුණි.

(ඊ) 2019 ජනවාරි සිට 2022 දෙසැම්බර් මාසය දක්වා වූ කාලපරිච්ඡේදය තුළ රු.4,435,400 ක හිමිකම් නොපාන ලද ශුද්ධ වාරික මුදල් සහ මාසික බෙලහීන ගෙවීම් සඳහා වූ චෙක්පත් 612 ක් මු.රෙ.396(ඇ)(iii) ප්‍රකාර ගෙවීමට ඇති ණයක් වශයෙන් සටහන් නොකර, ඒ ඒ වර්ෂවලදී ආදායමට ගෙන තිබුණි.

(උ) සමාලෝචිත වර්ෂය තුළදී ගොවි විශ්‍රාම වැටුප් අරමුදලෙහි පරිපාලන වියදම් සඳහා භාණ්ඩාගාරයෙන් ලද රු.190,000,000 ක් ගොවි විශ්‍රාම වැටුප් අරමුදලෙහි බැංකු ගිණුමට බැර නොකර කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ යෝජනා ක්‍රමයේ බැංකු ගිණුමට බැර කර එයින් වියදම් දරා, ජංගම ගිණුමක් මගින් එම ගනුදෙනු අරමුදලෙහි ලෙජරයට සටහන් කර තිබුණි.

(ඌ) සමාලෝචිත වර්ෂය තුළ දී මෙම යෝජනා ක්‍රමයට අදාළව නීතිමය ගනුදෙනු නොතිබියදී කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ නීති වියදමින් සියයට 60 කට සමාන රු.1,348,623 ක් මෙම යෝජනා ක්‍රමයේ නීති වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි. මෙම ප්‍රතිශතය තීරණය කළ පදනම හෙළිදරව් කර නොතිබුණි.

(එ) ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය, ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය සහ කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය යන ගිණුම් ඒකක තුනම එක්ව ක්‍රියාත්මකව තිබුණත්, කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ පරිපාලන වියදමින් සියයට 50 ක් සහ අනෙකුත් වියදම්වලින් සියයට 20 සිට සියයට 50 ක් දක්වා වූ ඉහළ ප්‍රතිශතයන් ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට අන්තර්ග්‍රහණය කර තිබුණි. එම අනුපාතවල සාධාරණත්වය පරීක්ෂා කිරීම සඳහා අනුපාත තීරණය කළ පදනම හෙළිදරව් කර නොතිබුණි.

(ඒ) යෝජනාක්‍රමයේ මුළු වත්කම් රු.1,516,033,327 ක් සහ මුළු වගකීම් රු.87,508,723,633 ක් වූ අතර වත්කම් ඉක්මවූ වගකීම් රු.85,992,690,306 ක් විය. මෙම අවාසිදායක තත්ත්වය යෝජනාක්‍රමයේ අඛණ්ඩ පැවැත්ම කෙරෙහි අහිතකර ලෙස බලපා තිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම්, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම් යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මුලා ප්‍රකාශන පිළිබඳ කළමනාකාරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මුලා ප්‍රකාශන ශ්‍රී ලංකා මිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මුලා ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකාරණයේ වගකීම වේ.

මුලා ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකාරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය අරමුදල ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මෙ පදනම මත මිණුම් කැබීම් හා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකාරණයේ වගකීමකි.

අරමුදලේ මුලා වාර්තාකරණ ක්‍රියාවලිය පමිඹන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන රාජික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මුලා ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ප්‍රවණීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 මුලා ප්‍රකාශන විගණනය පමිඹන්ධයෙන් විගණකගේ වගකීම

අමේත්‍යාංශ ලෙස මුලා ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය මිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි තනි හෝ සාමූහික ලෙස බලපෑම් නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මුලා ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම් මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වැන්නිය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවශ්‍යවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්හෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුෂ්කන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවශ්‍යවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා සාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනස් කෙරෙනික හා නීයාමන අවශ්‍යතා පිළිබඳ විවරණය

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අරමුදලේ මූල්‍ය ප්‍රකාශන ඉතුරු වර්ෂය සම්බන්ධ අනුරූප වේ.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මහෝ විගණකවරි තන්ත්‍රාධිකාරියේ කළු මිතය සඳහා පදනම් කොටගත් 1.2.(අ), (ආ), (ඇ), (ඉ), (ඊ), (උ) සහ (ඒ) දක්වා ඇති නිරීක්ෂණ හැර ඉතුරු වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1. නීති රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම විගණනයේදී නිරීක්ෂණය විය.

	නීති රීති විධානයට යොමුව	නිරීක්ෂණ
3.1.1.	1987 අංක 12 දරන ගොඩ බිහුම් වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනාක්‍රම පනත	
(අ)	6(1) උප වගන්තිය	දායකයෙකු තම වයස අවුරුදු 60 වූ විට බිහුම් වැටුපකට හිමිකම් ලැබිය යුතු බවත් මෙම යෝජනාක්‍රමයේ (i). බිහුම් වැටුප් අයදුම්පත් ලබා ගැනීමට සහ ඉල්ලුම් කළ යුතු නියමිත දිනයන් පිළිබඳ ඔවුන් දැනුවත් කිරීමට සහ අයදුම්පත් ගෙන්වා ගැනීමට ක්‍රමවේදයක් ගොනුවුණේ.

(ii). නියමිත වයස සම්පූර්ණ වන තෙවන් ගදුනාගැනීමේ ක්‍රමවේදයක් නොතිබීම හේතුවෙන්, ප්‍රතිලාභියා විසින්ම විශ්‍රාම ප්‍රතිලාභ අයදුම් පත්‍රය ඉදිරිපත් කළයුතු බව නිසා ප්‍රතිලාභියා පෙරහැදියාවේ හෝ නිවසේ වෙන්සැරව් ප්‍රතිසාධ්‍ය ලබා නැතිම, දායක මුදල් කවෙහත් හොත අක්වානයත වී තිබීම, දායක මුදල් සවහන් හොත නොමැතිව මණ්ඩලය වෙත අයදුම්පත් ඉදිරිපත් කළ නොහැකි වීම වැනි හේතු නිසා අයදුම්පත් නියමිත දිනට ඉදිරිපත් නොකිරීමේ ප්‍රමාදය නිසා වූ අලාභය ඔහු විසින්ම දරාගත යුතුවිය.

(iii). සමාලෝචන වර්ෂයේදී ඉස්ලීක්ත 4 ක හෙවන් 12 දෙනෙකු සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී වාර මුදල් ආපසු ගෙවීමේදී අවුරුදු 2 සිට අවුරුදු 10 දක්වා කාලයක් ප්‍රමාදව පැවතීම සහ නියමිත වයස සම්පූර්ණ වූ දින සිට මාස 10 ක් වර්ෂ 9 ක් අතර කාලයක් විශ්‍රාම වැටුප ප්‍රදානය ප්‍රමාද කළ අවස්ථා නිරීක්ෂණය විය.

(iv). යටකින දක්ත සද්ධතිය තුළ දායකයින් 871,425 ක් ලියාපදිංචි කර ඇති අතර 2022 දෙසැම්බර් 31 දිනට වයස අවුරුදු 60 සම්පූර්ණ වී සිටි දායකයින් 439,025 කින් දායකයින් 246,531 ක් දෙනෙකුට විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ ගෙවා නොතිබුණි.

(v). විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ නියම වූ දින සිට විශ්‍රාම වැටුප ගෙවන් කළ දිනය දක්වා වූ කාලයට අදාළ මුදල් හෙවින් වෙන වෙවීමට කටයුතු නොකිරීම නිසා 2012 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා කීන ගොඩ විශ්‍රාම වැටුප් රු.3,914,947,932 ක් මූලය ප්‍රකාශනවල නිරවුල් නොකර දිගින් දිගටම ඉදිරියට ගෙන එමින් තිබුණි.

(අ) 12(ඇ) උප වගන්තිය — යෝජනාක්‍රමය සම්බන්ධයෙන් අඩකය මූලය හා මෙහෙයවීම වාර්තා පවත්වාගෙන යා යුතු වුවත්, යාවත්කාලීනව පවත්වාගෙන ගොස් නොතිබුණි.

(ඇ)	12(ඇ) උප වගන්තිය	යෝජනාක්‍රමය පිළිබඳව සමීක්ෂණ අගැයුම් හා සමාලෝචනය කර, මෙහෙයුම් රීතිවල වෙනස්කම් ඇති කිරීම සිදු කළ යුතු වුවත්, (i). සම්මත කරගන්නා ලද රීතියක් නොමැතිව අර්ධ වර්ෂයකට සියයට 3.32 ක ප්‍රතිශතයක් මත ශුද්ධ වාරික මුදල මත පොලිය ගණනය කර තිබුණි. (ii). සම්මත කරගන්නා ලද රීතියක් නොමැතිව ප්‍රතිලාභියාගේ ශුද්ධ වාරික මුදල් ගණනය කිරීමේදී ඔහු විසින් ගෙවා ඇති සෑම එක් වාරිකයකින්ම රු.15 බැගින් වූ පරිපාලන වියදමක්, ගොවියා නිසි පරිදි ගෙවූ එක් වාරිකයකට රු.30 බැගින් රක්ෂණ ගාස්තුවක් ද ගණනය කරන ලද ශුද්ධ වාරික මුදලින් රු.150 ක රක්ෂණ ගාස්තුවක්ද අඩු කර තිබුණි.
(ඈ)	15 වගන්තිය	15(2) සිට 15(5) දක්වා වූ උප වගන්ති අනුව පිළිවෙලින් වාරික 5 ක් කඩ කිරීම පිළිබඳ දායකයින් දැනුවත් නොකිරීම වැනි කොන්දේසි මණ්ඩලය විසින් කඩ කිරීම නිසා ගොවීන්ට ප්‍රතිලාභ අහිමිවූ අවස්ථා නිරීක්ෂණය විය.
(ඉ)	27(1) වගන්තිය	විෂයභාර අමාත්‍යවරයාගේ සහ මුදල් විෂයභාර අමාත්‍යවරයාගේ එකඟතාවය මත, ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනාක්‍රමය විසින් ලබා ගන්නා ණය ප්‍රමාණය තීරණය විය යුතු වුවත් එවැනි එකඟතාවයක් ලබානොගෙන කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයෙන් ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනාක්‍රමයට ණය ලබාගෙන තිබුණු අතර 2022 දෙසැම්බර් 31 දිනට එම ණය මුදල්වල ශේෂය රු.484,160,453 ක් බව නිරීක්ෂණය විය.
3.1.2.	ගොවි විශ්‍රාම වැටුප් සහතික ඔප්පුවේ 6 වගන්තිය	සහතික ඔප්පුවේ 6 වන වගන්තිය අනුව, ගෙවා ඇති අර්ධ වාර්ෂික දායක මුදල් ප්‍රමාණයෙන් යටත් පිරිසෙන් සියයට 75 ක් වෙතොත් දායක මුදල් ගෙවීමේ කාලය අවසන් වූ විට මණ්ඩලය විසින් තීරණය කරන පරිදි නියමිත විශ්‍රාම වැටුපට වඩා අඩු විශ්‍රාම වැටුපක් ලැබීමට දායකයාට හිමිකම් ඇතත් එය සැලකිල්ලට නොගෙන දායකයින්ගෙන් විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ අහිමි කළ අවස්ථා නිරීක්ෂණය විය.

3.2 අවධිමත් තනුදෙනු

මාස 6 ක් විශ්‍රාම වැටුප ලබා නොගත් විශ්‍රාම වැටුප් හිමියන්ගේ නම් මියගිය බව තහවුරු කර ගැනීමකින් තොරව විශ්‍රාම වැටුප් ආඥාවේ නීලධාරීන් විසින් විශ්‍රාම වැටුප් ගෙවීම නාමලේඛනයෙන් ඉවත්කර තිබුණි.

3.3 කළමනාකරණ ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) හෙළි විශ්‍රාමිකයින් වෙත විශ්‍රාම වැටුප් ගෙවීම සහ පරිපාලන වියදම් සඳහා මාසිකව මහා භාණ්ඩාගාරයෙන් මුදල් ලබාදෙන අතර එසේ හිඟියදී හොරින් වෙත මෙලෙසින සහ මරණ පාරිතෝෂික ගෙවීම සඳහා නෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ යෝජනා ක්‍රමය තුළ වාර්ෂිකව වැටිය මුදලක් තැන්පත් කරමින් ගොවීන් රක්ෂණය කර රක්ෂණ අරමුදලක් ගොඩනගාගෙන තිබුණි. සමාලෝචිත වර්ෂය සඳහා රු.17,197,260 ක වැටිය මුදලක් බැර කර රු.1,173,625 ක මරණ පාරිතෝෂික ගෙවීම් සිදු කර තිබුණු අතර වර්ෂය අවසානයට එම අරමුදලෙහි ශේෂය රු.1,258,775,352 ක් විය. සෑම වර්ෂයකදීම ගෙවන ලද ප්‍රතිලාභය මෙම අරමුදලට වාර්ෂිකව බැරකරන වැටිකවලින් සියයට 5 සිට 10 තරම් අඩු ප්‍රමාණයක් බැවින් මෙම රක්ෂණය පවත්වාගෙන යාමෙහි ඵලදායිතාවයක් නොමැති බව නිරීක්ෂණය කෙරේ.

(ආ) යෝජනාක්‍රමය යටතේ දායකත්වය ලබාගෙන සිටින ගොවි දායකයින්ගේ නීව දත්ත නොරතුරු ලබාගෙන, නොරතුරු පද්ධතිය යාවත්කාලීන කිරීම සඳහා ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ සභායෝගය ඇතිව 2017 අගෝස්තු 11 දින වන විට රු.5,640,925 ක් වැයකර ලබා ගත් නොරතුරු අපේක්ෂිත නොරතුරුවලින් සියයට 20 කට වඩා අඩු ප්‍රමාණයක් නිසා එම නොරතුරු සඳහම් කරගෙන පද්ධතිය යාවත්කාලීන කර නොතිබුණු නිසා අපේක්ෂිත අරමුණ ඉටුවී නොතිබුණි.

(ඇ) දායකයන් විසින් ගෙවනු ලබන වාරික පවත්නා තොරතුරු පද්ධතියට ඇතුළත් කර යාවත්කාලීනව පවත්වාගෙන ගොස් නොතිබුණු නිසා සහ ලදුපත් පරීක්ෂා කළ හැකි ලෙස ආරක්ෂිතව ගබඩා කිරීමකින් තොරව ඉවත දමා තිබීම නිසා පහත අඩුපාඩු නිරීක්ෂණය විය.

(i). "නිසි පරිදි ගෙවූ වාරික" ගණනය කිරීමට නොහැකි වීම.

(ii). සියලුම වාරික මුදල් ගෙවා තිබේද යන්න තහවුරු කර ගැනීමට නොහැකි වීම.

(iii). විශ්‍රාම වැටුප ඉල්ලූ දායකයන් ළඟ ඇති වාර මුදල් සටහන් පොතෙහි දායක මුදල ගෙවූ දිනය හෝ මුල් කුවිතාන්සි පිටපත් ලබාගෙන දායක ලැබීම් තොරතුරු තහවුරු කර ගැනීමට සිදුව තිබීම.

(iv). පිළිවෙලින් වාරික 5 ක් කඩ කිරීම පිළිබඳ දායකයින් දැනුවත් කිරීමට නොහැකි වීම.

(v). මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන දායකත්ව ආදායමෙහි සම්පූර්ණත්වය සහ නිවැරදිභාවය ගිණුම් තැබීමේදී හා විගණනයේදී තහවුරු කර ගත නොහැකි වීම.

(vi). වාරික මුදල් ආදායම උපචිත පදනමට ගිණුම්ගත කිරීමට නොහැකි වීම.

(vii). මාසික සහ අර්ධ වාර්ෂික වාරික ගෙවනු ලබන ගොවීන් විසින් වයස අවුරුදු 60 සම්පූර්ණ වූ පසු විශ්‍රාම වැටුප සඳහා ඉල්ලීම් කරනු ලබන තුරු, විශ්‍රාම වැටුප ගණනය කිරීමට මණ්ඩලයට තොරතුරු නොමැති වීම.

(viii). ග්‍රාමීය බැංකු සහ විවිධ සේවා සමුපකාර සමිති වැනි නියෝජිත ආයතනවලින් සහ දිස්ත්‍රික් කාර්යාලවලින් අයකරන වාරික මුදල් ප්‍රේෂණය කිරීමට ප්‍රමාද වන අවස්ථාවලදී එය හඳුනා ගැනීමට නොහැකි වීම.

(ඈ) නව ගොවි විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ යෝජනාක්‍රමයක් ආරම්භ කර වසර 1½ ක් ගතවී, නව දායකයින් 485 ක් යෝජනාක්‍රමයට දායකත්වය ලබාගෙන ඇතත් නිසි පරිදි වාරික ගෙවා නොමැති දායකයින් හඳුනාගෙන දැනුවත් කිරීමට කටයුතු කර නොතිබුණි.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති

10

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. ARI/C/FIPS/1/22/08/FA ඔබේ අංකය / உமது இல. / Your No. දිනය / திகதி / Date 2023 මැයි 24 දින

2 6 MAY 2023

සභාපති

කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය

ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනාක්‍රමයේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනාක්‍රමයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1990 අංක 23 දරන ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනාක්‍රම පනත සහ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, යෝජනාක්‍රමයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naoel.gov.lk

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ලී බඩු සහ සවි කිරීම , කාර්යාල උපකරණ සහ පරිගණක වැනි රු.696,175 ක් වටිනා සම්පූර්ණයෙන්ම ක්ෂය කරන ලද වත්කම් තවදුරටත් භාවිතා කරමින් පැවතිය ද ඒවා නැවත තක්සේරු කර ගිණුම්ගත කිරීමට ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 08 අනුව කටයුතු කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 37 හි 59 වන ඡේදය ප්‍රකාරව මෙම යෝජනාක්‍රමයේ සක්‍රීය දායකයන් හා ධීවර විශ්‍රාමිකයන්ගේ විශ්‍රාම වැටුප් වගකීම සඳහා ආයු ගණක තක්සේරුව කාලානුරූපීව සිදු කළ යුතු වුවද 2007 වර්ෂයෙන් පසුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින දක්වා එම ආයු ගණක තක්සේරුව සිදු කර නොතිබුණු අතර එදිනට සක්‍රීය දායකයන් හා ධීවර විශ්‍රාමිකයන්ගේ විශ්‍රාම වැටුප් වගකීම රු.5,068,050,746 ක් විය.

(ඇ) ධීවර විශ්‍රාම වැටුප් යෝජනාක්‍රමය සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මගින් අනුමත කාර්ය මණ්ඩලයක් නොමැතිව තිබියදී මණ්ඩලයේ සභාපතිගේ පෞද්ගලික ලේකම්, තමුත්තේගම දිස්ත්‍රික් කාර්යාලයේ කාර්යාල සහායක සහ මන්නාරම දිස්ත්‍රික් කාර්යාලයේ කළමනාකරණ සහකාර නිලධාරියෙකු සේවයේ යොදවාගෙන ඒ තිදෙනාට වැටුප් ලෙස එකතුව වූ රු.2,209,812 ක් ගෙවා යෝජනාක්‍රමයේ වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ඈ) 2019 වර්ෂයෙන් ඉදිරියට රැගෙන එන ලද රු.98,000 ක ධීවර මරණ පාරිතෝෂක අරමුදලෙහි ගෙවිය යුතු ශේෂය 2020 වර්ෂයේ නිරවුල් කර ඇතත් එම නිරවුල් කිරීම සඳොස් ලෙස ගිණුම්ගත කිරීම නිසා ශේෂය සමාලෝචිත වර්ෂයේදී ද ඉදිරියට රැගෙන විත් තිබුණි.

(ඉ) යෝජනාක්‍රමයේ මුළු වත්කම් රු.663,412,060 ක් සහ මුළු වගකීම් රු.5,140,628,886 ක් පැවති අතර වත්කම් ඉක්මවූ වගකීම් රු.4,477,216,826 ක් විය. මෙම අවාසිදායක තත්ත්වය යෝජනාක්‍රමයේ අඛණ්ඩ පැවැත්ම කෙරෙහි අහිතකර ලෙස බලපා තිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, යෝජනාක්‍රමය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය යෝජනාක්‍රමය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙවැනි පැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා යෝජනා ක්‍රමයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

යෝජනාක්‍රමයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, යෝජනාක්‍රමයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවශ්‍යතාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් මිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් මිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම් ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, වාසප ලේඛන සැකසීමෙන්, වෙනකාන්චිත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවශ්‍යතාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම සිතිය අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද නිෂ්පාදිකරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, නිෂ්පාදිකරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් යෝජනාක්‍රමයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබෙද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව නිෂ්පාදිකරණය සඳහා යෝජනාක්‍රමයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම් යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. හෙතෙම් වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- මූල්‍ය ප්‍රකාශනවල වපුරය හා අන්තර්ගතය සඳහා සමස්ත වූ නඟුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන ආරක්ෂවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව යෝජනාක්‍රමයේ මූල්‍ය ප්‍රකාශනය ඉහත වර්ෂය සම්බන්ධ අනුරූප වේ.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මාගේ වාර්තාවේ මාතෘකා සඳහා පදනම් කොටසේ 1.2 (අ), (ආ), (ඇ), (ඈ) සහ (ඉ) හි දක්වා ඇති නිරීක්ෂණ හැර ඉහත වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිරීක්ෂණයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 නීති,රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම විගණනයේදී නිරීක්ෂණය විය.

නීති, රීති හා රෙගුලාසි	නිරීක්ෂණ
(අ) 1990 අංක 23 දරන ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනාක්‍රම පනත	
(i) 5 (1) වගන්තිය	වයස අවුරුදු 18 සහ 59 අතර යම් ධීවරයෙකුට මෙම ධීවර විශ්‍රාම වැටුප් යෝජනාක්‍රමයට බැඳීමට හිමිකම් ඇතත් 2018 වර්ෂයෙන් පසු යෝජනාක්‍රමයට ධීවර විශ්‍රාම වැටුප් සාමාජිකයන් බඳවාගෙන නොතිබුණි.
(ii) 7 වගන්තිය	යෝජනාක්‍රමයට දායක වී සිටින ධීවරයින් සඳහා වයස අවුරුදු 60 සම්පූර්ණ වන විටම විශ්‍රාම වැටුප් ප්‍රදානය කිරීමේ ක්‍රමවේදයක් නොතිබීම හේතුවෙන්, යෝජනාක්‍රමයට දායකත්වය ලබා සිටින 64,117 ක් වූ ධීවර ප්‍රජාව වෙත ප්‍රතිලාභ ලබා දීමේදී පනත අධ්‍යයනය විය.

- ප්‍රතිලාභ අයදුම් කළ යුතු බව සහ අයදුම් කළ යුතු ආකාරය දැනුවත් කිරීමේ ක්‍රියාකාරිකයක් ගෙන නොතිබීම.

  මේ හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට යෝජනාක්‍රමයට අයත වයස අවුරුදු 60 ඉක්මවා විශ්‍රාම වයසට පැමිණ සිටි 27,976 ක් වූ සිවර දායකයින්ගෙන් 22,402 ක් වෙත සිවර විශ්‍රාම වැටුප් ප්‍රතිලාභය ප්‍රදානය කර නොතිබුණි. එම ප්‍රතිශතය සමාලෝචිත වර්ෂයේ අවසානයට වයස අවුරුදු 60 සම්පූර්ණ වූ මුළු දායකයින්ගෙන් සියයට 80 ක් විය.

- දායකයෙකු වයස අවුරුදු 60 සම්පූර්ණ වූ දින සිට ඔහු විශ්‍රාම වැටුප් සඳහා හිමිකම් ලබන නමුත්, යෝජනාක්‍රමය විසින් නිහ විශ්‍රාම වැටුප් මුදල් නොගෙවා විශ්‍රාම වැටුප් සහක් කළ දින සිට ගෙවීම් කිරීම.

  මේ හේතුවෙන් 2009 ජනවාරි සිට 2016 දෙසැම්බර් දක්වා කාලයට අදාළව විශ්‍රාම වැටුප් ප්‍රදානය කළ සිවරයන් 137 ක් සඳහා රු.4,063,063 ක් සහ 2022 වර්ෂයේදී විශ්‍රාම වැටුප් ප්‍රදානය කළ සිවරයින් 83 ක් සඳහා රු.1,675,851 ක් ලෙස එකතුව රු.5,738,917 ක් නිහ විශ්‍රාම වැටුප් ලෙස මුදලා ප්‍රකාශනවල ප්‍රතිපාදනය කර තිබුණු නමුත් සිවරයන් වෙත ගෙවීමට කටයුතු කර නොතිබුණි.

- ඉල්ලීම් කළ සිවරයන් වෙත විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ සහක් කර ප්‍රතිලාභ ලබා දීමට වයස අවුරුදු 60 සම්පූර්ණ වී මාස 1 සිට අවුරුදු 07 ක් දක්වා කාලයක් ප්‍රමාද කර තිබුණි.

(iii)16 වගන්තිය

මෙම යෝජනාක්‍රමයේ දායක මුදල් ගෙවීමේදී අනුයාම වාරික දායක් සඳහා වාරික මුදල් නිසිපරිදි නොගෙවීම මත දායකයෙකුට ප්‍රතිලාභ අහිමි වී ඇති අවස්ථාවක ඒ බව දායකයා වෙත දැනුවත් කිරීම් කළ යුතු වුවද එම දැනුවත් කිරීම් සිදුකර නොතිබුණි.

- එම නිසා වයස අවුරුදු 60 සම්පූර්ණ වූ විශ්‍රාම වැටුප් හිමිකම් ඉල්ලා සිටින වර්ෂයේදී පුද්ගලයින් 42 ක් සහ සමාලෝචිත වර්ෂයේදී පුද්ගලයින් 41 ක් ඉදිරිපත් කළ අයදුම්පත් වාරික මුදල් නිසිපරිදි නොගෙවීම මත ප්‍රතිලාභ අහිමි වී තිබුණි.

- සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 වන විට වයස අවුරුදු 60 සම්පූර්ණ කර නොතිබුණු වාරික ගෙවීමින් යෝජනාක්‍රමයෙහි දායකත්වය ලබාගත් පිරිවරයන් 24,867 ක් සිට නමුත් විගණිත දිනය වන විට සක්‍රීය ලෙස වාරික ගෙවීමින් දායක වී සිටි පිරිවරයින් ගණන 120 ක් විය. දිස්ත්‍රික් පිවර කාර්යාලවල පිවර පරීක්ෂක, සහකාර අධ්‍යක්ෂ, ලිපිකරු යන නිලධාරීන් වෙත වාරිකයකට රු.11 බැගින් කොමිස් මුදලක් ලබා දී තිබුණද පිවරයන්ට විශ්‍රාම වැටුප් ප්‍රතිලාභය අහිමිවන හේතු පිළිබඳ එම නිලධාරීන් විසින් පිරිවරයින් දැනුවත් කර නොතිබුණි.

(iv) 20 වැන්නිය යෝජනාක්‍රමය ක්‍රියාත්මක කිරීම සඳහා ස්ථාපිත උපදේශන කාරක සභාව 2016 නොවැම්බර් මාසයෙන් පසු මෙම දක්වා රැස්වී නොතිබුණි.

ඩබ්ලිව්.ඒ.සී. වික්‍රමරත්න
විගණකාධිපති

විගණකාධිපති වාර්තා සඳහා පිළිතුරු

කෘෂිකාර්මික රක්ෂණ යෝජනා ක්‍රමයේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

1 මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

1.2 මතය සඳහා පදනම

(අ) දේපල පිරියත හා උපකරණ තුළ ඇතුලත් මෝටර් රථ ප්‍රත්‍යාගණනය කර ගිණුම් තබා ඇති අතර, අනෙකුත් වත්කම් ඓතිහාසික පිරිවැය මත ගිණුම් තබා ඇත. සම්පූර්ණයෙන් ක්ෂය කර ඇති වත්කම් අතුරින් භාවිතා කල හැකි මට්ටමේ තිබෙන වත්කම් භාවිතා කලද පූර්ණ වශයෙන් භාවිතා කල නොහැකි වත්කම් පවතී. එයින් බොහොමයක් වත්කම් නැවත භාවිතයට ගත්තද ප්‍රායෝගික වශයෙන් එම වත්කම් නැවත තක්සේරු කර ගිණුම් තැබිය නොහැකි අතර, දීර්ඝ කාලයක් පැරණි ගෘහ භාණ්ඩ, පරිගණක හා දෘඩාංග හා කාර්යාල උපකරණ ආදිය මේ තුල ඇතුලත් වේ. මෙම වත්කම් යාවත්කාලීන කිරීම්, නව උපාංග සවිකිරීම් ආදිය සිදුකල නොහැක. භාවිත තත්වයේ නොපවතින වත්කම් ඉදිරියේදී ඉවත් කිරීමට කටයුතු කරනු ඇත.

(ආ) මහියංගනය, ඇඹිලිපිටිය හා අනුරාධපුරය යන නිල නිවාසයන්හි ඉඩම් වල වටිනාකම හා ඇඹිලිපිටිය නිල නිවාසයේ වටිනාකම තක්සේරු කර ගැනීම සම්බන්ධයෙන් මේ වන විට දිස්ත්‍රික් නියෝජ්‍ය/ සහකාර අධ්‍යක්ෂකවරුන් සමග සාකච්ඡා කර අවශ්‍ය කටයුතු ආරම්භ කර ඇති අතර, කඩිනමින් එම කටයුතු අවසාන කර තක්සේරු වටිනාකම ගිණුම්ගත කිරීමට කටයුතු කරනු ලැබේ.

(ඇ) මහා භාණ්ඩාගාරයෙන් සෘජුව ලබාදෙන ප්‍රතිපාදන පමණක් මහා භාණ්ඩාගාරයෙන් ලැබීම් ලෙස දක්වා ඇත. නමුත් ධීවර විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය සඳහා ධීවර දෙපාර්තමේන්තුව මගින් ලැබෙන රු. 1,500,000/- ක මුදල සෘජුව මණ්ඩලය වෙත මහා භාණ්ඩාගාරයෙන් නොලැබෙන නිසා වෙනත් ආදායම් තුල පෙන්වා ඇත.

(ඈ) කෘෂිකාර්මික කළමනාකරණ තොරතුරු පද්ධතිය කෘෂිකර්ම අමාත්‍යාංශයේ මූලිකත්වයෙන් සිදුකරනු ලබන අතර, අදාල වියදම් කෘෂිකර්ම අමාත්‍යාංශය හරහා ප්‍රතිපූරණය කරනු ලබයි. ඊට අදාල සියළුම ගනුදෙනු නිවැරදිව ගිණුම්ගත කර ඇති අතර, ගිණුම් සටහන් මගින්ද අනාවරණය කර ඇත.

(ඉ) වන්දි ලේඛන පරිගණකගත කිරීමේ දී ඇතිවූ දෝශයක් හේතුවෙන් වගාවේ හානියට හේතුව වැරදි ලෙස පරිගණක ගත වී ඇත. එසේම එය නැවත පරීක්ෂා කිරීමේදී ද පරීක්ෂා වී නොමැති බැවින් හානියට හේතුව නිවැරදිව සටහන් නොවී අවසන් වාර්තා ප්‍රධාන කාර්යාලයට යොමුකර ඇත.

රක්ෂණ අංශයට වන්දි ලේඛන ගෙන්වා ගැනීමක් සිදු නොවන බැවින් හා අවසන් වාර්තා පමණක් ගෙන්වා ගැනීමට සිදු කරන බැවින් මෙවැනි කරුණු පරීක්ෂාවකට ලක් නොවේ. ඒ අනුව අංශයට ලැබෙන අවසන් වාර්තා වල සෙසු කරනු පරීක්ෂා කිරීමෙන් අනතුරුව වවුචර්පත් සහිතව අවසන් වාර්තා මුදල් අංශයට යොමු කර ඇත. රක්ෂණ අංශය විසින් යොමුකර ඇති නාම ලේඛන පරිදි මුදල් අංශයේ මුදල් නිදහස් කිරීමට කටයුතු කර ඇත. මේ සඳහා ජාතික රක්ෂණ භාර අරමුදලින් ලබාගෙන ඇති මුදල් ඉදිරියේදී ලැබීමට ඇති මුදල් වලින් අඩුකර ලබාගැනීමට කටයුතු කරනු ලැබේ.

දිස්ත්‍රික් කාර්යාල මගින් සිදුවන මෙම අඩුපාඩු අවම කර ගැනිම සඳහා නැවත උපදෙස් පත්‍රිකා යැවීමට කටයුතු කරනු ලැබේ. දිස්ත්‍රික් කාර්යාලයේ ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් නොමැති විම හේතුවෙන් අවස්ථානුකූලව සම්බන්ධ කරගනු ලබන නිලධාරීන් මගින් ලේඛන පරීක්ෂාකර ගැනීම ආදී කරුණු සිදුකිරීම හේතුවෙන් මෙවැනි ප්‍රමාද දෝෂයන් සිදුවී ඇත. මේ වන විට මුදල් අමාත්‍යාංශයේ අනුමැතිය ලබාගෙන අත්‍යාවශ්‍ය සේවක පුරප්පාඩු පිරවීමට කටයුතු කරමින් පවතී.

එසේම අමතර ආවරණ වාරමුදල් ගෙවා ලබාගෙන ඇති ගොවීන් සඳහා ඉහත වන්දි ගෙවීම් සිදු කර ඇති බවද මෙයින් දන්වමි.

(ඊ) මෙම මුදල දෙසැම්බර් මස දිස්ත්‍රික් පරිපාලන ගිණුම තුල ඇතුලත් වුවත්, ප්‍රධාන කාර්යාලයේ අදාල යෝජනා ක්‍රමයන්හි ගිණුම් වලට මුදල් ප්‍රේශණය වන්නේ ඊළඟ ගිණුම් වර්ෂයේ මුල් මාසය තුලදීය. එබැවින් මෙම රක්ෂණ වාර මුදල් මූල්‍ය ප්‍රකාශන සකස් කරනු ලබන වර්ෂයට අදාල නිසා එම වර්ෂයේ ආදායමට නිවැරදිව ගිණුම්ගත කර ඇති අතර, ලැබිය යුතු වාරමුදල් ලෙස මූල්‍ය ප්‍රකාශණයන්හි දක්වා ඇත.

(උ) මෙම ආයෝජන නිවැරදිව ලෙජර ගිණුම් වලට ඇතුලත් කර ඇත. එම නිසා ආයෝජන වලට අදාල ලෙජර ගිණුම් සඳහා මෙයින් කිසිදු බලපෑමක් ඇති නොවේ.

(ඌ) අදාල ටැබ් යන්ත්‍ර තොග ලේඛණයට ඇතුලත් කිරීමට කටයුතු කර ඇත.

(එ) 2018 අයවැය මගින් හඳුන්වා දුන් අනිවාර්ය බෝග වගා රක්ෂණය සඳහා බෝග වර්ග 06 ක් සඳහා රු. 40,000/- ක උපරිම වන්දියක් ලබාදීමට මෙම රක්ෂණ යෝජනා ක්‍රමය හඳුන්වා දී ඇත. මේ සඳහා අක්කරයකට රු. 675/- බැගින් 2018 වර්ෂයේදී රුපියල් මිලියන 2,200 ක් වෙන්කර ඇති අතර, මෙම යෝජනා ක්‍රමය සඳහා වාර මුදල් ගිණුම්ගත කරනුයේ ඉහත යෝජනා ක්‍රමයට අදාල ඉහත අයවැය යෝජනාවට හා අනුමත කැබිනට් මණ්ඩල පත්‍රිකාවට අනුව වන අතර, 2022 වන විට මණ්ඩලයට ලැබිය යුතු වාර මුදල් ලෙස රුපියල් මිලියන 4.249 ක මුදලක් පවතී.

(ඒ) (i) මණ්ඩලයේ මුදල් ප්‍රවාහ ප්‍රකාශය තුල මෙහෙයුම් ක්‍රියාකාරකම් තුළින් ජනනය වූ මුදල් ප්‍රවාහ ගණනය කිරීමේදී පෙර වර්ෂවලසේම ඉදිරිපත් කර ඇත. විගණනය විසින් පෙන්වාදුන් අඩුපාඩු නැවත සමාලෝචනය කර නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. මෙවෙනස්කම් නිසා මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ අන්තර්ගතය සඳහා බලපෑමක් නොවන අතර, ඉදිරිපත් කිරීමේ දෝශ නැවත සකස් කරනු ලැබේ.

(ii) ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනනයවූ මුදල් ප්‍රවාහය ගණනය කිරීමේදී මූල්‍ය නොවන ප්‍රවාහයන් ඉවත්කර නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ.

(iii)ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට අදාලව ලැබෙන මුදල් ජංගම ගිණුම හරහා එම යෝජනා ක්‍රමයට මාරු කරන බැවින් මෙම යෝජනා ක්‍රමයේ මුදල් ප්‍රවාහයක් ලෙස හඳුනා නොගනී.

1.3 මණ්ඩලයේ 2021 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

1.4 <u>මූල්‍ය ප්‍රකාශණ පිළිබඳ කළමණාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම.</u>

1.5 <u>මූල්‍ය ප්‍රකාශණ විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම.</u>

2. <u>වෙනත් නෛතික නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව.</u>

<u>නීති රීති/ විධානයට යොමුව</u>

<u>2.2.2</u>

(අ) <u>බඳවාගැනීම් පරිපාටිය</u>

- 2021 වර්ෂයේ ලබාදුන් සහකාර අධ්‍යක්ෂ පත්වීම් බඳවාගැනීම් පරිපාටියට පරිභාහිරව සිදුකර නොමැත. බඳවා ගන්නා ලද නිළධාරීන් ආයතනයේ අවශ්‍යතාවය පරිදි අනුයුක්ත කිරීමට කටයුතු කර ඇත.

4.3.1 (අ)

- සහකාර අධ්‍යක්ෂ තනතුර සඳහා ඉල්ලුම් කරන ලද, බාහිර අයදුම්කරුවන්ගේ අයදුම්පත්‍රය සමඟ ඉදිරිපත් කරන ලද සහතිකවල පිටපත් හා සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් කරනු ලබන සහතික වල නිවැරදිතාවය පිළිබඳ සෑහීමකට පත්වීමෙන් පසුව අදාල තනතුරු ප්‍රධානය කර ඇත.

  අදාල නිලධාරීන්ගේ සේවා පළපුරුද්ද පිළිබඳ අවිනිශ්චිත තත්ත්වයන් ඇතිවන අවස්ථාවලදී පමණක්, අදාල සේවා ස්ථානවලට දන්වා සේවා පළපුරුද්ද පිළිබඳ සනාථ කර ගැනීමට කටයුතු කරනු ලැබේ.

  කෙසේ වුවද බඳවාගත් නවක නිළධාරීන්ගේ පරිවාස කාලය අවසානයේදී සේවය ස්ථාවර කිරීමට ප්‍රථම අදාල තහවුරු කිරීම් ලබා ගනු ඇත.

(ආ) කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය ක්‍රියාත්මක කරනු ලබන්නේ 1990 අංක 20 දරණ කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ පනත යටතේය. එකී පාර්ලිමේන්තු පනත ප්‍රකාරව මණ්ඩලයේ අඛන්ඩ පැවැත්ම සඳහා තීරණ ගැනීමේ නිසි බලය අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පැවරී ඇත. ඒ අනුව පනතේ බලතල ප්‍රකාරව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ක්‍රියාත්මක කර ඇති තීරණයකට චක්‍රලේඛණයක් මගින් පෙන්වා ඇති කරුණක් අනුගමනය කල යුතු බව විගණනය මගින් පෙන්වා දී තිබූ බැවින් අදාල චක්‍රලේඛණය නිකුත් කර ඇති ආයතනයෙන් අනුමැතිය ලබා ගැනීම සඳහා 2019/05/10 දිනැති අංක 3/1/8/1 දරණ ලිපිය මගින් රේඛීය අමාත්‍යාංශයේ ලේඛම්වරයාගෙන් ඉල්ලුම් කර ඇත. මේ සම්බන්ධයෙන් තීරණයක් ලබා දෙන තෙක් අධ්‍යක්ෂ

මණ්ඩල තීරණය ක්‍රියාත්මක වන අතර, මේ සම්බන්ධයෙන් 2023/03/27 දිනැති අංක 3/1/8/1දරණ ලිපිය මගින් නැවත රේඛීය අමාත්‍යාංශයේ ලේකම්වරයාගෙන් ඉල්ලීමක් කර ඇති බව දන්වා සිටිමි.

(ඇ)

(i),(ii) 2022 වර්ෂය සඳහා සකස් කරන ලද ක්‍රියාත්මක සැලැස්මෙහි කෙටුම්පත කෘෂිකර්ම අමාත්‍යාංශය වෙත යොමු කර ඇත.තවද උක්ත ක්‍රියාත්මක සැලැස්ම හා පස් අවුරුදු උපාය මාර්ගික සැලැස්ම **2022 වර්ෂයේ 2022/02/23 දින පැවති 516 වන** අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමට ඉදිරිපත් කරන ලද අතර, එහිදී සාකච්ඡා වූ කරුණු අනුව **2022/04/30 දින 516** විශේෂ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමක් කැඳවමින් ඒ පිළිබඳ වැඩිදුර සාකච්ඡා කරන ලදී.

නමුත්, උක්ත කාලසීමාව තුළ මණ්ඩලීය කළමනාකරණය අස්ථාවර වීම් මත එහි අවසන් වාර්තාව අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීම සිදුනොවුණි.

නව සභාපති තුමාගේ පැමිණීමෙන් පසු ඒ වන විටත් සකස් කර අවසන් කර තිබූ 2022 ක්‍රියාත්මක සැලැස්ම හා උපාය මාර්ගික සැලැස්ම ක්‍රියාත්මක සැලැස්ම අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීමට අපේක්ෂා කරමින් තව දුරටත් සාකච්ඡා කරන ලදී. ඒ අනුව නව සංකල්පයක් යටතේ සංශෝධන කටයුතු සිදු කල යුතු වන බව තීරණය විය. එය 2022 වර්ෂයේ අවසන් මාස කිහිපය බැවින්, ඒ වන විටත් සකස් කර අවසන් කර තිබූ 2022 ක්‍රියාත්මක සැලැස්ම හා උපාය මාර්ගික සැලැස්ම අනුසාරයෙන් 2023 වර්ෂයම පදනම් කර ගනිමින් නව ක්‍රියාත්මක සැලැස්ම සකස් කිරීම සඳහා උපදෙස් ලැබුණි. එහිදී මණ්ඩලයේ දැක්ම , මෙහෙවර හා පරමාර්ථ ද වර්තමානයට හා අනාගත ඉදිරි සැලැස්ම සකස් කිරීමට ගැලපෙන අයුරින් ඉදිරි අරමුණු හා අපේක්ෂා අනුව සකස් කරන ලදී. ඒ අනුව 2023 වර්ෂය සඳහා ක්‍රියාත්මක සැලස්ම මේ වන විට සකස් කර **2022 වර්ෂයේ දෙසැම්බර් 23 පැවති 523 වන** අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමට ඉදිරිපත් කර අනුමැතිය ලබාගෙන ඇත.

2.2.3 <u>බලතල, කර්තව්‍ය, කාර්යයන්</u>

ගෙවීම් ප්‍රතික්ෂේපිත වූ ගොවීන් සඳහා සංශෝධිත ලේඛණ සකස් කර එවන ලෙස ගොවිජන සේවා මධ්‍යස්ථාන හා දිස්ත්‍රික් කාර්යාල දැනුවත් කර ඇති අතර, එසේ ලැබුණු සංශෝධිත ලේඛණ සඳහා ගෙවා ඇත. වන්දි මුදල් නැවත හිමිකම් නොපෑ ගොවීන්ගේ එකී රු. 70,800,200/- ක මුදල දිගින් දිගටම ගොවියන් විසින් හිමිකම් නොපෑම නිසා කෘෂි රක්ෂණ අරමුදල වෙත මාරු කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කල අතර, එම මුදල් කෘෂිකාර්මික දත්ත කළමනාකරණ පද්ධතිය නිර්මාණය කිරීම සඳහා ලබාදීමට අනුමැතිය හිමි වී ඇත. නමුත්, එම මුදල් එකී අරමුණ සඳහා භාවිතා නොකල බැවින් නැවත අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කර ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට නියමිතය.

2.2.4

(අ) ගාල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ තාක්ෂණ නිළධාරීන් විසින් ඉදිරිපත් කරන ලද තක්සේරු වාර්තාව පරිදි ගාල්ල දිස්ත්‍රික් කාර්යාලයේ අළුත්වැඩියාව සඳහා මුළු වියදම රු. 3,282,278.52 ක් බව සඳහන් කර ඇත. එම මුදල 2021 වර්ෂයේදී ගෙවූ අතර, 2022 වර්ෂයේදී වැඩ නිමකිරීමෙන් පසුව එම ලබාදෙන ලද මුදලින් ඉතිරි මුදල වන රු. 521.063/43 ක මුදල අංක 136267 දරණ චෙක්පත මගින් නැවත මණ්ඩලය වෙත ලබාදෙන ලදී. එම ලබාදුන් සම්පූර්ණ මුදල ගොඩනැගිලි ගිණුමට හර කර ඇති අතර, 2022 වර්ෂයේදී ලබාදුන් ඉතිරි මුදල එම ගිණුමෙන් ඉවත් කර නිවැරදි කිරීමට කටයුතු සිදුකර ඇත.

(ආ) 2020/21 මහ කන්නය සඳහා අම්පාර, අනුරාධපුර, ගම්පහ, හම්බන්තොට, කිලිනොච්චි, කුරුණෑගල හා වවුනියාව යන දිස්ත්‍රික්ක සඳහා දර්ශක නිෂ්පාදක (Index Product) සකස් කරන ලදී. එම නිෂ්පාදක සඳහා වන්දි ගණනය කිරීම ද සිදුකරන ලදී. නමුත් වර්ෂාපතන දත්ත මගින් ලද ගණනය කිරීම්, ක්ෂේත්‍ර නිරීක්ෂණ හා නොගැලපීම හේතුවෙන් වන්දි ගෙවීම් සඳහා භාවිතා නොකරන ලදී. 2020, 2021 වර්ෂ වල පැවති කොවිඩ් වසංගත තත්වය හේතුවෙන් වගා හානි වාර්තා වීම්, හානි අධීක්ෂණ කටයුතු ආදිය ප්‍රමාද සහිතව සිදුවීම නිසා දර්ශක ප්‍රතිඵල ක්ෂේත්‍ර අධීක්ෂණ ප්‍රතිඵල සමග සන්සන්දනය කිරීමට නොහැකිවූ බැවින් ද කාලගුණික දත්ත ලබාගැනීමේදී සිදුවූ ප්‍රමාදයන් හේතුවෙන්, එම ගණනය කිරීම් අනුව වන්දි ගෙවීම් සිදුකර නොමැත.

(ඇ) කෘෂිකාර්මික තොරතුරු කළමනාකරණ දත්ත පද්ධතිය කෘෂිකර්ම අමාත්‍යාංශයේ අධීක්ෂණය යටතේ, කෘෂිරක්ෂණ මණ්ඩලයේ ක්‍රියාකාරීත්වයට ඔබ්බෙන් විශාල කාර්ය පරාසයක් ඉටුකර ගැනීමට සකස් කල දත්ත පද්ධතියක් බැවින්, මෙම දත්ත පද්ධතිය ක්‍රියාවට නැංවීමට ඒ ඒ ආයතන පුළුල් ලෙස දැනුවත් කිරීම සඳහා අවශ්‍ය පුහුණුවීම් කටයුතු මෙම වැඩසටහන යටතේ සිදුකර ඇත.

2.3 <u>**වෙනත් කරුණු**</u>

(අ) 2020/2021 මහ කන්නයේ සිට වන්දි ගෙවීමේදී 2017 වක්‍රෙල්ඛනයේ සඳහන් හදිසි අනතුරු රක්ෂණ ඔප්පුව නිකුත් කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලයෙන් උපදෙස් ලද බැවින් මේ වන විට රක්ෂණ ඔප්පු ලබාදීමට කටයුතු කර ඇත.

(ආ) ඇඹිලිපිටිය නිළ නිවස ප්‍රධාන කාර්යාලීය නිළධාරීන් විසින් පරීක්ෂාවට ලක්කල අතර, වසර ගණනාවක් පැරණි නිසා අළුත්වැඩියාව සඳහා විශාල මුදලක් වැයවේ. වර්ථමානයේ ගොඩනැගිලි ඉදිකිරීම සඳහා සීමා පනවා ඇති නිසා මෙම තත්වය උදාවී ඇත. මෙම ඉඩම සඳහා තක්සේරු වාර්තාවක් ලබාගැනීමට ඇඹිලිපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත යවා ඇති නමුත්, තාක්ෂණික නිළධාරීන්ගේ සීමිත බව නිසා තක්සේරු වාර්තාව ලැබී නොමැත.

(ඇ) ඇඹිලිපිටිය නිල නිවස සහිතව ඉඩම වටා නැවත වැට ගැසීම සඳහා හා අනවසර වගාකිරීම් ඉවත්කරන ලෙසත්, අදාල වගාකිරීම් සිදුකරනු ලබන පුද්ගලයින් සොයා බලා එම අනවසර වගාකිරීම් නවතන ලෙසත් උපදෙස් ලබාදෙන ලෙස දන්වා දිස්ත්‍රික් සහකාර අධ්‍යක්ෂ දැනුවත් කිරීමට කටයුතු කර ඇත.

(ඈ) රටතුල උද්ගත වූ අර්බුධකාරී තත්ත්වය තුල අදාල සම්මුඛ පරීක්ෂණ කටයුතු නිසි පරිදි පැවැත්වීමට කටයුතු කල නොහැකි වූ අතර, බඳවා ගැනීමේ කටයුතු අඩාල විය. මේ වනවිට 2023 වර්ෂයේ පැවති සම්මුඛ පරීක්ෂණය මගින් සහකාර අධ්‍යක්ෂ (තොරතුරු තාක්ෂණ) තනතුර සඳහා බඳවා ගැනීම් අවසන් කර ඇත.

(ඉ) සම්මුඛ පරීක්ෂණයෙන් ඉහළ ලකුණු ලබාගත් අයදුම්කරුවන් සේවයට කැඳවීම සඳහා කටයුතු කරන ලද අතර, එම අයදුම්කරුවන් සේවයට වාර්තා නොකිරීම පිළිබඳ මණ්ඩලයට කරුණු දැක්විය නොහැකිය.

(ඊ) කිසියම් අයදුම්කරුවෙකු සතුව සහතිකපත් විශාල ප්‍රමාණයක් පවතින අවස්ථාවකදී වුවද සහතිකපත් වල පිටපත් අමුණන ලෙස අයදුම් කැඳවීමේදී දක්වා ඇති විටෙකදී, අවශ්‍ය මූලික සුදුසුකම් වලට අදාල පිටපත් ඇමිණීම සමාන්‍ය පරිචය වේ. ඒ අනුව යම්කිසි තනතුරක් සඳහා උපරිම වයස් සීමාව දක්වා ඇති විටෙකදී අදාල වයස සනාථ කර ගැනීමට අදාල උප්පැන්න සහතිකයේ පිටපතක්,ජාතික හැඳුනුම්පතේ පිටපතක්, රියදුරු බලපත්‍රයේ පිටපතක් හෝ ගමන් බලපත්‍රයේ පිටපතක් අමුණා නැති අවස්ථාවලදී අදාල අයදුම්පත් ප්‍රතික්ෂේප කිරීමට කටයුතු කර ඇත.

(උ) 2022 ක්‍රියාත්මක සැලැස්ම හා උපායමාර්ගික සැලස්ම නව සංකල්පයක් හා ආකෘතියක් යටතේ සකස් කෙරුණු අතර හා එහිදී ලැබුණු අදහස් පාදක කර ගනිමින් 2023 ක්‍රියාත්මක සැලස්ම සකස් කරන ලද බැවින් මෙහි දක්වා ඇති පරිදි එම වියදම් නිෂ්කාර්ය වියදමක් නොවේ. ඒ අනුව 2023 වර්ෂය සඳහා ක්‍රියාත්මක සැලස්ම මේ වන විට සකස් කර **2022 වර්ෂයේ දෙසැම්බර් 23 පැවති 523 වන** අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමට ඉදිරිපත් කර අනුමැතිය ලබාගෙන ඇත.

(ඌ) මූල්‍ය ප්‍රකාශනවල ඉදිරියට ගෙන එමින් පවතින මෙම ශේෂයන්, මූල්‍ය ප්‍රකාශන වලින් ඉවත් කිරීමට අදාල අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා ඉදිරිපත් කර, එම ශේෂයන් මෙම ගිණුම් වර්ෂය තුලදී ඉවත් කිරීමට කටයුතු කරනු ලැබේ.

(එ) මෙම ශේෂය දීර්ඝ කාලීනව පවතින ශේෂයක් බැවිනුත්, අදාළ පාර්ශවයන් මෙම මුදල් නැවත ඉල්ලුම් නොකිරීම නිසාත්, එම මුදල් ආදායමට ගැනීමට කටයුතු කර ඇත.

(ඒ) මූල්‍ය ප්‍රකාශනවල ඉදිරියට ගෙන එමින් පවතින මෙම ශේෂයන්, මූල්‍ය ප්‍රකාශන වලින් ඉවත් කිරීමට අදාල අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා ඉදිරිපත් කර එම ශේෂයන් මෙම ගිණුම් වර්ෂය තුලදී ඉවත් කිරීමට කටයුතු කරනු ලැබේ.

<u>ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමයේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව</u>

2 <u>මූල්‍ය ප්‍රකාශන</u>

1.1 <u>මතය</u>

1.2 <u>මතය සඳහා පදනම</u>

(අ) 2007 වර්ෂයේදී ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ වගකීම පිළිබඳ සිදු කරන ලද ආයුගණක තක්සේරුව පදනම් කරගෙන විශ්‍රාම වැටුප් වගකීම ගිණුම් ගත කර ඇත. මෙම විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය ස්වයං මූල්‍ය පදනමකින් යුක්ත නොවන බැවින් මෙම යෝජනා ක්‍රමය සඳහා නව බඳවාගැනීම් සිදුනොකරන අතර, ස්වයං මූල්‍ය පදනමකින් ක්‍රියාත්මක කලහැකි නව යෝජනා ක්‍රමයක් ස්ථාපනය කර ඇත. පැරණි යෝජනා ක්‍රමයේ ගෙවීම් වාර්ෂික අයවැය ප්‍රතිපාදන තුලින් වාර්ෂිකව ගෙවීම් කරනු ලබන අතර, නව ගොවි විශ්‍රාම වැටුප් ක්‍රමයේ ආයුගණක තක්සේරුව ලබාගන්නා අවස්ථාවේදී පැරණි යෝජනා ක්‍රමයේද ආයුගණක තක්සේරුව ලබාගැනීම සිදුකරනු ඇත.

(ආ) මුදල් ලැබීම් වලට අදාල තොරතුරු සඳහා නිසි අයුරින් ලෙජර් ගිණුම් පවත්වාගෙන යනු ලබයි. මාසිකව යාවත්කාලීන වන විශ්‍රාම වැටුප් නාමලේඛණය පරිගණක පද්ධතිය තුළින් ලබාගත හැක. යෝජනා ක්‍රමයේ දායකත්වය ලබාගෙන ඇති දායකයින්ගේ තොරතුරු පරිගණක පද්ධතිය තුළින් ලබාගත හැක. පසු වාරික පරිගණක ගත කිරීමේ ප්‍රමාදයන් සිදුවී ඇති බැවින් අවලංගු වූ හා අක්‍රිය වූ දායකයින් පද්ධතිය තුලින් ලබාගැනීමට අපහසු වී ඇත. මෙම තත්වය හමුවේ පසු වාරික ස්වයංක්‍රියව පරිගණක ගත කිරීම සඳහා රාජ්‍ය වාණිජ බැංකු මගින් පසු වාරික අයකර එම වාරික අප දත්ත පද්ධතියට සම්බන්ධ කරගැනීමේ විශේෂ වැඩපිළිවෙලක් ආරම්භ කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදුකර ඇත.

(ඇ) 2022 වර්ෂයේදී ගොවි විශ්‍රාම වැටුප් වියදම ලෙස රුපියල් මිලියන 4,053 ක් වර්ෂය තුළදී ගිණුම් ගතකර ඇති අතර, එම වර්ෂය සඳහා මහා භාණ්ඩාගාරයෙන් රුපියල් මිලියන 3,998 ක් ලැබී ඇත. ඒ අනුව, මහා භාණ්ඩාගාරයෙන් ලැබුණු මුදල් සියල්ල ගෙවා ඇති අතර, ආදායම් ප්‍රකාශය තුළ දැක්වෙන්නේ එම මුළු වියදමෙන් දායකයින් විසින් ලබානොගෙන ආපසු ලැබුණු මුදල් අඩුකල පසු අගය වේ. මේ අනුව මහා භාණ්ඩාගාරයට ගෙවිය යුතු ශේෂයක් නොමැත.

(ඈ) 2022 වර්ෂයේදී හිමිකම් නොපෑ විශ්‍රාම වැටුප් රුපියල් මිලියන 167 ක මුදල විශ්‍රාම වැටුප් ගෙවීමේ වියදමින් අඩුකර පෙන්වා ඇත. දීර්ඝකාලීනව විශ්‍රාම වැටුප් ලබා නොගන්නා දායකයින්ගේ විශ්‍රාම

වැටුප් අත්හිටුවීමට කටයුතු කරනු ලැබේ. එම නිසා මෙම හිමිකම් නොපෑ මුදල ලැබිය යුතු විශ්‍රාම වැටුපක් ලෙස ගිණුම් ගතකර නොමැත.

(ඉ) ශුද්ධ වාර මුදල් ගෙවීම්, මරණ පාරිතෝෂික හා බෙලහීන ප්‍රතිලාභ ගෙවීම් වෙනුවෙන් නිකුත් කරනු ලැබූ, ගෙවීම සඳහා ඉදිරිපත් නොකල චෙක්පත් වල කාලය ඉකුත් වූ විට එම චෙක්පත් ආදායමට ගැනීම සිදු කරනු ලබන අතර, එම චෙක්පත් සඳහා දිස්ත්‍රික් කාර්යාලය හරහා අපවෙත ලැබෙන ඉල්ලීම් අනුව නැවත චෙක්පත් නිකුත් කරනු ලබයි. කාලය ඉකුත්වන චෙක්පත් නියමිත පරිදි ලේඛණ ගතකර තබන අතර ඕනෑම අවස්ථාවක දායකයා විසින් හිමිකම් පෑමක් සිදුකරන අවස්ථාවලදී අදාල දිස්ත්‍රික් කාර්යාලයේ නිර්දේශ අනුව නැවත ආදායකයා වෙත චෙක්පත් නිකුත් කරනු ලබයි. මණ්ඩලය විසින් විශාල වශයෙන් චෙක්පත් නිකුත් කරනු ලබන අතර, එම චෙක්පත් වලින් මුදල් කර නොගන්නා චෙක්පත් නිරන්තරයෙන් සැසඳුම් වලට ලක්වේ.

(ඊ) ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට අදාල භාණ්ඩාගාරයෙන් ලැබෙන මුදල් ලබාදීම සඳහා ලැයිස්තුගත කර ඇති ගිණුම වනුයේ මණ්ඩලය සතු ලංකා බැංකුවේ යුනියන් පෙදෙස ශාඛාවේ 164667 දරණ ගිණුමය. එම ගිණුමට ලැබෙන අදාල මුදල් ජංගම ගිණුම හරහා කෘෂි රක්ෂණ යෝජනා ක්‍රමයේ සිට ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට මාරු කරනු ලැබේ.

(උ) 2010 වර්ෂයේ මහා භාණ්ඩාගාරයේ ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් පැවති කමිටු වාර්තාව පදනම් කරගෙන ගනුලැබූ තීරණයන්ට අනුව ගොවි විශ්‍රාම වැටුප් ගෙවීමේ අවශ්‍යතාවය තහවුරු කර ගැනීම සඳහා භාණ්ඩාගාරයෙන් ලද මුදල් හා හිඟ මුදල් එවකට මණ්ඩලය සතුව තිබූ ධීවර විශ්‍රාම/ කෘෂි රක්ෂණ අරමුදලෙන් යොදවා ගන්නා ලෙසත්, පසුව එම අරමුදල් පියවා ගන්නා ලෙසත් දැනුම් දී ඇත. ඒ අනුව අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය සහිතව මණ්ඩලයේ අනෙකුත් අතිරික්ත අරමුදල් ගොවි විශ්‍රාම වැටුප් ගෙවීම සඳහා යොදාගෙන ඇත. එසේ ලබා ගත් මුදල් නැවත කෘෂි රක්ෂණ යෝජනා ක්‍රමය හා ධීවර විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයන් වෙත ගෙවිය යුතුව ඇත. එසේ ලබාගත් අරමුදල් ක්‍රමිකව ගෙවීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගෙන ඇත.

(ඌ) මණ්ඩලයේ නීති වියදම් 60% ක ප්‍රතිශතයක් ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට ගිණුම්ගත කර ඇත. නමුත් විගණනයෙන් පෙන්වා දී ඇති පරිදි රුපියල් 1,348,623 ක නීති වියදම නැවත සමාලෝජනයක් සිදුකර ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ නීති වියදම් පමණක් සටහන් කර නිවැරදි කිරීමට කටයුතු කරනු ලබන අතර, වියදම් බෙදීමට අදාල කරගන්නා වියදම් ගිණුම් සියල්ල සංශෝධනය කර අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබාගැනීමට ඉදිරියේදී කටයුතු කරනු ලැබේ.

(එ) ගොවි විශ්‍රාම වැටුප් වගකීම වාර්ෂිකව වැඩිවන අතර, යෝජනා ක්‍රමය තුල ආයෝජන නොමැතිකමත් මෙම යෝජනා ක්‍රමයේ ප්‍රතිලාභ වාරික මුදල් වැඩිකිරීමකින් තොරව අවස්ථා

කිහිපයකදී රාජ්‍ය ප්‍රතිපත්ති නිසා වැඩිකිරීම හේතුවෙන් මෙම තත්වය උද්ගත වී ඇති අතර, සෑම වර්ෂයකදීම රජයේ අයවැය මගින් මුදල් වෙන්කර ගොවි විශ්‍රාම වැටුප් ගෙවීම සිදුකරගෙන යනු ලබයි.

1.3 මූල්‍ය ප්‍රකාශණ පිළිබඳ කළමණාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම.

1.4 මූල්‍ය ප්‍රකාශණ විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම.

2. වෙනත් නෛතික නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 නීති රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

(අ) i 6(1) වගන්තිය

- අවුරුදු 60 සම්පූර්ණ වූ ගොවීන් සඳහා දත්ත පද්ධතියෙන් ලබාගන්නා ලද විස්තර දිස්ත්‍රික් කාර්යාල සඳහා යොමු කරන අතර, ඉදිරියේදී විද්‍යුත් තැපෑල මගින් හා SMS පණිවුඩ මගින් ගොවීන් දැනුවත් කිරීම සඳහා වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කෙරේ. මෙයට අමතරව ගොවිජන සේවා මට්ටමින් කන්න රැස්වීම් තුළදී හා දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටු තුළදී මෙම දැනුවත් කිරීම් ගොවිජනතාව වෙත ගෙනයාම සඳහා නිළධාරීන් හා ගොවි නියෝජිතයින් දැනුවත් කිරීමට කටයුතු කරනු ලැබේ.
- දිස්ත්‍රික් කාර්යාල සඳහා ඉදිරිපත් කරන අයදුම්පත් සඳහා ප්‍රමාදයකින් තොරව විශ්‍රාම වැටුප් ලබා දීමට අවශ්‍ය උපදෙස් දිස්ත්‍රික් අධ්‍යක්ෂවරුන් වෙත ලබා දීමට කටයුතු කර ඇත. ඒ අනුව දායකයා දිස්ත්‍රික් කාර්යාලය වෙත ලිපි ලේඛණ භාරදුන් අවස්ථාවේදී එම දායකයා සඳහා අංකයක් ලබා දීමටත්, එම තොරතුරු ප්‍රධාන කාර්යාලයට එවීමට පෙර Google Drive හී යාවත්කාලීන කිරීමටත් උපදෙස් ලබා දී ඇති අතර, මේ වන විට දිස්ත්‍රික් කාර්යාල මහින් එම ක්‍රියාවලිය සාර්ථකව සිදු කරමින් පවතී.
- වයස අවුරුදු 60 සම්පූර්ණ වූ ගොවීන් දැනුවත් කිරීම සඳහා ඔවුන් විසින් ලබාදී ඇති ලිපිනයන් වෙත තැපැල්පත් යොමු කර ඔවුන් දැනුවත් කිරීමටත්, පුවත්පත් දැන්වීම් මගින් ගොවීන් දැනුවත් කිරීමටත් කටයුතු කරනු ලැබේ.
- වයස අවුරුදු 60 සම්පූර්ණ වන ගෙවීන්ගේ නාම ලේඛණ ඒ ඒ දිස්ත්‍රික් කාර්යාල වලට ලබාදීමට කටයුතු කරනු ලබන අතර, එම ලේඛණ ගොවීජන සේවා මධ්‍යස්ථාන වලට ලබාදී ඒ තුළින්ද, ගොවීන් දැනුවත් කිරීමට කටයුතු කරනු ලබන අතර, ඉදිරියේදී පුවත්පත් දැන්වීම් හා ඍජු දැනුවත් කිරීම් මගින් මෙම තත්වය මගහරවා ගැනීමට කටයුතු කරනු ලැබේ.
- 20,000 කට අධික ගොවීන් සංඛ්‍යාවක් විශ්‍රාම වැටුප් ලැබීම සඳහා පොරොත්තු ලේඛණයේ සිටි බැවින් එම ගොවීන් කඩිනමින් විශ්‍රාම වැටුප් ගෙවීම සඳහා විශ්‍රාම වැටුප් ලේඛණයට ඇතුලත් කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලදී. මෙම නිසා පොරොත්තු ලේඛණයේ සිටි ගොවීන් විශාල

සංඛ්‍යාවකට විශ්‍රාම වැටුප් ගෙවීමට හැකියාව ලැබී ඇත. ඉදිරියේදී කිසිම හිඟ මුදලක් ඇති නොවන පරිදි විශ්‍රාම වැටුප් හිමිකම ලබන අවස්ථාවේදීම විශ්‍රාම වැටුප් ලේඛණයට ඇතුලත් කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතී. තවද, ගෙවිය යුතුව පවතින හිඟ විශ්‍රාම වැටුප් ඉදිරියේදී භාණ්ඩාගාර ප්‍රතිපාදන ලබාගෙන ක්‍රමිකව ගෙවීමට නියමිතය.

ii **<u>12(ඇ) වගන්තිය</u>**

- ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය සඳහා දායක වී ඇති ගොවීන් අඛණ්ඩව වාරික 05 ක් ගෙවීම පැහැර හැරියහොත් ඔවුන්ගේ දායකත්වය අවලංගු වන අතර ඒ පිළිබඳව ඔවුන් යෝජනා ක්‍රමයට දායක වන අවස්ථාවේදී අවශ්‍ය දැනුවත් කිරීම් සිදු කරන අතර, ඔවුන් වෙත ලබාදෙන වාරික මුදල් සටහන් පොතේ සහ සහතික ඔප්පුවෙහි ඒ පිළිබඳව පැහැදිලිව සටහන් කර ඇත. එසේ දායකත්වය අවලංගු වූ ගොවීන්ගේ ගෙවූ වාර මුදල් ඔවුන්ගේ වයස අවුරුදු 60 සම්පූර්ණ වන අවස්ථාවේදී පොළියද සමගින් ප්‍රතිපූර්ණය කිරීමට කටයුතු කරනු ලැබේ.

- ගොවි විශ්‍රාම වැටුප් ගෙවීම් ක්‍රියාවලිය තැපැල් දෙපාර්තමේන්තුව සමඟ ඒකාබද්ධව සිදු කරනු ලබයි. දායකයා මියගිය අවස්ථාවන් වලදී අදාළ තැපැල් කාර්යාල මඟින් මියගිය දායකයන්ගේ තොරතුරු ලබා දෙනු ලබයි. දිගින් දිගටම විශ්‍රාම වැටුප් ලබා නොගන්නා විශ්‍රාම වැටුප් ලාභීන් පිළිබඳ අධ්‍යයනයක් සිදුකොට එම විශ්‍රාම වැටුප් ලාභීන් ගෙවීම් නාම ලේඛණයෙන් ඉවත් කිරීමට කටයුතු කරනු ලැබේ.
- ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය 1987 වර්ෂයේ ආරම්භ කරන ලද යෝජනා ක්‍රමයක් බැවින් මුල් වකවානුවේදී පරිගණක පද්ධතියක් පවත්වාගෙන ගොස් නොමැත. වාරික සටහන් පොත් පවත්වා ගැනීම තුලින් වාරික ගෙවීම් හඳුනා ගැනීමට හැකිවන පරිදි ක්‍රමවේදයන් සකසා ඇත. වාරික අයවීමේ එෆ්.එස්.බී 5 කුවිතාන්සි වාර්තා දිස්ත්‍රික් කාර්යාලය තුලද පවත්වා ගෙන යාමට කටයුතු කර ඇත. මෙම දුර්වලතාවයන් මඟහරවා ගැනීම සඳහා නව පරිගණක පද්ධතියක් ස්ථාපිත කිරීමට අවශ්‍ය කටයුතු මේ වනවිට ක්‍රියාත්මක කර ඇත. GIZ ආයතනයේ ආධාර මත E.R.P මෘදුකාංගය මිලදී ගැනිමට කටයුතු කර ඇති අතර, මේ වනවිට එම දත්ත පද්ධතිය මණ්ඩලයට ගැලපෙන අයුරින් නවීකරණය කරමින් පවතී. එම පද්ධතිය ස්ථාපිත කිරීමත් සමඟ බැංකු පද්ධතිය සමඟ සෘජු සම්බන්ධතාවයක් පවත්වා ගනිමින් දත්ත ඇතුලත් කර ගැනීමට හැකියාව උදාවනු ඇත.

  පැවති සේවක හිඟය මත පසු වාරික පරිගණකගත කිරීම සිදු කිරීමට නොහැකි වූ අතර 2022 වර්ෂයේ සිට නැවතත් පසු වාරික පරිගණකගත කිරීම ආරම්භ කිරීමට අවශ්‍ය කටයුතු සිදු කර ඇත.

iii **<u>12(ඈ) වගන්තිය</u>**

නිසි පරිදි දායක මුදල් ගෙවීම් නොකර දායකයන් හට ශුද්ධ වාර මුදල් හා පොලිය ගෙවීම් සිදු කරන බව 1987 අංක 452/12 දරණ ගැසට් පත්‍රයේ 13 වන නියෝග මඟින් දක්වා ඇත. එම ගණනය කිරීම් ජීවගණිතඥයෙකු විසින් සිදු කර ඇත.

iv **<u>15 වගන්තිය</u>**

15 වගන්තිය යටතේ වාරික ගෙවීම් පැහැර හැර ඇති දායකයින් වෙත සහන කාලයක් ලබාදීමේ හැකියාව මණ්ඩලය සතුව ඇත. ඒ අනුව විගණනය මගින් සිදුකර ඇති නිරීක්ෂණය පදනම්කොට ගෙන සම්පූර්ණයෙන් වාරික ගෙවා ඇති දායකයින් හට සහනකාලයක් ලබාදී දායකත්වය සක්‍රිය කර විශ්‍රාම වැටුප් හිමිකම් ලබාදීමට අවශ්‍ය කටයුතු සිදුකිරීමට අපේක්ෂා කෙරේ.

v **<u>27(1) වගන්තිය</u>**

2010 වර්ෂය වන විට ගොවි විශ්‍රාම වැටුප් අරමුදල ශූන්‍ය වීම නිසා 2010 හා 2011 වර්ෂවලදී ගොවි විශ්‍රාම වැටුප් ගෙවීම සඳහා එම යෝජනා ක්‍රමයේ මුදල් නොමැති විය. ඒ අනුව මුදල් අමාත්‍යාංශය විසින් ලබාදුන් නිර්දේශ හා උපදෙස් වලට අනුව කෘෂි රක්ෂණ හා ධීවර විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රම තුලින් මුදල් ලබාගෙන ගෙවීම් සිදුකර ඇත. මෙම ලබාගත් මුදල් ණය මුදලක් ලෙස ගිණුම්ගත කර ඇති අතර, එම ණය මුදල් ක්‍රමිකව ප්‍රතිපූරණය කිරීමට කටයුතු කර ඇත.

(ආ) **<u>සහතික ඔප්පුවේ 6 වගන්තිය</u>**

1987 අංක 12 දරණ ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රම පනතේ 15(1) වගන්තිය ප්‍රකාරව පිළිවෙලින් වාරික පහක් ගෙවීම පැහැර හරින යම් දායකයෙකුට ඔහු වෙත නිකුත් කරන ලද සහතිකය යටතේ වූ ප්‍රතිලාභ අහිමි වේ. ඒ අනුව මෙම දායකයින් අනුගාමී වාරික 05 ගෙවීම පැහැර හැර ඇති බැවින් දායකත්වය අවලංගු වී ඇත.

මෙම දායකයින් ගෙවූ වාරික සැළකීමේදී නිසිපරිදි ගෙවීම් සිදුකර ඇත්තේ පිළිවෙලින් වාරික 65% සහ 35% ක් පමණි. එම නිසා ශුද්ධවාර මුදල් ගෙවීමට කටයුතු කර ඇත.

3.2 **<u>අවධිමත් ගනුදෙනු</u>**

(අ) රක්ෂණ යෝජනා ක්‍රමයන්හිදී වාරික තීරණය කිරීමේදී එම වාරිකය සඳහා පරිපාලන හා මෙහෙයුම් වියදම් වලින් යම් ප්‍රතිශතයක් අන්තර්ග්‍රහණය කලයුතු වේ. මෙය රක්ෂණ ආයතනයන්හි ක්‍රියාත්මක වන සාමාන්‍ය ක්‍රමවේදයකි. කෘෂි රක්ෂණ මණ්ඩලය මගින් ක්‍රියාත්මක කරනු ලැබූ ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය, රාජ්‍ය සහනාධාරයන් පදනම්කර ක්‍රියාත්මක වූ බැවින් ඒ සඳහා ලාභාන්තිකයක් වාරිකය සඳහා අන්තර්ගත කර නොමැත. දායකත්වයෙන් ඉල්ලා අස්වීමේදී හෝ ශුද්ධ වාරමුදල් ගණනය කිරීමේදී අදාල වියදම් සඳහා යම් ප්‍රතිශතයක් අඩු

කිරීම රක්ෂණ ක්‍රමවේදයේ අන්තර්ගත සාමාන්‍ය ක්‍රමවේදයකි. ඒ අනුව එම ගණනය කිරීම් සිදුකර ඇත. එසේ නොමැතිව ස්වයං මූල්‍ය යෝජනා ක්‍රම ක්‍රියාත්මක කල නොහැක.

(ආ) නිසි පරිදි දායක මුදල් ගෙවීම් නොකර දායකයන් හට ශුද්ධ වාර මුදල් හා පොලිය ගෙවීම් සිදු කරන බව 1987 අංක 452/12 දරණ ගැසට් පත්‍රයේ 13 වන නියෝග මඟින් දක්වා ඇත. එම ගණනය කිරීම් ජීවගණිතඥයෙකු විසින් සිදු කර ඇත.

(ඇ) ප්‍රධාන කාර්යාලය හා දිස්ත්‍රික් කාර්යාලයේ සිටින සේවක මණ්ඩලය පොදුවේ සේවයේ යෙදෙන බැවින් මෙසේ අනුපාතය නිර්ණය කර ඇත. නමුත් ඉදිරියේදී මෙම අනුපාතයන් අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබාගනිමින් සමාලෝචනය කිරීමට කටයුතු කෙරේ.

3.3 <u>කාර්යසාධනය</u>

(අ) පසුගිය වර්ෂයන්හිදී යෝජනා ක්‍රමයේ උද්ගත වූ අර්බුදකාරී තත්වයන් තුල විශ්‍රාම වැටුප් ලබාදීම සඳහා පොරොත්තු ලේඛණයේ ගොවි මහතුන් 20,000 ක් පමණ සිටි අතර, මේ වන විට එම තත්වය සඳහා විසඳුම් ලබාදී ඇත. විගණනය පෙන්වා දී ඇති අයදුම්පත් 1700 සඳහා ද මේ වන විට විශ්‍රාම වැටුප් ගෙවීම සඳහා කටයුතු කර ඇත.

(ආ) වර්ෂය ආරම්භයේදී ගොවි විශ්‍රාම වැටුප් බෙලහීන මාසික දීමනා ගෙවනු ලබන ගොවීන්ගේ ජීව දත්ත තොරතුරු ලබාගනිමින් ගොවීන් පිළිබඳ විස්තර රැස්කරනු ලැබේ.

(ඇ)

i,ii,iii ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ දායකත්වය ලබා ඇති ගොවි මහතුන් වයස අවුරුදු 60 සම්පූර්ණ වීමට පෙර දැනුවත් කිරීම සඳහා විශේෂ වැඩපිළිවෙලක් සැකසීමට අපේක්ෂා කෙරේ. සියළුම දිස්ත්‍රික්ක වල වයස අවුරුදු 60 සම්පූර්ණ වීමට ආසන්න ගොවි මහතුන්ගේ නාමලේඛණය දිස්ත්‍රික් නියෝජ්‍ය/ සහකාර අධ්‍යක්ෂවරුන් වෙත ලබාදීමට කටයුතු කර ඇත. ඒ අනුව ඔවුන් ගොවිජන සේවා මට්ටමින් දැනුවත් කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරන ලෙස දැනුම් දී ඇත.
මණ්ඩලයේ පරිගණක පද්ධතිය දිස්ත්‍රික් කාර්යාල හා සම්බන්ධ කිරීමෙන් අනතුරුව ඕනෑම ගොවි මහතෙකුට ඕනෑම දිස්ත්‍රික් කාර්යාලයකින් තම සේවා ලබාගැනීමට අවශ්‍ය පහසුකම් සැළසෙනු ඇත.

iv,v විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ විශ්‍රාම වැටුප් ගෙවීම අඛණ්ඩව මේ වන විට සිදුකරන බැවින් යෝජනා ක්‍රමය පිළිබඳ විශ්වාසනීයභාවය මේ වන විට වර්ධනය වී ඇත. වාරික මුදල් ගෙවීම අතරමග නවතා දමා ඇති දායකයින් හට ශුද්ධ වාරමුදල් හා පොළිය ගෙවීම සිදුකරනු ලබයි.

vi,vii,viii ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය සඳහා දායක වී ඇති දායකයින්ගේ ඉල්ලුම්පත්‍ර භාරගැනීම නිසිපරිදි සිදුකරනු ලබන අතර, ඒ සම්බන්ධයෙන් කිසියම් මගහැරීම් සිදුවී ඇත්නම් ඒ පිළිබඳ දිස්ත්‍රික් කාර්යාල නිළධාරීන් දැනුවත් කර, කාර්යක්ෂම හා සුහදශීලී පාරිභෝගික සේවාවක් ලබාදීමට කටයුතු කරනු ලැබේ.

ix,x මණ්ඩලය මගින් ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමට නියමිත ERP දත්ත පද්ධතිය මගින්, ඔබ විසින් පෙන්වා දී ඇති පරිදි තරඟකාරී ආයතන මගින් ක්‍රියාත්මක කරනු ලබන ක්‍රමවේදයන් ක්‍රියාත්මක කර මෙම ගැටළු මගහරවා ගැනීමට හැකිවනු ඇත.

3.4 <u>කළමනාකරණ ක්‍රියාකාරකම්</u>

(අ) අවසාන ගිණුම් වාර්තා ඉදිරිපත් කිරීමේදී විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට සිදුවූ වෙනස්කම් පිළිබඳ වාර්තා ඉදිරිපත් කරනු ලැබේ.

(ආ) ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය ආරම්භයේදී මරණ හා බෙලහීන පාරිතෝෂික ගෙවීම ක්‍රියාත්මක කිරීම සඳහා දායකයින්ට අදාල වාරික මුදලක් ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව වෙත ගෙවීම සිදුකරන ලද අතර, එම ගෙවන ලද වාරිකය මණ්ඩලය තුල රඳවා ගනිමින් අරමුදලක් ගොඩනගා ගන්නා ලදී. විගණනය පෙන්වා දී ඇති පරිදි ගෙවනු ලබන වාරිකය පිළිබඳ නැවත සමාලෝචනයක් කිරීමට අපේක්ෂා කෙරේ.

(ඇ) ගොවි විශ්‍රාම වැටුප් ගෙවීම් ක්‍රියාවලිය තැපැල් දෙපාර්තමේන්තුව සමඟ ඒකාබද්ධව සිදු කරනු ලබයි. ඒ අනුව විශ්‍රාම වැටුප් ගෙවූ මාසයේ නොගෙවූ විශ්‍රාම වැටුප් ඊළඟ මස 10 වන දිනට ප්‍රථම මණ්ඩලය වෙත එවීමට කටයුතු කල යුතුවේ. රටේ ඇතිවූ කොරෝනා වසංගත තත්ත්වය හා අර්බුදකාරී තත්ත්වය මත යම් ප්‍රමාදයන් සිදු වුවද මේ වනවිට එම ප්‍රමාදයන් මඟහරවා ගැනිමට කටයුතු කර ඇත. කෙසේ වුවද නියමිත දින වකවානු තුලදී නොගෙවූ විශ්‍රාම වැටුප් ලේඛණයන් මණ්ඩලය වෙත එවන ලෙස දිසාගණකාධිකාරීවරුන් දැනුවත් කිරීමට අවශ්‍ය පියවර ගෙන ඇත.

(ඈ) 1987 වර්ෂයේදී ආරම්භ කරන ලද ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ වාරික අයවීම් ගොවියා වෙත ලබා දෙනු ලබන වාරික සටහන් පොත තුල සටහන් කිරීම තුලින් හඳුනාගත හැකි අයුරින් සකසා ඇති මෙම වාරික සටහන් පොත්වල තොරතුරු සමීක්ෂණය මඟින් එක්කොට පිටපත් ලබා ගැනීම සඳහා කටයුතු සිදු කලද අදාල සමීක්ෂණ කටයුතු මඟින් තොරතුරු ලබා ගැනිම ඉතා දුෂ්කර වීම නිසා අපේක්ෂිත ලෙස තොරතුරු ලබා ගැනීමට නොහැකි විය.

(ඉ) ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය 1987 වර්ෂයේ ආරම්භ කරන ලද යෝජනා ක්‍රමයක් බැවින් මුල් වකවානුවේදී පරිගණක පද්ධතියක් පවත්වාගෙන ගොස් නොමැත. වාරික සටහන් පොත් පවත්වා ගැනීම තුලින් වාරික ගෙවීම් හඳුනා ගැනීමට හැකිවන පරිදි ක්‍රමවේදයන් සකසා ඇත. වාරික අයවීමේ එෆ්.එස්.බී 5 කුවිතාන්සි වාර්තා දිස්ත්‍රික් කාර්යාලය තුලද පවත්වා ගෙන යාමට කටයුතු කර ඇත. මෙම දුර්වලතාවයන් මඟහරවා ගැනීම සඳහා නව පරිගණක පද්ධතියක් ස්ථාපිත කිරීමට අවශ්‍ය කටයුතු මේ වනවිට ක්‍රියාත්මක කර ඇත. GIZ ආයතනයේ ආධාර මත E.R.P මෘදුකාංගය මිලදී ගැනිම සඳහා ප්‍රසම්පාදන කටයුතු මේ වනවිට අවසන් කර එම පද්ධතිය ස්ථාපිත කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. එම පද්ධතිය ස්ථාපිත කිරීමත් සමඟ බැංකු පද්ධතිය සමඟ සෘජු සම්බන්ධතාවයක් පවත්වා ගනිමින් දත්ත ඇතුලත් කර ගැනීමට හැකියාව උදාවනු ඇත.

පැවති සේවක හිඟය මත පසු වාරික පරිගණකගත කිරීම සිදු කිරීමට නොහැකි වූ අතර 2022 වර්ෂයේ සිට නැවතත් පසු වාරික පරිගණකගත කිරීම ආරම්භ කිරීමට අවශ්‍ය කටයුතු සිදු කර ඇත.

(ඊ) ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය මනා කළමණාකරණයකින් යුතුව පවත්වා ගැනීම සඳහා Enterprise Resources Plan කළමණාකරණ තොරතුරු පද්ධතියක අවශ්‍යතාවය මණ්ඩලය මඟින් හඳුනාගෙන ඇත. දිගු කාලයක් තිස්සේ මෙම මෘදුකාංග මණ්ඩලය වෙත ලබා ගැනීමට උත්සහ කලද, විවිධ හේතූන් මත එම උත්සහයන් සාර්ථක කර ගැනීමට නොහැකි විය. GIZ ආයතනය මඟින් මෙම තොරතුරු පද්ධතිය මණ්ඩලය වෙත ලබා ගැනීම සඳහා ආධාර ලබා දීමට එකඟ වී ඇත. ඒ අනුව මේ වන විට එම තොරතුරු පද්ධතිය ලබා ගැනීම සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය අවසන්කර මෘදුකාංගය මණ්ඩලය වෙත ලබා ගැනිමට අවශ්‍ය කටයුතු සිදුකර ඇත.

(උ) GIZ ආයතනයේ ආධාර යටතේ ලබා ගැනීමට අපේක්ෂිත E.R.P තොරතුරු පද්ධතිය ලබා ගන්නා තෙක් නව විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ තොරතුරු පවත්වා ගැනීම සඳහා මණ්ඩලයේ දෘඩාංග සහ ජාලකරන ශිල්පීවරයා ලවා සරල තොරතුරු පද්ධතියක් නිර්මාණය කරන ලදී. මේ වන විට එම තොරතුරු පද්ධතියට නව බඳවා ගැනීම් පිළිබඳ දත්ත ඇතුලත් කර ඇත. ඉදිරියේදී වාරික ගෙවනු නොලබන ගොවි මහතුන් හට SMS පණිවුඩ හරහා දැනුවත් කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරනු ලැබේ.

<u>ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමයේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව</u>

3 <u>මූල්‍ය ප්‍රකාශන</u>

1.1 <u>මතය</u>

1.2 <u>මතය සඳහා පදනම</u>

(අ) දීර්ඝකාලීන ලී බඩු හා සවි කිරීම් පරිසණක උපාංග කාර්යාල උපකරණ ආදිය භාවිතා කලද එම උපකරණ අගය කර ඵලදායී ජීවිත කාලය තක්සේරු කල නොහැක. බොහෝමයක් වත්කම් ඉවත් කල යුතු තත්වයේ පවතින අතර පරිසණක වැනි උපකරණ යාවත්කාලීන කල හැකි තත්වයේ නොපවතියි. මෙම වත්කම් පූර්ණ කාර්යක්ෂමතාවයෙන් භාවිතා කල නොහැකි තත්වයේ පවතින බැවින් ඉදිරියේදී ඉවත් කිරීමට කටයුතු කරනු ලැබේ.

(ආ) මණ්ඩලයේ අළුතින් ආරම්භ කර ඇති අනෙකුත් සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රම සමග ආයුගණක තක්සේරු සිදුකිරීමට කටයුතු කරනු ලබන අතර, එය 2023 වර්ෂයේ අයවැය ලේඛණය තුළ ඇතුලත්ය.

(ඇ) මෙම නිලධාරීන් බඳවාගෙන ඇත්තේ මෙම යෝජනා ක්‍රමයේ රාජකාරී ඉටු කිරීමට වන අතර වර්තමානයේ වෙනත් රාජකාරි කටයුතු සිදු කරනු ලබයි. යෝජනා ක්‍රමයට අයත් රාජකාරි වක්‍රාකාරයෙන් වෙනත් නිලධාරීන්ද සිදු කරනු ලබන නිසා මෙම නිලධාරීන්ගේ වැටුප යෝජනා ක්‍රමයට ඇතුලත් කර ඇත. ප්‍රමාණවත් සේවක සංඛ්‍යාවක් බඳවා ගැනීමෙන් පසු යෝජනා ක්‍රමයට අදාල සේවකයින්ගේ වැටුප් යෝජනා ක්‍රමයට අන්තර්ග්‍රහණය කිරීමට නියමිතය.

(ඈ) මෙම මුදල මරණ පාරිතෝෂික අරමුලින් හා ධීවර විශ්‍රාම වැටුප් අරමුදල් තුලින් ගැලපීම් සිදුකොට 2023 වර්ෂයේ අවසන් ගිණුම් පිළියෙල කිරීමේදී නිවැරදිව දැක්වීමට කටයුතු කරනු ලැබේ.

(ඉ) මෙම යෝජනා ක්‍රමය ස්වයං මූල්‍ය පදනමකින් ක්‍රියාත්මක නොවන අතර, වාරික තීරණය කිරීමේදී රාජ්‍ය සහනාධාරයට අන්තර්ග්‍රහණය කිරීම නිසා මෙම තත්වය උද්ගත වී ඇත. ඒ අනුව වාර්ෂිකව ගෙවිය යුතු විශ්‍රාම වැටුප් වගකීම ඉහළ යනු ලබන අතර එම නිසා ශුද්ධ වත්කම් අගයද අඩු වේ. එම හේතු නිසා මෙම යෝජනා ක්‍රමය සඳහා නව බඳවා ගැනීම් සිදු කිරීම ප්‍රවර්ධනය නොකරයි.

1.3 මූල්‍ය ප්‍රකාශණ පිළිබඳ කළමණාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම.

1.4 මූල්‍ය ප්‍රකාශණ සම්බන්ධයෙන් විගණකගේ වගකීම.

2. වෙනත් නෛතික නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 නීති රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

(අ) i 5 සහ 6 වගන්ති

ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය මේ වන විට මූල්‍ය ශක්‍යතාවයක් සහිතව ක්‍රියාත්මක කිරීමට කටයුතු සම්පාදනය කර ඇත. එම කටයුතු පරිගණක ගත පරිසරයක් තුල සිදුකිරීම සඳහා මේ වන විට පූර්ණ පරිගණක දත්ත පද්ධතියක් සකස් කරමින් පවතී. ඒ අනුව මෙම යෝජනා ක්‍රමය සඳහා ධීවරයින් ආකර්ශණය කරගැනීමට 2023 වර්ෂය තුළදී ධීවර අමාත්‍යාංශය සමග ඒකාබද්ධව නව ධීවර විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයක් හඳුන්වාදීමට අවශ්‍ය පියවර ගනිමින් පවතී.

ii 7 වගන්තිය

වයස අවුරුදු 60 සම්පූර්ණ වන දායකයින්ගේ ලැයිස්තු දිස්ත්‍රික් කාර්යාල මට්ටමින් ලබාගෙන ඒ ඒ දිස්ත්‍රික් කාර්යාල වෙත යවා ඇති අතර, එම ලැයිස්තු පදනම් කරගෙන විශ්‍රාම වැටුප් හිමි ධීවරයින්ව දැනුවත් කිරීමේ වැඩසටහනක් ආරම්භ කර ඇත.

ධීවර විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට අදාල මෙහෙයුම් කටයුතු ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව මගින් සිදුකරන බැවින් මෙම තත්වය එම දෙපාර්තමේන්තුව වෙත දැනුම්දීමට කටයුතු කර ඇත. තවද, දිස්ත්‍රික් ධීවර කාර්යාල මගින් සිදුකරන දැනුවත් කිරීම් වලට අමතරව පුවත්පත් දැන්වීමක් මගින් ධීවර ජනතාව දැනුවත් කිරීමට අවශ්‍ය කටයුතු කරනු ලැබේ.

ප්‍රමාද වී ලැබී ඇති අයදුම්පත් සඳහා ප්‍රමාදවීමට හේතුවූ කරුණු දන්වන තුරු හිඟ විශ්‍රාම වැටුප් ගෙවීම සිදුනොකරන ලදී. මේ වන විට හිඟ විශ්‍රාම වැටුප් සහිතව විශ්‍රාම වැටුප් ගෙවීම සිදුකරනු ලබයි.

iii 13 (ඈ) වගන්තිය

මණ්ඩලය විසින් දැනට දායකයා ගෙවූ වාරික පදනම් කරගනිමින් එම වාරික සඳහා පොළී අනුපාතයක් ගෙවනු ලබන අතර, මෙම ශුද්ධ වාරික ගෙවීම ජීවගණිතඥයෙකුගේ උපදෙස් මත සිදුකරනු ලබයි.

iv <u>16 වගන්තිය</u>

මේ පිළිබඳව දායකයින් විශ්‍රාම වැටුපට දායක කරගැනීමේදී ඔවුන් වෙත ලබාදෙනු ලබන විශ්‍රාම වැටුප් ඔප්පුවේ පැහැදිලිව සටහන් කර ඇති අතර, දායකයින්ගේ වාරික අයකර ගනු ලබන්නේ දිස්ත්‍රික් ධීවර ව්‍යාප්ති නිළධාරීන් මගින් වන අතර, එම දායකයා දායකත්වය අවලංගු වූ අයෙක්ද යන වග සොයා බලා වාරික මුදල් අයකර ගැනීම සම්බන්ධයෙන් අවශ්‍ය උපදෙස් අඛණ්ඩව ඔවුන් වෙත ලබාදීමට මණ්ඩලය විසින් කටයුතු කරනු ලබයි.

v <u>20 වගන්තිය</u>

ධීවර විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ නව බඳවාගැනීම් 2023 වර්ෂයතුළදී ආරම්භ කිරීමට නියමිත බැවින් ධීවර විශ්‍රාම වැටුප් උපදේශක කාරකසභාව මෙම වර්ෂය තුළ කැඳවීමට කටයුතු කරනු ලැබේ.

vi <u>26 වගන්තිය</u>

මණ්ඩලයේ අතිරික්ත අරමුදල් මුදල් විෂය භාර අමාත්‍යාංශය විසින් නිකුත් කර ඇති චක්‍රලේඛණ හා උපදෙස් වලට අනුව රාජ්‍ය බැංකු තුළ පමණක් භාණ්ඩාගාර බිල්පත් වල, භාණ්ඩාගාර බැදුම්කර වල හා ස්ථාවර තැන්පතු වල ආයෝජනය කර ඇත.

(ආ) <u>396 (ඈ) (iii)</u>

නිකුත් කල නමුත් ගෙවීමට ඉදිරිපත් නොවී මසකට වඩා වැඩියෙන් පවතින චෙක්පත් සඳහා වෙනම රෙජිස්ටරයක් පවත්වාගෙන යනු ලබන අතර, එම චෙක්පත් සම්බන්ධයෙන් චෙක්පත් ලාභීන් විසින් සෘජුව කරනු ලබන ඉල්ලීම් සඳහා දිස්ත්‍රික් කාර්යාලයේ නිර්දේශ ලබාගෙන නැවත අදාල දායකයා වෙත ගෙවීමට කටයුතු කරනු ලබයි.

<u>177(1)</u>

එකතු කර ගන්නා ලද මුදල් එකතුකර ගත් විගසම බැංකු ගත කරන ලෙස උපදෙස් ලබාදී ඇති අතර, අදාල ධීවර දිස්ත්‍රික් කාර්යාල වෙත නැවත උපදෙස් ලබාදීමට කටයුතු කර ඇත.

3.2 <u>කළමනාකරණ ක්‍රියාකාරකම්</u>

ධීවර විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය ආරම්භයේදී රාජ්‍ය සහනාධාර සහිත යෝජනා ක්‍රමයක් ලෙස ක්‍රියාත්මක විය. පසුකාලීනව රාජ්‍ය ප්‍රතිපත්ති හා තීරණ අනුව වාරික වැඩිකිරීමකින් තොරව විශ්‍රාම වැටුප් කිහිප ගුණයකින් වැඩි කිරීම නිසා වාරික ආදායමට වඩා විශ්‍රාම වැටුප් වියදම වැඩිවී ඇත. මෙම යෝජනා ක්‍රමය මූල්‍ය වශයෙන් ශක්‍යතාවයක් නොමැති බැවින් මේ වන විට බඳවාගැනීම් ප්‍රවර්ධනය කිරීම සිදු නොකරනු ලබයි.